දායාද
අතීත අභිමන හෙටටත්
පුරාවිද්‍යා පුවත් අටුවාව
2019
ජූලි
දහතුන් වන කලාපය
පුරාවිද්‍යා
දෙපාර්තමේන්තුවේ
ප්‍රකාශනයකි
නිවාස, ඉදිකිරීම් සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# කන්නියා උණුවතුර ළිං පරිශ්‍රයේ පුරාවිද්‍යාත්මක ස්මාරක සංරක්ෂණයට කඩිනම් පියවර ගැනේ



ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්නියා පිහිටි ස්වාභාවික සහ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් උණුවතුර ළිං පරිශ්‍රයේ පිහිටි ක්‍රි.ව. -3 සියවස්වලට අයත් ඉපැරණි දාගැබ සහ පිළිමගෙය ඇතුළු තවත් ස්මාරක රැසක් සංරක්ෂණය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කඩිනම් පියවර ගෙන තිබේ.

මේ පිළිබඳ විස්තර සටහන 02 වන පිටුවට... »

## "සසුනට අරුණ වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි." වැඩසටහන



දිස්ත්‍රික්ක මට්ටමින් චෛත්‍යයක් නොමැති විහාරස්ථාන තෝරා ගනිමින් රජයේ මුදල් ආධාර කිසිවක් ඒ සඳහා ලබා නොගෙන සම්පූර්ණයෙන්ම දානපතීන්ගේ ආධාර උපකාර මත චෛත්‍යය රාජයාණන් වහන්සේලා ඉදිකර ඒවා එම විහාරස්ථාන වෙත පූජා කිරීමේ වැඩසටහන නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාවට නැගේ.

එහි පළමු පියවර ලෙස අනුරාධපුර නාච්චදූව ශ්‍රාවස්තිපුර ශ්‍රී ස්වර්ණ ජයන්ති විහාරස්ථානයේ අභිනව චෛත්‍යය රාජයාණන් වහන්සේ සසුනට පූජාකිරීමේ උත්සවය පසුගියදා විෂයභාර අමාත්‍යතුමා අතින් සිදු කෙරුණි.

## ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාඥයෙකුට සිඩ්නි සරසවියෙන් උපහාර

ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාඥයෙකු වන ආචාර්ය නිමල් පෙරේරා මහතා වෙත ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලය මඟින් ගෞරව සම්මානිත ආචාර්ය තනතුරක් පිරිනමා ඇත.

මේ පිළිබඳ විස්තර සටහන 05 වන පිටුවට... »

## කැලණිය විහාරයේ සිතුවම් ඡායාරූප වාර්තාකරණයට අදාළව ග්‍රන්ථ නිකුත් කෙරේ



මේ පිළිබඳ විස්තර සටහන 31 වන පිටුවට... »

## ඇතුළත පිටු »

03 පිටුව - තරුලෙන්ගල හෙවත් හඹුතගල

04 පිටුව - සයුරේ සැඟවුණු නෞකා

20 පිටුව - ප්‍රාග් මානව ශිෂ්ටාචාරයේ සැබෑ පිළිබිඹුව

34 පිටුව - උරුම රකින මිනිස්සු

37 පිටුව - උරුම කළමනාකරණය


## කන්නියා උණුවතුර ළිං පරිශ්‍රයේ පුරාවිද්‍යාත්මක ස්මාරක සංරක්ෂණයට කඩිනම් පියවර ගැනේ ...



ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්නියා පිහිටි ස්වාභාවික සහ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් උණුවතුර ළිං සහ එම භූමිය දිස්ත්‍රික්කයේ ඓතිහාසික මෙන්ම සංස්කෘතික වටිනාකම වැඩි කරන මෙන්ම දෙස් විදෙස් සංචාරක ආකර්ෂණයට ලක්වන පුරාවිද්‍යා බිම් කඩකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් මෙම භූමියේ සිදුකරන ලද පුරාවිද්‍යා කැණීම් මගින් ක්‍රි.ව. 2-3 සියවස් වලට අයත් යැයි සැලකිය හැකි දාගැබ සහ පිළිම ගෙය පාදා ගන්නා ලදී.

මෙම ස්ථානයෙන් හමු වූ ක්‍රිස්තු වර්ෂයෙන් 2-3 සියවස්වලට අයත් අපර බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියැවුණ ".......මහරජ කුජවිය.........මරුදවිය හ බොපියපති.........බොපියපති හ ච පල.........මෙ එතක තනහි.......සගහය......දිනි" යන සෙල්ලිපියට අනුව යම් මහරජෙකු විසින් කුරුවිය, මරුදවිය, පලවැව ආදී යාබදව පිහිටි වැව් කිහිපයකින් ලද දිය බද්ද මෙම බෞද්ධ විහාරයට පුජා කළ බව කියැවේ. කැණීම් වලින් මතු කරගෙන ඇති අවශේෂ පුරාවස්තූන් වන සිරිපතුල්ගල්, ආසන,යූපගල්, ප්‍රතිමා කොටස් සහ මැටි බඳුන් සහ මෙවලම්වලට අනුව ද පැරණි බුදු සමයට සාක්ෂි තවදුරටත් තහවුරු වේ. කෙසේ හෝ මෙම කැණීම් මගින් මතු කොට ගෙන ඇති ස්මාරක සංරක්ෂණය කඩිනමින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර තදාශ්‍රිත භූමියේ ඇති පොකුණු සහ අවශේෂ ගොඩනැගිලි කැණීම් කිරීමෙන් පසු ඒවා ද දෙවන අදියර යටතේ සංරක්ෂණය කොට ජනතාව වෙත සිය උරුමය දැක බලා ගැනීමට අවස්ථාව උදාකර දෙනු ඇත.

පුරාවිද්‍යා සංරක්‍ෂණ කටයුතු ඇරඹි මොහොතේ අන්‍යාගමික බැතිමතුන් පිරිසකගේ අනවබෝධය හේතුවෙන් යම් ගැටළුකාරී තත්ත්වයක් ඉස්මතු වුවද ත්‍රිකුණාමලය දිසාපතිතුමන් සහ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමන් කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව එය සමථයකට පත් කෙරිණි.

**ආචාර්ය ප්‍රියන්ත ජයසිංහ**
ගවේෂණ නිලධාරී, ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, ත්‍රිකුණාමලය.

## අධිවේගී මාර්ග ව්‍යාපෘතියක කැණීම් කටයුතු අතරේ ස්තූප ගොඩැලි 02ක් අනාවරණ වෙයි.



කොළඹ නුවර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් මේ වනවිට ආරම්භ කර තිබේ. එම ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර සිදුකරන ලද පුරාවිද්‍යා හානි ඇගයුම් ව්‍යාපෘතිය මඟින්, සබරගමුව පළාතේ කෑගල්ල රඹුක්කන මිනියම්පිටිය ප්‍රදේශයෙන් පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගොඩැලි 02 ක් පිළිබඳව කරුණු වාර්තාවී තිබිණ. ඒ පිළිබඳව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා කෑගල්ල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට දැනුම්දීමෙන් පසුව කැණීමක් සිදුකළ යුතු බවට සහකාර අධ්‍යක්ෂ (කෑගල්ල) එච්. බී. ඒ. කේ. නිල්මල්ගොඩ මහතා විසින් ගත් තීරණයත් සමඟ 2019 අප්‍රේල් 25 දින කැණීම් නිලධාරි ඩබ්ලිව්. ඒ. කේ. එන්. සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු කැණීම් කණ්ඩායමක් විසින් කැණීම් කටයුතු ආරම්භ කරන ලදි.

වැඩි තොරතුරු ප්‍රමාණයක් ග්‍රහණය කරගැනීමේ අරමුණින් ගොඩැලි කැණීම් ක්‍රමවේදය, විවෘත කොටුදැල් ක්‍රමය හා පර්යේෂණ අගල් ක්‍රමය යන මිශ්‍ර ක්‍රම භාවිතයෙන් පාදා ගැනීම් සිදුව ඇත. මෙහි ඉදිකිරීම් ලක්ෂණ දෙස බැලීමේදී මුල් කාලීන ප්‍රාථමික ඉදිකිරීම් රටාවක් පෙන්නුම් කරයි. ඒ අනුව ගොඩැලි අංක 01 සඳහා ගල් හා මැටි භාවිතයට ගෙන තිබේ. පාදම් සහිත කොටසකින් හා ඉදිකිරීම් සහිත කොටසකින් යුතුව කොටස් දෙකකින් ඉදිකළ බවක් පැහැදිලිය. සක්ක ගල් බැම්මක් ලෙසින් පළමු පාදම් කොටස ඉදිකර කවාකාර ඇතුළත පාදම් කොටසට බොරලු හා ඉන්පසුව මැටි හෝ පස්පුරවා තදකළ බවක් පැහැදිලි වේ. කවාකාර පාදම් දෙකක් මත ඉදිකරන ලද බද කොටසේ සුළු ප්‍රමාණයක් මේ වනවිට ශේෂව ඇති අතර එහි ගල්වරි 05 ක් පමණ දක්නට ලැබේ. ආසන්නතම දැලිවල කොට වෙහෙරේ පරිවාර ස්තූපයක් විය හැකිය. ක්‍රිස්තු පූර්ව 2ත් 3ත් අතර කාලයේ ඉදිකරන ලද දැලිවල කොටවෙහෙරේ ඉදිකිරීම් ද තරමක් ප්‍රාථමික ඉදිකිරීම් ශෛලියක් තිබූ බවට පුරාවිද්‍යා කැණීම් මඟින් තහවුරු කරගෙන තිබේ. එහි මුල් ඉදිකිරීම් ද ස්වභාවික ගල්කුට්ටි, සක්ක ගල් හා මැටි භාවිතයෙන් සිදුකර තිබේ.

දෙවන ස්තූප ගොඩැල්ල පළමු ස්තූපයට වඩා පසුකාලීනව ඉදිකරන ලද්දක් බව භාවිත ඉදිකිරීම් ද්‍රව්‍යන් හා ආකෘතික හැඩතලයන්ගෙන් පැහැදිලිය. යම් විටක මුල්කාලීන පළමු ප්‍රාථමික ඉදිකිරීම් සහිත ස්තූපය ගරාවැටීමත් සමඟ එම ස්ථානයට ආසන්නයෙන් වඩාත් දියුණු තාක්ෂණික ක්‍රම වේදයන් හැඩතල හා ද්‍රව්‍ය භාවිතයට ගනිමින් මෙම දෙවන ගොඩනැගීම සිදුකරන්නට ඇති බවක් පැහැදිලිය. මෙම ස්තූප ගොඩැල්ලේ ඉදිකිරීම් අවධි කීපයක් පවතින බව අනුමාන කළ හැකිය. අංක 02 ස්තූපය සඳහා ගල්, මැටි හා ගඩොල් යොදා ඇත. භාවිතයට ගන්නා ලද බොහෝ කලුගල් සඳහා කවාකාර හැඩතල කපා තිබේ. ඒ සියල්ලක්ම ස්තූපයේ බොරදම් හෝ පේසාවන් සඳහා භාවිතයට ගෙන තිබේ. දෙවන ස්තූපයේ ඉහළ බඳ කොටස ගඩොල් කැබලි හා ගල් යොදා ගනිමින් ඉදිකර තිබේ.

**එච්. එම්. එස්. කේ. ඇරැගම,**
පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී, ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, සීතාවක, අවිස්සාවේල්ල.

හඳුන්වා දෙන උරුමය

# තරුලෙන්ගල හෙවත් හබුතගල

හඳුන්වාදෙන උරුමය
තීරුව යටතේ මෙවර අපි
නැගෙනහිර පළාතේ
හුලංනුගේ බක්මිටියාව ග්‍රාමයේ
පිහිටි තරුලෙන්ගල පිළිබඳව
තොරතුරු ඉදිරිපත් කරමු.



කොළඹ සිට පොතුවිල් බලා දිවෙන බස් රථයකින් ගොස් හුලංනුගේ හන්දියෙන් බැස ගතිමි. මාගේ අභිප්‍රාය ඉක්මණින් තරුලෙන්ගල රජමහා විහාරයට ළඟාවීමයි. මෙතැන් සිට මාර්ගය පිළිබඳව මම වැඩිහිටියෙකුගෙන් විමසුවෙමි. "බක්මිටියාව මීරගල පාරේ කි. මී. 2ක් විතර ගියාම පන්සල හම්බ වෙනවා. හැබැයි මේ පාරේ බස් නම් දුවන්නේ නෑ. පයින් තමයි යන්න වෙන්නේ." කි. මී. 300 කට වැඩි දුරක් ගෙවා පැමිණි ගමන වෙහෙසකරය. මම ත්‍රීවීල් රථයක් බලාපොරොත්තුවෙන් සිටියෙමි. එහෙත් එය කල්මැරීමක් වූ හෙයින් පයින් ගමන ඇරඹුවෙමි.

කිසිදු කලබලයකින් තොරව විහාර භූමියේ තරුණයින් දෙතුන් දෙනෙකු බෞද්ධ කොඩි එල්ලමින් සිටී. තවත් කිහිප දෙනෙකු වල් වැදුණු යටි කැලය කපමින් සිටී. අභිනවයෙන් ඉදිකර ඇති ධර්මශාලාව සහිත ආවාස ගෙය පාළුවට ගොසිනි. මගේ ආගිය තොරතුරු විමසීමෙන් අනතුරුව ඔවුන් මෙලෙස පැවසූහ. "දැන් මේ කන්ද නගින්න වෙලාවක් නෑ. ඒ ගමනට පැය 4ක් 5ක් ගතවෙනවා. තව පොඩ්ඩකින් අලි එනවා. අර ඊයේ අලි ඇවිල්ලා කරලා තියෙන දේ" ආවාස ගෙය පිටුපසට වන්නට ඇති කෙසෙල් ගස් හා තවත් භෝග වගාවන් පොඩි පට්ටම් කර ඇති අයුරු පෙනේ.

පසුදින උදෑසනින් ගමන ආරම්භ වන්නේ මද නැග්මකින් පසු හමුවන විශාලතම මැටි බුදු පිළිම වහන්සේ ළඟිනි. සැතපෙන බුදුපිළිම වහන්සේ දිගින් අඩි 42ක් පමණය. පිරිනිවන් මංචකය නිරූපණය කරන පිළිම අතරින් (විශේෂයෙන් මැටි පිළිම) දැනට ඉතිරිව ඇති සුවිශේෂී බුදු පිළිමයකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑතකදී මෙම පිළිමයේ සංරක්ෂණ කටයුතු සිදුකර ඇත.


බුදුපිළිම වහන්සේ අසළින් දකුණට වැටී ඇති අඩිපාර දිගේ මද දුරක් යත්ම ඉද්ද ගැසුවාක් බඳු පඩිපේළියකි. විශාල යකඩ කම්බියක ආධාරයෙන් ගල්පරයේ පිහිටි අඩි 70-80ක් ඉහළට නැග ගත් පසු මෑතක දී ඉදිකළ කුඩා චෛත්‍යයකි. එතැන් සිට හාත්පස නරඹන අප ඉදිරියේ දිස්වනුයේ මනස්කාන්ත දර්ශනයකි. නෙළුම් මලින් සුසැදි නිල් දිය දහරින් යුත් සුවිශාල වැවත්, ඇසට නොපෙනෙන මානයේ තෙක් විහිදෙන කුඹුරු යායද පසෙකින් වන ගහණයද චමත්කාර ජනකය.

කුඩා දාගැබ පසුකරමින් වන සංරක්ෂිතයේ ඉහළට ඇදීයාමට ඇත්තේ ඉතා කටුක මාර්ගයකි. ඉලුක් සහ මානා පඳුරු අතරින් ගිනියම් අව්කාෂ්ඨයේ කිලෝමීටරයක් පමණ කඳු ගැටයේ ඉහළට යත්ම කුඩා ගල් ලෙන් තුනක් හමුවෙයි. එතැන් සිට තවත් කිලෝමීටර් භාගයක් පමණ ඉහළට යනවිට තරමක් විශාල ගල්ලෙන් දෙකක් හමුවෙයි. මෙම ගල්ලෙන් පසුකර තව මඳ දුරක් ගමන් කරන විට සුවිශාලතම ලෙන් සංකීර්ණය මුණ ගැසේ. අඩි 500කට වඩා දිගින් යුත් මෙම ලෙන් සංකීර්ණයේ ඉහළින් එක දිගටම කටාරම කොටා තිබීම විශේෂත්වයකි. මෙම සුවිශාල ලෙන පසුකර යළි ඉදිරියට ගමන් කරනවිට තවත් ඊට කුඩා ලෙන් කිහිපයක් මුණ ගැසෙයි. ඒ අනුව මෙය ලෙන් සංකීර්ණයක් ලෙස හැඳින්වීම උචිතය.

සුවිශාල ලෙන තුළ මුල සිට අග දක්වා ඇවිද යනවිට දැකිය හැකි විශේෂතා කිහිපයකි. ඉන් පළමු වැන්න ලෙනේ ගෙබිම ක්‍රමානුකූලව තට්ටුවෙන් තට්ටුවට ඉහළට සකසා ඇති ආකාරයයි. අඩි සියයක් පමණ යනවිට අඩි 03ක් පමණ උසකින් ඊළඟ තට්ටුවත් තවත් අඩි 50ක් පමණ යනවිට තවත් අඩි 02 - 03 ක් උසින් ඊළඟ තට්ටුවක් ලෙස නිමවා තිබීමයි. දෙවන විශේෂතාව නම් සෑම තට්ටුවකම පාහේ ආසන කුටි වෙන්කර තිබීමයි. කුටි වෙන්කර තිබූ කුඩා බිත්ති කොටස් තැන් තැන්වල ගරා වැටී ඇති අයුරු පෙනේ.

සුවිශාල ලෙන් පසුකරනවාත් සමඟම හමුවන ලෙනේ කටාරමට පහතින් කෙටූ සලකුණක් දක්නට හැකිය. ඒ පිළිබඳව විවිධ මත පවතී. ඉන් එකක් වන්නේ එය කාවන්තිස්ස රජුගේ අත්සන විදිහට සැලකෙන බවයි.

අපි මෙම ස්ථානය තරුලෙන්ගල නමින් හැඳින්වුවත් පුරාවිද්‍යාත්මක සාධක අනුව මෙය හබුතගල විහාරය වෙයි. මෙයම කරඳහෙල නමින් ද ප්‍රකටය. පුවරු ලිපි, ලෙන් ලිපි, කටාරම් කෙටූ ලෙන්, ඉපැරණි පියගැට පෙළ, ගරා වැටී ඇති ඉපැරණි දාගැබ් මගින් මෙහි පුරාවිද්‍යාත්මක අගය ඉහළින් සිටී. ස්වභාව ධර්මයේ අපූරුව නිමැවුමක් වන තරුලෙන්ගල සුවිශේෂී පුරාවිද්‍යා බිම්කඩකි.



(ක්ෂේත්‍ර චාරිකාවේ දී සහාය දැක්වූ මඟුල් මහ විහාරයේ රාජකාරී ඉටු කරනු ලබන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සරත් විජේසිංහ මහතාට, තරුලෙන්ගල පුරාවිද්‍යා භූමියේ රාජකාරී කරනු ලබන මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රදීප් චන්දන, මලික් පමෝධ්‍ය මහත්වරුන්ට මාගේ කෘතඥතාව පිරිනැමේ.)

සටහන සහ ඡායාරූප
**සුනිල් බණ්ඩාර කෝරළගේ**

# රට වට සයුරේ සැඟවුණු නෞකා



ඉන්දියන් සාගරයේ මුතු ඇටය යන විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව, චීනය සහ යුරෝපය යා කළ අතීත සේද මාර්ගයෙහි ප්‍රධාන වෙළඳ නාවුක මධ්‍යස්ථානයක් ව පැවතියේ ය. මෙම නාවුක පිහිටීම හේතු කර ගෙන ම ශ්‍රී ලංකාව ආසන්න වෙරළ තීරයෙහි නෞකා සුන්බුන් බහුල වශයෙන් පැතිර පවතී. ගෝලීය වශයෙන් අතලොස්සක් පමණ රටවල් ප්‍රමාණයක් සතු මෙම සාමුද්‍රික උරුමය අතර ශ්‍රී ලංකාව සුවිශේෂී තැනක් ගනී.

1940 පුරාවස්තු ආඥාපනත යටතේ, දේශීය නෛතික භූමි සීමාවට යටත් සාගර ප්‍රදේශය තුළ පැතිර පවත්නා වසර 100කට වඩා පැරණි ඕනෑම ගිලුණු යාත්‍රාවක් හෝ එහි සුන්බුන් කොටසක් සාමුද්‍රික උරුමය යටතේ ලා සැලකේ. ඒ අනුව ශ්‍රී ලංකාව අවට සාගර ප්‍රදේශය තුළ ගිලුණු නෞකා ප්‍රමාණය සළකා බැලීමේ දී, 2013 වර්ෂයේ දී පවත්වන ලද සාමුද්‍රික ආරක්ෂණ සමුළුව (Marine Conservation Conference) හි දී ඉදිරිපත් කරන ලද සුවිගත කිරීම්වලට අනුව මෙසේ ගිලී ගිය නෞකා 120 ක් ඉක්මවා විස්තරාත්මක දත්ත ඉදිරිපත් වී ඇතත්, මේ වන විට හඳුනාගැනීම් සිදු කළ සහ නොකළ එබඳු ක්ෂේත්‍ර 200කට අධික ප්‍රමාණයක් රට වට සයුරේ සැඟවී පවතී. ඉන් 41ක් පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත සාමුද්‍රික ක්ෂේත්‍රයන් වශයෙන් හඳුනා ගෙන ඇත.

කොළඹ සිට පානදුර දක්වා සමුද්‍ර තීරයේ යාත්‍රා 30ක් පමණ විසිරී පවතී. ශ්‍රී ලංකාව තුළ ගිලුණු නෞකා වැඩිම ප්‍රමාණයක් හඳුනාගත්, එමෙන්ම කිමිදුම් කටයුතු බහුල වශයෙන් සිදු කෙරෙන, ප්‍රදේශයක් ලෙස මෙම මුහුදු තීරය හඳුන්වා දිය හැකි ය. මෙම ගිලීගිය නෞකා බොහෝමයක් 1 වන සහ 2 වන ලෝක යුද්ධ සමයන්හි, මහා වස්තු සම්භාරයන් සහ කාසි සමඟ ගිලී ගිය නෞකාවන් ය. ගාල්ල, ත්‍රිකුණාමලය සහ මන්නාරම ආශ්‍රිත වෙරළ තීරයේ බොහෝ දුරට සෙසු යාත්‍රාවන් ගිලී ගොස් ඇත. නැගෙනහිර වෙරළ තීරයේ ත්‍රිකුණාමලය, මඩකලපුව, වාකරෙ සහ කල්මුනේ ආසන්න මුහුදු පත්ල හි 2 වන ලෝක යුධ සමයේ දී මුහුදුබත් වූ නෞකා දැක ගත හැකි ය.

## බටහිර මුහුදු පත්ල තුළ සැඟව ගිය නෞකා

- SS Perseus, කොළඹ, මීටර් 30 - 40 පමණ ගැඹුරින් ගිලී ඇති වාෂ්ප නැවකි.
- Taprobane East Wreck, කොළඹ, මීටර් 32 ගැඹුරු මුහුදේ ගිලී ඇත.
- Wallet Wreck, කොළඹ, මීටර් 30 - 40 පමණ ගැඹුරින් ගිලී ඇති නැවකි.
- MV Chief Dragon, කොළඹ, මීටර් 20 - 32 ගැඹුරු මුහුදේ ගිලී ඇති එන්ජින් සහිත නැවකි.
- Toilet Barge, කොළඹ, මීටර් 32 ගැඹුරු මුහුදේ ගිලී ඇත.
- Lotus Barge, කොළඹ, මීටර් 28 ගැඹුරු මුහුදේ ගිලී ඇත.
- MV Pecheur Breton, දෙහිවල, මීටර් 18 - 33 ගැඹුරු මුහුදේ ගිලී ඇති මෝටර් එන්ජින් සහිත නැවකි.
- MV Medhufaru, ගල්කිස්ස, මීටර් 14-30 ගැඹුරු මුහුදේ ගිලී ඇති මෝටර් එන්ජින් සහිත නැවකි.
- Battery Barge, ගල්කිස්ස, මීටර් 40 - 45 ගැඹුරේ ගිලී ඇත.
- MV Thermophylae Sierra, මොරටුව, මෝටර් එන්ජින් සහිත නැවකි. ගැඹුර මීටර 24ට වැඩි.
- Moratuwa Gunboat, මොරටුව, ගැඹුර මීටර 14 ක් වේ. යුධ ප්‍රහාරක යාත්‍රාවකි.
- SS Worcestershire, මොරටුව, මීටර් 50 - 57 පමණ ගැඹුරින් ගිලී ඇති වාෂ්ප නැවකි.

## නැගෙනහිර මුහුදු පත්ල තුළ සැඟව ගිය නෞකා

- MFA Athelstane, කල්මුණෙ, ගැඹුර මීටර 35-42 ක් අතර වේ.
- HMS Hollyhock, කල්මුණෙ මීටර 42 ක් ගැඹුරු මුහුදු පත්ලේ ගිළුණු බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවට අයත් ව තිබූ යාත්‍රාවකි.
- SS Brenmus, මඩකලපුව, මීටර් 9 ගැඹුරේ ගිලී ඇති වාෂ්ප නැවකි.
- HMS Hermes, මඩකලපුව, බ්‍රිතාන්‍යය රාජකීය නාවික හමුදාවට අයත් ව තිබූ මෙම යාත්‍රාව ගුවන් යානා ප්‍රවාහනය සඳහාම නිපද වූ ප්‍රථම යුධ නෞකාව වශයෙන් සැළකේ. 1942 අප්‍රේල් මස 02 වන දින ත්‍රිකුණාමලය වරාය දක්වා යාත්‍රා කරමින් සිටිය දී ජපන් ගුවන් ප්‍රහාරයකින් මුහුදුබත් විය. ගැඹුර මීටර 40 - 53 ක් වේ.
- SS British Sergeant, මාන්කර්නි, මීටර් 13 - 27 ත් අතර ගැඹුරේ ගිලී ඇති වාෂ්ප නෞකාවකි.
- මීට අමතරව, කල්කුඩා වෙරළ තීරයේ මීටර 42 ක් ගැඹුරු මුහුදු පත්ලේ ගිලී ඇති RAF Catalina Y-78 රාජකීය ගුවන් හමුදාවට අයත් ගුවන් යානය ද ශ්‍රී ලංකාව අවට මුහුදු පත්ල තුළ ඇති සුවිශේෂී උරුමයකි.



දකුණු මුහුදු පත්ල සතු පුරාවිද්‍යාත්මක උරුමය

Awonstar - 1659 වසරේ දී ගාලු වරාය ආසන්නයේ (කළු කොටුව අසල) නැංගුරම්ලා තිබිය දී සුලිකුණාටු සහිත රාත්‍රියක දී, නැංගුරම ගැලවී යාමෙන් අසල ගල් පරයක වැදී කොටස් දෙකකට බිඳී මෙම නෞකාව මුහුදුබත් විය. මෙම නැව මුහුදුබත් වීම සම්බන්ධයෙන් නැවේ කපිතාන්වරයා සිරභාරයට ගනු ලැබීමෙන් අනතුරුව වන්දි අයකරගත් බවට වාර්තා ඇත. මේ වන විට මුලින් ගිලුණු ස්ථානයෙන් මඳක් මෑත්ව වෙරළට ඉතාමත් ආසන්නව තැන්පත් වී ඇති මෙම නෞකාව නෙදර්ලන්ත ආධාර යටතේ (University of Amsterdam, The Amsterdam Historical Museum and the Western Australian Maritime Museum)



ස්ථානීය සංරක්ෂණයට (Insite Preservation) ලක් කර ඇති අතර, මධ්‍යම සංස්කෘතික අරමුදල, ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයෙහි 4 වන ගැලරිය සම්පූර්ණ වශයෙන් මෙම නෞකාවෙන් ගොඩගත් පුරාවස්තු ප්‍රදර්ශනය සඳහා වෙන් කර ඇත.

SS Rangoon - 1871 වර්ෂයේ නොවැම්බර් 01 වන දින ගාල්ල වරාය ආසන්නයේ දී ගිලී ගිය මෙම වාෂ්ප නෞකාව මීටර් 27 - 32 ගැඹුරේ පිහිටා ඇත.

SS Conch, හික්කඩුවට නුදුරු අකුරළ මුහුදු තීරයේ ගිලී ඇති මෙම බ්‍රිතාන්‍යය වාෂ්ප නෞකාව ලොව ප්‍රථම බොරතෙල් ප්‍රවාහන නෞකාව වශයෙන් සැලකේ. 1903 වසරේ ජුනි මස 03 වන දින අකුරළ ස්වාභාවික ගල් පරයේ වැදී මුහුදු බත් විය. මෙම නෞකාව මීටර් 17 - 21 ත් අතර ගැඹුරු මුහුදු පත්ලේ තැන්පත් වී ඇත. නැවේ එන්ජිම කොටස්, බොයිලේරු සහ අවර පෙත්ත මුහුදු පත්ලෙහි විශාල ප්‍රදේශයක් පුරා විසිර පවතී.



ගොඩවාය නෞකාව, හම්බන්තොට, ගොඩවාය ඉපැරණි වරාය ආශ්‍රිත නාවුක සැතපුම් 5 ක පමණ ඈතින් මුහුදුබත් වී ඇති මෙම ලී නෞකාව වසර 2000කට වඩා පැරණි වන බව තහවුරු වී ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජර්මන් "කාවා" ව්‍යාපෘතිය (German K.A.W.A. Project) සහ මහාචාර්ය ඔස්මන්ඩ් බෝපෙආරච්චි, එක්ව මෙම ස්ථානයේ කැණීම්, ගවේෂණ කටයුතු සිදුකරන ලදී. දැනට කාලනිර්ණය කර ඇති පරිදි මෙම නෞකාව ඉන්දියන් සාගරයේ ගිලී ඇති පැරණිතම නෞකාව වශයෙන් පිළි ගැනේ.

**සදානි ඩයනා ද සිල්වා**
සංවර්ධන නිලධාරී
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, ගාල්ල
ඡායාරූප: මධ්‍යම සංස්කෘතික අරමුදල, මුහුදු පුරාවිද්‍යා ඒකකය.

# ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාඥයෙකුට සිඩ්නි සරසවියෙන් උපහාර



ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාඥයෙකු වන ආචාර්ය නිමල් පෙරේරා මහතා වෙත ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලය මඟින් ගෞරව සම්මානිත ආචාර්ය තනතුරක් පිරිනමා ඇත. ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාඥයෙකු වෙනුවෙන් ලැබුණු ඉහලම පිළිගැනීමක් ලෙසින් මෙය හඳුන්වාදිය හැකිය. දකුණු ආසියාවේ ප්‍රාග්ඉතිහාසය පිළිබඳව ඉදිරි පර්යේෂණ සිදුකිරීමට හා සිඩ්නි විශ්ව විද්‍යාලය මඟින් සිදුකරන ඉදිරි ප්‍රාග්ඓතිහාසික පර්යේෂණ සඳහා වැඩි දායකත්වයක් ලබා ගැනීමට මෙම පත්කිරීම සිදුකර ඇත.

1978 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් මූලික උපාධිය ලබාගත් නිමල් පෙරේරා මහතා, 1990 දී ඉන්දියාවේ ඩෙකෑන් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන තිබේ. ඉන් අනතුරුව 2007 දී "ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසයේ පර්යේෂණ නැවත විමර්ශනයක්" යන මැයෙන් ඕස්ට්‍රේලියාවේ කැන්බරා නුවර ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය (ANU) වෙත ලබා දුන් නිබන්ධනය මඟින් දර්ශනපති උපාධිය ලබා ගෙන තිබේ. එම නිබන්ධනය බ්‍රිතාන්‍ය ඔක්ස්ෆර්ඩ් නුවර පර්යේෂණ ආයතනයේ 2142 අංකය යටතේ ග්‍රන්ථයක් ලෙසින් ප්‍රකාශයට පත්කර තිබේ.

ජාත්‍යන්තර සයන්ස් සඟරාව මඟින් පළවූ ලිපියක් පාදක කරගනිමින් වර්ෂ 2015 දී ජාතික විද්‍යාඥ සභාවෙන් ආචාර්ය නිමල් පෙරේරා ඇතුළු කණ්ඩායමක් වෙත ජනාධිපති සම්මානයක් ද පිරිනමා ඇත. වර්ෂ 2009 සිට මේ දක්වා ජාත්‍යන්තර සඟරා වෙත ලිපි හා තොරතුරු ලබා දෙමින් මෙරට ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ නව මානයකට යොමුකර ඇති ආචාර්ය නිමල් පෙරේරා මහතා මේ දක්වාම ප්‍රාග්ඓතිහාසික පර්යේෂණ සඳහා සෘජු දායකත්වයක් සපයමින් සිටින විශිෂ්ට පුරාවිද්‍යාඥයෙකි.

# ඓතිහාසික නාගල පුදබිම

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නිකවැව ග්‍රාමනිලධාරී වසමේ නිකවැව ග්‍රාමයේ පිහිටි නිකවැව මහ විදුහලට බටහිරින් නාගල පුදබිම පිහිටා ඇත. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අගයකින් යුත් නාගල පුදබිම, නාගලකන්ද, නාගලවෙහෙර, නාගල පුරාණ රජමහ විහාරය ලෙස ද හඳුන්වනු ලබයි.

කුරුණෑගල - මොරගොල්ලාගම මාර්ගයේ මඩගල්ල නගරය පසුකර කි. මී. 06ක් පමණ ගමන් කළ විට නිකවැව පාසලට වමතින් දිස්වන්නේ නාගල පුදබිමයි. නිකවැව ග්‍රාමයේ ඇති මෙම කඳුවැටිය "නාගල" නමින් හැඳින්වීම පිළිබඳව ජනප්‍රවාද රැසකි. විශාල නාගයෙකු විසූ ගල යන අර්ථයෙන් මෙය පසුකාලීනව නාගල වූ බව ජනප්‍රවාදයේ එයි.

ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තතු සොයා බැලීමේ දී නාගල කඳුවැටියේ නැගෙනහිර



බෑවුමේ පහළ සිට කඳු මස්තකය දක්වා අක්කර 40ක පමණ භූමි ප්‍රදේශයක පුරා සාධක විසිරී ඇත. මහින්දාගමනයත් සමඟම මෙරට ඇති වූ ආගමික පුනර්ජීවනයේ ප්‍රතිඵලයක් වශයෙන් රට පුරා විසිරී ගිය භික්ෂූන් වහන්සේලා උදෙසා ලෙන්, කුටි, ආරාම ඉදිවන්නට විය. අනුරාධපුර යුගයේ මුල් සියවසේ සිට ඉදිවූ ආරාම සංකීර්ණවල තොරතුරුවලට අනුව ඊට සමාන ආරාම සංකීර්ණවල ශේෂ වූ පුරා සාධක නාගල පුදබිමේ දී දැකගත හැකිය. ක්‍රි. පූ. 03 වන සියවසේ සිට ක්‍රි. ව. 18 වන සියවස දක්වා කාලය තුළ නිර්මාණය කළ පුරා සාධක මෙහි දක්නට ලැබේ.

මෙම විහාර භූමිය මාලක 05 කින් යුක්ත වේ. පළමුවන මාලකය තුළ අලුතින් ඉදිකළ ආවාසගෙය හා දහම් පාසල් ගොඩනැගිල්ල වේ. මේ අවට භූමියෙහි පැරණි ගල්කණු කොටස් විසිරී ඇත.



දෙවන මාලකය සෙල්ලිපි ආවරණය සහිත ගෙයයි. ඒ මත සෙල්ලිපිය තබා ඇත. බ්‍රාහ්මීය අක්ෂර සහිත ලිපිය මෙතෙක් පරිවර්තනය කර නොමැත. 1990 දශකයේ අගභාගයේ දී සෙල්ලිපිය සඳහා ආවරණ ගෙය සකසා ඇත. මෙම පරිශ්‍රය තුළ පැරණි ගල්කණු, මල් ආසන, වැසිකිලි හා කැසිකිලි ගල්, සඳකඩ පහන, මුරගල් ආදිය දක්නට ලැබේ. මෙම භූමියෙහි ධර්මශාලාව, දාන ශාලාව, ආවාස ගෙය හා පුස්තකාල ගොඩනැගිල්ල සුවිශේෂී වේ. එහි පැරණි උළු කැබලි, වලං කැබලි පාත්‍රා කොටස්, ඇණ කැබලි, පැරණි පුස්කොළ පොත්, ප්‍රතිමා දක්නට ලැබේ. මෙම කෞතුක වස්තු සුරැකීමට විහාරයේ වැඩවසන නායක ස්වාමීන් වහන්සේ ඇතුලු ස්වාමීන් වහන්සේලා අප්‍රමාණ වෙහෙසක් ගනු පෙනේ.



පුදබිමේ තුන්වන මාලකයෙහි පැරණි ස්තූපය වෙයි. 1990 දශකයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එය සංරක්ෂණය කර ඇත. මෙහි මළුව සුදුවැලි අතුරා සකසා ඇති අතර ඒ වටා මල් ආසන තබා ඇත. පැරණි මල් ආසන, සිරිපතුල් ගල් හා මීටර් 1.2 උස කිරිගරුඬ පාෂාණයෙන් නිම වන ලද ප්‍රතිමාවක් එහි වෙයි. හිස හා අත් පා එහි දක්නට නොලැබෙයි.

සිව්වන මාලකයට පිවිසි කල ඒ පරිශ්‍රය පුරා විසිරී ඇති පැරණි ගල්කණු කොටස්, සඳකඩ පහන, මුරගල් දැකගත හැකිවේ. එය තරමක් කැලෑවෙන් වැසී ඇත.

පස්වන මාලකයට ගමන් කිරීම සඳහා වූ දිගු පියගැට පෙළකි. 1990 දශකයේ මුල් භාගයේ පටන් ගෙන අග භාගය දක්වාම මෙම පියගැට පෙළ සංරක්ෂණය කර ඇත. ද්‍රව්‍යය සපයා ගැනීම අති දුෂ්කර කාර්යයක් වී ඇත. ගලින් සැකසූ පඩි හත්සිය පනහක් වේ. එය තරණය කළ පසු මහනුවර යුගයේ ඉදිවූ ලෙන්, ප්‍රතිමා, ගෘහයන් දෙක දැකගත හැකිය. මෙසේ නිර්මිත විස්මිත ලෙන් ප්‍රතිමා ගෘහයන් දෙක ඈතට පෙනෙනුයේ බිත්තියේ ඇඳි චිත්‍ර මෙනි. අහස උසට විහිදී ගිය පර්වතයේ උසම ස්ථානයේ ලෙන් විහාර ඉදිකිරීම අපූර්වත්වයට හේතු වේ. මෙම ලෙන්හි වියන් චිත්‍ර දක්නට ලැබේ. එම ලෙන් දෙකෙහිම සුවිසල් සැතපෙන බුද්ධ ප්‍රතිමා 02කි.

මෙම ස්ථානය වෙත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමුව ඇත. එහෙත් මෙය හැකි ඉක්මණින් ආරක්ෂිත භූමියක් ලෙස ලියාපදිංචි කළ යුතුවේ. දිනපතා මෙය නැරඹීමට දෙස් - විදෙස් සංචාරකයෝ පැමිණෙති. පාසල් හා විශ්වවිද්‍යාල සිසුන් මෙහි ඓතිහාසික පුරාවිද්‍යාත්මක අගය සොයා විස්තර ලබාගැනීමට පැමිණෙති. අතීත උරුමයක අභිමන සුරැකි මෙවන් පුරාවිද්‍යා ස්ථාන රැක දැයට පිදීම හා එහි ආරක්ෂාව සැපයීම අප සතු වගකීමකි.

මනරම් කඳුවැටියක පිහිටි මෙම පුරාවිද්‍යාත්මක ස්ථානය නැරඹීමට දෙස් විදෙස් සංචාරකයින් පැමිණෙමින් සිටිති. පාරිසරික මෙන්ම පුරාවිද්‍යාත්මක අධ්‍යයන ක්ෂේත්‍රයන්හි නියැලෙන පිරිස් ද මෙහි පැමිණෙති.

**ඒ. එම්. ආර්. සමන් කුමාරි**
වැඩබිම් කළමනාකාරිනී.
නාගොල්ල පුරාණ විහාරස්ථානය

# සීතාවක ගංගා නිම්නයේ පුරාවිද්‍යාත්මක සාධක

### තිඹිරිපොල සිරිපතුල් ගල

අවිස්සාවේල්ල කෑගල්ල පාරේ අවිස්සාවේල්ල නගරයේ සිට කෑගල්ල දෙසට කිලෝමීටර් 07 ක් පමණ ගිය විට පිටදෙණිය නම් ග්‍රාමය හමුවේ. පිටදෙණියේ බෝගස අසලින් දකුණු දෙසට ඇති මාර්ගය ඔස්සේ තිඹිරිපොල ග්‍රාමයට ළඟාවන මාර්ගය වැටී ඇත. එම මාර්ගය ඔස්සේ කිලෝමීටරයක් පමණ ආවිට වත්මන් සංගිලි පාලම (වැල්පාලම) හමු වේ. එම පාලම අසලින් ගං ඉවුර දිගේ වම් අත පැත්තට මීටර් 300-400 ක් පමණ ගියවිට ගං ඉවුරේ පිහිටි ගල් තලාවක කොටන ලද සිරිපතුල් ලාංඡනයකි.





මෙම ලාංඡනය පිහිටි ගල රම්පතගල නමින් ප්‍රදේශ වාසීහු හඳුන්වති. ඒ මත කොටා ඇති සිරිපතුලෙහි දිග අඩි 4 කි. පළල අඩි 1 1/2 කි. පාදයේ ඇඟිලි දිගින් අඟල් 10 ක් පමණ වෙයි. අඟල් 08,10,12 ආදී ලෙසින් විෂ්කම්භයෙන්යුත් වෘත්තාකාර නෙළුම් මල් හයකින් මෙම ශ්‍රී පාදය අලංකාරවත් කර ඇත. මලකට ප්‍රධාන පෙති 08 ක් සහ එම ප්‍රධාන පෙති මත කුඩා පෙති නිර්මාණය කර තිබේ. කැටයම් කලාවේ නිපුණත්වය විදහාපාන අගනා නිර්මාණයක් ලෙස ගිණිය හැකි මෙහි බුදු සිරිපතුලක තිබිය යුතු සම්මත මංගල ලක්ෂණ නෙළා නැත. පර්වතය මත පහන් කණුවක් තිබුණු බවට සලකුණු තිබේ.





### දංකොඹුව ඉරහඳපාන ගල

අවිස්සාවේල්ල - කෑගල්ල පාරේ දෙහිඕවිටින් හැරී යන ඇහැළියගොඩ පාරේ කිලෝමීටර් 07 ක් පමණ ගියපසු බටංගල හමුවෙයි. බටංගල හංදියෙන් හිඟුරල කන්ද පාර දිගේ කිලෝමීටර් 03 ක් පමණ ගිය විට දංකොඹුව ග්‍රාමය හමුවෙයි. දංකොඹුව කඩමණ්ඩියේ සිට වම් පැත්තට පහළට බසින විට සීතාවක ගඟ හමුවෙයි. ඉරහඳ පාන ගල පිහිටියේ මෙම සීතාවක නදියේ වක්කලමක් ආශ්‍රිතව ඇති ගං ඉවුරේ වූ ගලක ය. අඩි එකහමාරක් දෙකක් පමණ ප්‍රමාණයක් ඇතිව මෙම ලාංඡන දෙක කොටා ඇත.

### සීතාවක කණාමැදිරියන් වළ

කණාමැදිරියන් වළ පිහිටි ස්ථානයට ළඟාවීම සඳහා අවිස්සාවේල්ල පනාවල මාර්ගයේ මීටර් 600 ක් පමණ පනාවල දෙසට පැමිණිය යුතුය. එහි දී බණ්ඩාරවත්ත නම් ප්‍රදේශයෙන් ගලාගෙනවිත් සීතාවක ගඟට එක් වන රිටිගහඇළේ වක්කලමත්, සීතාවක ගඟේ එක් වීමත් අතර ගංගා පතුලේ පිහිටි විශාල ගල් තලාව මත වූ ගල් වළකි. මෙම ස්ථානයේ සිට ගඟේ වම් පසින් ඓතිහාසික



බැරුණ්ඩි කෝවිල ය. දකුණු පසින් සීතාවක මාලිගා භූමිය පිහිටා ඇත.

ගල් වළ පියවි ඇසෙන් දැකිය හැකි වන්නේ ගඟේ වතුර බෙහෙවින් සිඳී යන ඉඩෝර කාලයටයි. ඒ අනුව ගල් වළෙහි දිග පළල අසමාන වන අතර ගැඹුර ද වෙනස් වේ. මෙහිදී ගමපැත්ත ගල්තලාවේ දකුණු දිසාවයි. එය රිටිගහ ඇල වක්කලම පිහිටි සීමාවයි. එම කොටස දිගින් අඩි 52 ක් පමණ වන අතර කැපුම් විවරයේ සිට ගැඹුරට රූටා යන ආකාරයට බෑවුම්ව මෙම කොටස පිහිටියේ ය.

කරුණු කෙසේ වුවද මෙම ස්ථානය හා බැඳී පවතින ජනප්‍රවාදය ඉතා ශෝචනීය වේ. එනම් සීතාවක රාජසිංහ රජු සිය පියා වූ මායාදුන්නේ රජු ඝාතනය කළ බවත් එයට එකල සිටි භික්ෂූන් වහන්සේලා අප්‍රසාදය පල කළ බවත්ළ රජු අරිට්ඨ කී වෙණ්ඩු පෙරුමාල්ගේ වසඟයට පත්වීම පිළිබඳව ද භික්ෂූන් වහන්සේලා විරෝධය පෑ බවත්ල එයට බෙහෙවින් උරණ වූ රජු රාජ්‍ය විරෝධී භික්ෂූන් වහන්සේලා 120 නමක් (හැටඇඳුත්තක්) මෙම වළෙහි ගිල්වා මරණයට පත්කළ බවත් පවතින ජනප්‍රවාදයයි.

සීතාවකට නුදුරුව ඇති මානියංගම රජමහා විහාරයේ වැඩ සිටි භික්ෂූන් වහන්සේලා වහාම සංඝ විරෝධී කටයුතු නවතන මෙන් රජුට දැන්වූ විට එම අණට රජු කීකරු වූ බව ද ඉතිහාසයේ සඳහන් ය.

**එස්.ඒ. අමිතා විතාන**
සීතාවක කලාප භාරනිලධාරී
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
සීතාවක - අවිස්සාවේල්ල

# ඓතිහාසික බිබිල මැදගම පොතුබන්ධන රජමහ විහාරය

දුරාතීතයේ සිට ම ජාතික වීරවරයන්ගේ නිජබිමක් වශයෙන් විරාජමානව පැවති ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙහි පවතින පුණ්‍ය ක්ෂේත්‍රයක් වශයෙන් බිබිල, මැදගම පොතුබන්ධන රජමහ විහාරය හඳුන්වා දිය හැකි ය. එය මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පොතුබන්ධන ග්‍රාමයෙහි පිහිටා ඇත.



ඓතිහාසික ලේඛනයන්ට අනුව ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ ඉතිහාසය ප්‍රධාන වශයෙන් යුග දෙකකට බෙදා දැක්විය හැකි ය.

01. රෝහණ රාජධානිය පැවති සමය
02. බ්‍රිතාන්‍ය යුගය යනුවෙනි.

අනුරාධපුර යුගයෙහි මුල් භාගය වන විට මෙම ප්‍රදේශය අයත්ව පැවතියේ රෝහණ රාජධානියටයි. සද්ධාතිස්ස කුමරු විසින් වෙල් ලක්ෂයක් කළ බැවින් "වෙල්ලස්ස" නමින් හැඳින් වූ බව ද ජනප්‍රවාදගතව පවතී.

ඌව වෙල්ලස්ස ප්‍රදේශයට අයත්ව පැවති පොතුබන්ධන රජමහා විහාරය ක්‍රි. පූ. දෙවන සියවසේ දී කාවන්තිස්ස රජතුමා විසින් කරවන ලද්දකි. එකල රුහුණු - මාගම් රාජධානියට අයත් ප්‍රමුඛතම විහාරස්ථානයන්ගෙන් එකක්ව පැවති මෙම විහාරස්ථානය මගින් වෙල්ලස්සේ සිට ලාහුගල මඟුල්මහා විහාරය තෙක් වූ සියලුම විහාරාරාම පාලනය කරන ලද බව සඳහන් වේ. එපමණක් නොව කාවන්තිස්ස රාජ්‍ය සමයේ දී පන්සියයක් මහරහතන් වහන්සේලා මෙහි වැඩමකොට ත්‍රිපිටකය මැටි පුවරුවල ග්‍රන්ථාරූඪ කළ බව සඳහන් වේ. එබැවින් පුස්තක බැඳි ස්ථානය යන අරුතින් පොතුබන්ධන යන නාමය ලැබී ඇත. මෙසේ ග්‍රන්ථාරූඪ කළ දහස් ගණනක් වූ මැටි පුවරු විහාරස්ථාන භූමියේ දාගැබක් කරවා එහි නිධන් කළ බව දැක්වේ. මෙහි ඇති තවත් විශේෂත්වයක් නම් වළගම්බා රාජ සමයේ දී මාතලේ අලු විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර රුහුණු රාජධානියෙහි පොතුබන්ධන රජමහ විහාරය කේන්ද්‍ර කරගෙන තුන් පිටකය මැටි පුවරුවල ග්‍රන්ථාරූඪ කිරීමයි.



මීට අමතරව අනුරාධපුර යුගයෙහි මුල් භාගයෙහි දී මෙම ස්ථානයෙහි පැවති ශ්‍රී විභූතිය පෙන්නුම් කරන ගොඩනැගිලි නටබුන් රැසක් ද විහාර භූමිය තුළ විසිරී පවතී.

ක්‍රි.ව. 1818 දී ඉංග්‍රීසීන්ට විරුද්ධව සිදුකරනු ලැබූ ඌව වෙල්ලස්ස විමුක්ති අරගලය ආරම්භ වූයේ බිබිල ප්‍රදේශය මුල්කර ගනිමිනි. ඒ සඳහා මූලිකත්වය ගනු ලැබුවේ බිබිල, මැදගම පොතුබන්ධන රජමහා විහාරයයි. මේ හැර තිඹිරිය රජමහා විහාරය, කොටසර පියන්ගල, උණගොල්ල යන රජමහා විහාරස්ථානවල වැඩවිසූ නායක හිමිවරුන් විසින් ද මෙම විමුක්ති අරගලය මෙහෙයවනු ලැබූ බව කියැවේ. උන්වහන්සේලාගේ අනුශාසනා ලබමින් කොහුකුඹුරේ රටේ රාළ, බූටෑවේ රටේ රාළ, කුඩාබදුලුගම්මන රටේ රාළ, මහබදුල්ලගම්මන රටේ රාළ වැනි වෙල්ලස්ස ප්‍රධානීහු කැප්පෙටිපොළ දිසාව සමඟ එකතුව සටන මෙහෙයවා ඇත. එකල පූජ්‍ය නාපේ රේවත හිමියෝ පොතුබන්ධන රජමහා විහාරයෙහි විහාරාධිපතිත්වය හෙබවීය. සටන මර්දනය කිරීමෙන් පසුව එම හිමියන්ව ඉංග්‍රීසීන් විසින් රටින් පිටුවහල් කරනු ලැබූහ. එසේ වුව ද ක්‍රි. ව. 1818 ඌව වෙල්ලස්ස සටන පිළිබඳව දැක්වෙන ඓතිහාසික ලේඛනවල එම හිමියන් පිළිබඳව කිසිදු තොරතුරක් සඳහන් කර නොමැත. මෙම නාපේ රේවත හිමියන්ව යාපනයේ සිරගතව සිටිය දී පොතුබන්ධන විහාර ස්ථානය වෙත එවන ලද තල්පත මේ පිළිබඳව ඇති එකම සාක්ෂිය වේ.

වර්තමානය වන විට පුස්කොළ ග්‍රන්ථයන් 89ක් විහාරස්ථානය සතුව පවතින අතර ඒවායින් බොහොමයක් ක්‍රි. ව. 1818න් පසු කාලයේ දී ලියන ලද ඒවා වේ. ඇතැම් ඒවා 20වන ශත වර්ෂයේ මැද සහ අග භාගයන්ට අයත් වන අතර, පුස්කොළ ග්‍රන්ථ කිහිපයක් 2004 වර්ෂය තරම් මෑත කාලයේ දී රචනා කරන ලද ඒවා වේ. මහනුවර යුගයේ අවසාන භාගයට හෙවත් 18 වන ශතවර්ෂයට අයත් ඉපැරණි පුස්කොළ ග්‍රන්ථයන්ගෙන් ශේෂිත වූ ග්‍රන්ථ දෙකක් ද මේ අතර විය.

මීට අමතරව 19 හා 20 වන සියවසේ මුල් භාගයට අයත් පිත්තල භාණ්ඩ, පර්සිලේන් පිඟන් භාණ්ඩ, දැවමය ගෘහ භාණ්ඩ ඇතුළු කෞතුක වස්තූන් රැසක් මෙම විහාරස්ථානය සතුව පවතී. මෙම පිත්තල භාණ්ඩ අතර බුලත් හෙප්පු, පඩික්කම්, කාලංචි, සේරක්කල, පැන්කෙණ්ඩි ඇතුළු භාණ්ඩ රැසක් විය. මෙම බුලත් හෙප්පු ආදී පිත්තල භාණ්ඩ අලංකාර කැටයමින් සරසා තිබේ.

මේ හැර විහාරස්ථානය සතුව ඇති ඉපැරණි ආවාස ගෘහය 18 වන ශත වර්ෂයට පමණ අයත් ගෘහ නිර්මාණ ලක්ෂණයන්ගෙන් සමන්විත වන අතර, දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් එම ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීමටත්, එහි කෞතුකාගාරයක් නිම කර විහාරස්ථානය සතු කෞතුක භාණ්ඩ එහි තැන්පත්කර මහජන ප්‍රදර්ශනය සඳහා යොමු කිරීමටත් යෝජනා කර තිබේ.

ආචාර්ය එච්.ඒ.කේ. නයනා කුමාරි ආරියරත්න
පර්යේෂණ නිලධාරි
දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාලය
මොණරාගල.

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති

පසුගිය වසර කිහිපය මුළුල්ලේ අඛණ්ඩව සිදුකරමින් පැවැත එන සංවර්ධන ව්‍යාපෘතීන් බොහෝමයක් මේ වසරේ ද ක්‍රියාත්මක අතර නීලගිරිය, යුධගනාව, දීඝවාපිය වැනි අතිවිශාල දාගැබ් මෙන්ම උතුරුමැද පළාතේ නවාගල හා උණගලාවෙහෙර දාගැබ් සංරක්ෂණය සහ ඓතිහාසික රජගලතැන්න පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු, යාපනය කොටුව හා රිටිගල බන්දා පොකුණ සංරක්ෂණය ඒ අතර ප්‍රධාන වේ.

ඉහත සුවිශේෂී ව්‍යාපෘතීන්ට අමතරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාපිත එක් එක් අංශ යටතේ පළාත් මට්ටමින් මධ්‍යම ප්‍රමාණයේ හා සුළු පරිමාණ ව්‍යාපෘති 550කට ආසන්න ප්‍රමාණයක්ද ක්‍රියාත්මක වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම්, ගවේෂණ, සංරක්ෂණ, නඩත්තු ආදී විවිධ අංශ යටතේ මේ වනවිටත් ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්

- **දීඝවාපිය දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය**
- **නීලගිරිය දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය**
- **රිටිගල, බන්දා පොකුණ සංරක්ෂණය**
- **පොළොන්නරුව උණගල වෙහෙර දාගැබ සංරක්ෂණය**
- **අනුරාධපුර නවාගල චෛත්‍යය සංරක්ෂණය**
- **මිහින්තලේ මහ සෑ මළුව සංරක්ෂණය**
- **රජගලතැන්න සංරක්ෂණ ව්‍යාපෘතිය**
- **හම්බන්තොට නැදිගම්විල ස්තූප මළුව සහ ප්‍රාකාර බැම්ම කැණීම්**
- **යාපනය කොටුවේ කොටු බැම්ම සංරක්ෂණය**
- **අනුරාධපුර කෞතුකාගාරය නවීකරණය**
- **තමන්කඩුව 28 කණුව පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය**
- **ගඩලාදෙණිය රජමහා විහාරයේ විහාරගෙය, එහි ආවාසගෙය, වහල සංරක්ෂණය**
- **හම්බන්තොට ගල්වැව පුරාණ රජමහා විහාරයේ නව චෛත්‍යය ඉදිකිරීම.**

මීට අමතරව හිඟුරක්ගොඩ නාගලකන්ද දාගැබ් සංරක්ෂණය, මැදවච්චිය ඉසින්බැස්සගල ස්තූප සංරක්ෂණය, බුත්තල හැඩැස්ස දාගැබ සහ මළුව කැණීම් ආදිය ක්‍රියාත්මකය.



# 2018 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද මෙහෙවර

අඛණ්ඩව සිදු කරනු ලබන නීලගිරිය, යුධගනාව, දීඝවාපි වැනි අතිවිශාල දාගැබ් සංරක්ෂණය මෙන්ම උතුරුමැද පළාතේ නවාගල හා උණගලාවෙහෙර දාගැබ් සංරක්ෂණය, ඓතිහාසික රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය, යාපනය කොටුව හා රිටිගල බන්දා පොකුණ සංරක්ෂණය ඒ අතර ප්‍රධාන වේ. මීට අතිරේකව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන ගවේෂණ, කැණීම්, අභිලේඛන හා නාණකවිද්‍යා, සංරක්ෂණ, වාස්තු විද්‍යා නඩත්තු, ප්‍රවර්ධන හා කෞතුකාර අංශ යටතේ ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාපෘති 550 කට ආසන්න ප්‍රමාණයක් ද ක්‍රියාත්මක වේ. ඒ සඳහා භාණ්ඩාගාර, මධ්‍යම සංස්කෘතික අරමුදල් හා වෙනත් බාහිර ආයතන ප්‍රතිපාදන ද යොදා ගෙන ඇත.

- දීඝවාපිය දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය
- නීලගිරි දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය
- රිටිගල බන්දා පොකුණ සංරක්ෂණ ව්‍යාපෘතිය
- රජගලතැන්න සංරක්ෂණ ව්‍යාපෘතිය
- පොළොන්නරුව උණගලවෙහෙර දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය
- අනුරාධපුර නවාගල චෛත්‍යය සංරක්ෂණ ව්‍යාපෘතිය
- මිහින්තලේ මහ සෑ මළුව සංරක්ෂණ ව්‍යාපෘතිය

## දීඝවාපිය දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය

නැගෙනහිර පළාතේ විශාලතම දාගැබ වන දීඝවාපී දාගැබ නිදන් හොරුන්ගේ ග්‍රහණයට ලක්වී විනාශ වී තිබූ අතර 2012-2015 කාලය තුළ සිදු කරන ලද විධිමත් කැණීම් හේතුවෙන් සංරක්ෂණ කටයුතු සඳහා පාදා ගැනීමට හැකි විය. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මේ වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 11.50 කි.

## නීලගිරි දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය

නැගෙනහිර පළාතේ දෙවන විශාලතම දාගැබ වන නීලගිරි දාගැබ ද නිදන් හොරුන්ගේ ග්‍රහණයට ලක්වී විනාශ වී තිබූ අතර 2012-2015 කාලය තුළ සිදු කරන ලද විධිමත් කැණීම් හේතුවෙන් සංරක්ෂණ කටයුතු සඳහා පාදා ගැනීමට හැකි විය. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මේ වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 11.0 කි.

## රිටිගල බන්දා පොකුණ සංරක්ෂණ ව්‍යාපෘතිය

රිටිගල වනජීවී රක්ෂිතයේ පිහිටි බන්දා පොකුණ අක්කර 5 ක පමණ වපසරියක පැතිරී ඇත. එහි සංරක්ෂණ කටයුතු මේ වර්ෂයේ ආරම්භ කර ඇති අතර සංරක්ෂණ කටයුතු ඉදිරි වර්ෂ කීපය දක්වා ක්‍රියාත්මකයි.

## පොළොන්නරුව උණගලාවෙහෙර දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය

පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහන යටතේ උණගලාවෙහෙර දාගැබ සංරක්ෂණ කටයුතු ද අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම මත ක්‍රියාත්මක වූ අතර, දාගැබ හා මළුව සංරක්ෂණ කටයුතු සාර්ථකව සිදු කර, 2018-06-24 දින අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් මහජනතාවට වැඳුම් පිදුම් කිරීම සඳහා විවෘත කර දී ඇත.








මීට අමතරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය, කැණීම් අංශය, ගවේෂණ අංශය, රසායන සංරක්ෂණ අංශය, වාස්තුවිද්‍යා අංශය, ප්‍රවර්ධන අංශය, නඩත්තු අංශය ආදී අංශ මගින් ශ්‍රී ලංකාව පුරා ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නගන ලදී.

තොරතුරු සම්පාදනය, සැලසුම් අංශය

# 2018 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද මෙහෙවර

## මධ්‍යම පළාත

මහනුවර, මාතලේ, නුවරඑළිය යන දිස්ත්‍රික්ක තුනෙන් සමන්විත මධ්‍යම පළාත තුළ 2018 වසර තුළ දී ගවේෂණ, කැණීම්, වාස්තුවිද්‍යා සංරක්ෂණ, රසායන සංරක්ෂණ, කෞතුකාගාර හා ප්‍රවර්ධන අංශයන් හි ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන්නට යෙදුණි.

එහි දී ගවේෂණ අංශය මඟින් මාතලේ උකුවෙල උඩුපිහිල්ල වෙහෙරගොඩ විහාර භූමිය ගවේෂණය, හතරලියද්ද වෙලගම විහාර භූමිය ගවේෂණය සිදු කරන ලදී. ඊට අමතරව ස්ථාන පරීක්ෂා කිරීම, පුරාවස්තු විනාශය, සොරා ගැනීම, අනවසර ඉදිකිරීම්, පුරාවිද්‍යා හානි ඇගයුම් සඳහා මූලික නිරීක්ෂණ කටයුතු හා ඛනිජ පාෂාණ නිස්සාරණ පිළිබඳ නිරීක්ෂණ කටයුතු සිදු කරන්නට යෙදුණි.



කැණීම් අංශය යටතේ මාතලේ උකුවෙල උඩුපිහිල්ල වෙහෙරගොඩ විහාර භූමියේ නව බෝධි ප්‍රාකාරයක් ඉදි කිරීම අරමුණු කොටගෙන කැණීමක් සිදු කරන ලදී. පැරණි සාධක කිසිවක් කැණීම තුළින් අනාවරණය නොවූයෙන් නව බෝධි ප්‍රාකාරය ඉදි කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

කෞතුකාගාර අංශය යටතේ මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරය පවත්වාගෙන යාම ව්‍යාපෘතියට අදාළව කෞතුකාගාර භූමිය අලංකරණය, කෞතුක වස්තු ආරක්ෂා කිරීම, කෞතුක වස්තු විධිමත්ව හා





ආකර්ෂණීය ව ප්‍රදර්ශනය කිරීම, ලෝහ බුද්ධ ප්‍රතිමා දෙකක් විධිමත්ව වාර්තාගත කිරීම, දාරුමය පුරාවස්තු 60ක් හඳුනාගැනීම හා සැලසුම් ඡායාරූප සහිත වාර්තාගත කිරීම, ප්‍රදර්ශනයට තබා ඇති පුරාවස්තු අතරින් 8ක් සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ආධාරක පුවරු සැකසීම, කෞතුකාගාර ගොඩනැගිල්ලේ පිටුපස කොරිඩෝව සඳහා විදුලි බල්බ යෙදීම සහ කාර්යමණ්ඩලය දැනුවත් කිරීමේ දේශන 3ක් පැවැත්වීම සිදු කරන ලදී.

තව ද නාලන්ද ගෙඩිගේ තොරතුරු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම යටතේ තිර රෙදි යෙදීම හා දෛනික පවිත්‍රතා කටයුතු සිදු කිරීම කරන ලදී. පිදුරංගල තොරතුරු මධ්‍යස්ථානය තුළ යටිතල පහසුකම් දියුණු කිරීම ව්‍යාපෘතිය යටතේ ජල පහසුකම් ලබා ගැනීම සහ දෛනික පවිත්‍රතා කටයුතු සිදු කිරීම කරන ලදී.

රසායන සංරක්ෂණ අංශය යටතේ මුල්ගම රජමහ විහාරය, නිලගම රජමහ විහාරය, යතුරුගැසුලියද්ද විහාර සහ වැලිවිට වේගොල්ල විහාරය යන ස්ථානයන් හි සිතුවම් මූර්ති රසායන සංරක්ෂණ කටයුතුවල ට භාජනය කරන ලදී. මෙම ව්‍යාපෘති යටතේ සිතුවම් සහ මූර්ති සැලසුම් මඟින් සහ ඡායාරූප මඟින් වාර්තාගත කරන ලදී. සංරක්ෂණය කළ යුතු ම ස්ථාන සංරක්ෂණය කිරීම, සිතුවම් සතරය පිරිසිදු කිරීම සහ වර්ණ ස්ථරයේ ගැටලු විසඳා අවශ්‍ය ම අවස්ථාවල දී පමණක් වට රේඛාවන් හි (Out line) වර්ණ ගැළපීමට දිය සායම් භාවිත කරන ලදී. යතුරුගැසුලියද්ද විහාරයේ බාහිර බිත්තිවල සිතුවම් වාර්තාගත කිරීම් සඳහා පවතින ප්‍රමාණයේ වට රේඛාවන් පමණක් සැලසුම් මඟින් (Grafic Documentation) වාර්තාගත කරන ලදී. නඩත්තු අංශය යටතේ පවතින නඩත්තු කලාප 11 වසර පුරා පවත්වාගෙන යාම සිදු කරන ලදී. තව ද සීගිරිය ක්ෂේත්‍ර නිරීක්ෂණ නිවස අලුත්වැඩියාව, වෙලන්ගහවත්ත ටැම්පිට



විහාරයේ වහල නඩත්තු කිරීම, ගනේගෙදර විහාරයේ වහල නඩත්තු කිරීම, රාම චෛත්‍ය පුරාවිද්‍යා ස්ථානයේ පෙත්මංවලට බොරළු දැමීම, කෙන්ගල්ල අම්බලම වහල නඩත්තු කිරීම, නාරම්පනාව අම්බලම නඩත්තු කිරීම, හුරිකඩුව ගල්පිහිල්ල විහාරයේ පුරාවස්තු සඳහා දැව අල්මාරි ඉදි කිරීම, පස්ගම දැඩිමුණ්ඩ දේවාලය නඩත්තු කිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නට යෙදුණි.

ප්‍රවර්ධන අංශය යටතේ දිස්ත්‍රික්ක තුන නියෝජනය වන පරිදි ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කෙරිණ. නුවරඑළිය රාගල ටී. බී. එම්. හේරත් විද්‍යාලයේ සිසු දරු දැරියන් වෙනුවෙන් පුරාවිද්‍යා සම්මන්ත්‍රණ වැඩසටහනක් ද පුරාවිද්‍යා සතිය නිමිතිකොට ගෙන පිදුරංගල පුරාවිද්‍යා ස්ථානයේ දී පුරාවිද්‍යා සේවක, නිලධාරීන්, කිඹිස්ස නාවික හමුදා කඳවුරේ නිලධාරීන් සහ ගම්වාසීන් සම්බන්ධ කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් ද ගුරුළුපොත පුරාවිද්‍යා ස්ථානය කේන්ද්‍ර කරගනිමින් පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීමේ සහ ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ දී පුරාවිද්‍යා නිලධාරීන්, සේවක පිරිස් හා මධ්‍යම පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නියෝජනය කරන සංස්කෘතික නිලධාරීන් හා වෙනත් රාජ්‍ය





නිලධාරීන් ඉලක්ක කරගනිමින් මාසික දේශන මාලාවක් සිදු කරන්න ට යෙදුණි.

යටකී ව්‍යාපෘතීන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සිදු කරන්නට යෙදුණි. ඊට අමතරව පොදු තැන්පත් හා බාහිර ආයතන ආධාර යටතේ වාස්තුවිද්‍යා සංරක්‍ෂණ සහ නඩත්තු අංශ මඟින් ගම්පොළ කදිරේෂන් කෝවිල ජේකඩ සැකසීම, දොඩම්වල නාථ දේවාලයේ වහල සංරක්‍ෂණය, වතුවල විහාරගේ නඩත්තු කිරීම, හේන්දෙණිය විහාරගේ වහල නඩත්තු කිරීම සහ ගනේගොඩ කතරගම දේවාලයේ නඩත්තු කටයුතු සිදු කරන ලදී.

තවද මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රතිපාදන යටතේ ලංකාතිලක විහාර භූමිය ආශ්‍රිත යාර 400 භූමිය ගවේෂණය, දඹුල්ල බඹරගලකන්ද දාගැබ කැණීම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම, වල්ලහගොඩ විහාරයේ චෛත්‍යඝරය නඩත්තු කිරීම, මාර්ග සංඥා පුවරු සිටුවීම, උඩතලවින්න වෙහෙරගල දාගැබ නඩත්තු කිරීම, කුඹල්ඔලුව ටැම්පිට විහාරය සංරක්‍ෂණය, රීකිල්ලගස්කඩ අම්බලම සංරක්‍ෂණය, මාරස්සන ධර්මශාලාව සංරක්‍ෂණය යන ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී.

**ඩී.එම්.බී.ජේ.බී. දිසානායක**
සහකාර අධ්‍යක්‍ෂ (මධ්‍යම)

## බදුල්ල දිස්ත්‍රික්කය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඌව පළාතේ බදුල්ල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මඟින් 2018 වර්ෂය තුළදී දිස්ත්‍රික්කයේ ජාතික උරුමයන් ආරක්ෂා කර ගැනීමේහිලා සුවිශේෂී වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී අතීත උරුමයන් හඳුනාගැනීම, ලේඛණ ගත කිරීම හා හායනය වෙමින් පවතින පුරා විද්‍යා



ස්මාරක සංරක්ෂණය සහ නඩත්තු කාර්යයන් හඳුනාගෙන ආරක්ෂාව තහවුරු කිරීම ඇතුළුව ප්‍රදේශයේ ජාතික උරුමයන් අනාගත පරපුර උදෙසා ආරක්ෂාව සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරන ලදී. එම කාර්යයන්ට සමගාමීව ප්‍රදේශයේ ජාතික උරුමයන් පිළිබඳව මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබීය.

2018 වසරේ වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ගවේෂණ හා ලේඛනගත කිරීමේ අංශය මඟින් පුරාවිද්‍යා භූමිවල සිදුකරන අනවසර කැණීම් සහ පුරාවස්තු සොරකම් කිරීම, ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමගාමීව ඊට අදාළ භූමිවල පුරාවිද්‍යා හානි ඇගයීම් ගවේෂණ, ගල් බිඳුම් හා ඛනිජ කැණීම් ස්ථාන පරීක්ෂා කිරීම සිදුකර නිර්දේශ ලබාදීම යනාදී කාර්යයන් රැසක් සිදුකරන අතරවාරයේදී ප්‍රදේශයේ වංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ කාර්යයද ඇදගල පුරාවිද්‍යා භූමි ගවේෂණ කාර්යය ද ඉටුකරන ලද්දේ ශාස්ත්‍රීය කටයුතු සඳහාද ප්‍රමුඛතාවයක් ලබා දෙමිනි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන සේම පොදු තැන්පතු අරමුදල යටතේද ක්‍රියාත්මකවූ ව්‍යාපෘතියක් වන්නේ බදුල්ල දිස්ත්‍රික් පරිපාලන කෞතුකාගාරය ප්‍රතිසංවිධාන කටයුතු ඉටුකිරීම.

රසායන සංරක්ෂණ යටතේ බුලත්වත්ත ලෙන්විහාරය, රාවණාඇල්ල ලෙන්විහාරය, සෙනසුන්ගල ලෙන්විහාරවල සිතුවම් සහ මූර්ති සංරක්ෂණය කිරීමේ කාර්යන්හිදී සිතුවම් ස්ථරමතවූ අපද්‍රව්‍ය ඉවත් කර එහි දෘශ්‍ය ඒකාග්‍රතාවය ආරක්ෂා කිරීම, හායනයට ලක්ව තිබූ ප්‍රතිමා තහවුරුකර වර්ණ ප්‍රතිනිර්මාණය කිරීම හා වේයන්ගෙන් සිදුව ඇති හානිය සඳහා වේනාශක යෙදීම මෙන් එම ප්‍රදේශයේ ඇති මහනුවර යුගයේ සිතුවම් සහ මූර්ති හායනය වළක්වා ආරක්ෂාව සඳහා පිළියම් යොදා ඇත.

දිස්ත්‍රික්කයේ පුරා විද්‍යා ස්මාරක ආරක්ෂා කිරීම හා අනාගත පරපුර උදෙසා දායාද කරදීමට සමගාමීව මහජන සහයෝගය



ලබාගැනීම දැනුවත් කිරීමේ කටයුතු සඳහා විවිධ වූ කාර්යයන් ප්‍රවර්ධන අංශය මඟින් ඉටුකරන ලදී. ඒ අනුව මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන නගර ආශ්‍රිත පොලිස්



ආරක්ෂණ කොට්ඨාසයේ නිලධාරීන් සමඟ අත් පත්‍රිකා බෙදීම, පුරාවිද්‍යා සති වැඩසටහනට සමගාමීව කලාප මට්ටමින් පාසල් දේශන පැවැත්වීම හා රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමේ දේශන පැවැත්වීම හා ඌව වෙල්ලස්ස නිදහස් අරගලයේ 200 වන සැමරුම් උත්සවය වෙනුවෙන් විශේෂ දේශන මාලාවක් පවත්වනු ලැබීය.

**ඉනෝකා බාලසූරිය**
ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (බදුල්ල)

## යාපනය දිස්ත්‍රික්කය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ යාපනය පුරාවිද්‍යා කාර්යාලය කේන්ද්‍රගත කොටගෙන 2018 වර්ෂයේ සංරක්ෂණ, කෞතුකාගාර පවත්වාගෙන යාම, පුරාවස්තු ලේඛනගත කිරීමේ කටයුතු, පුරාවිද්‍යා ස්ථාන නඩත්තු කොට පවත්වාගෙන යාම හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන අංශ යටතේ කාර්යයන් සිදු කෙරුණි. ඊට අමතරව යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වූ ඛණිජ නිස්සාරණය සඳහා අවශ්‍ය බලපත්‍ර ලබාදීම ද මෙම වසරේ ද සිදු කෙරුණි.

යාපනය ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට අදාළ කෞතුකාගාරයක් වන යාපනය කෞතුකාගාරයේ මහජනතාවගේ ප්‍රදර්ශනය සඳහා සාමාන්‍ය පරිදි නඩත්තු කොට පවත්වාගෙන යාම මෙම වසරේ ද



සිදු කරන ලදි. එමෙන්ම එහි ප්‍රදර්ශන අල්මාරි අලුත්වැඩියාව, විදුලි පරිපථයේ අලුත්වැඩියා කටයුතු හා මායිම් තාප්පය සකස් කිරීම වැනි ව්‍යාපෘති කිහිපයක් සිදුකරන ලදි. කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණය කිරීම මෙම වසරේ සිදුකල රසායන සංරක්ෂණ ක්‍රියාවලියකි. එම කාර්යයන් ප්‍රධාන කාර්යාලයේ රසායන සංරක්ෂණ අංශයේ ප්‍රධානත්වයෙන් හා යාපනය කෞතුකාගාරයේ මැදිහත්වීමෙන් සිදු කරන ලදි. එහිදී යාපනය කෞතුකාගාරයේ ඛාදනය වෙමින් පවතින ලෝහ පුරාවස්තුවලින් කොටසක් සංරක්ෂණය කිරීමට කටයුතු කරනු ලැබිණි.

කෞතුකාගාරයේ විදුලි පරිපථය අලුත්වැඩියා කිරීමේදී නව පරිපථයක් සකස් කොට කෞතුකාගාරය වටා බාහිරින් දීප්ත බල්බ (Flash Lights) යොදා ආලෝකමත් කිරීම මෙම වසරේදී සිදු කරන ලදි. එමගින් රාත්‍රී කාලයේ කෞතුකාගාරයේ ආරක්ෂාව වැඩිදුරටත් ඉහළ නැංවීමට සමත් විය.

එමෙන්ම යාපනය කෞතුකාගාරය වෙත ස්වයංක්‍රීය කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීමද පසුගිය වසරේ සිදු කරන ලදි. එය ප්‍රධාන කාර්යාලයේ කෞතුකාගාර අංශයේ මැදිහත්වීමෙන් දිවයින පුරා පවතින දෙපාර්තමේන්තු කෞතුකාගාර වෙත ලබාදුන් ඉතා වටිනා දායාදයකි. පැය 24 පුරා ක්‍රියාත්මක ස්වයංක්‍රීය කැමරා මගින් කෞතුකාගාරය ඇතුළත හා පිටත නිරීක්ෂණය කිරීමට හැකිවීම ලැබීම කෞතුකාගාරයේ ආරක්ෂාව වඩාත් වැඩිදියුණු කිරීමට සමත්ව ඇත.

එමෙන්ම යාපනය ප්‍රාදේශීය කාර්යාලය මගින් යාපනය කොටුවේ ගබඩා ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය අලුත්වැඩියා කර ක්‍රමවත් ලෙස සකස් කිරීම හා යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ පුස්තකාලයක් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමද සිදු කරන ලදි. යාපනය පැරණි





කච්චේරි ගොඩනැගිල්ල, කන්දරෝඩය පුරාවිද්‍යා ස්ථානය, මන්ත්‍රී මාලිගය, යමුනාරි පොකුණ, සංකිලියන් තොරණ, නිලාවරේ ළිඳ, සිරප්පර මඩම, තෙරුමුඩි අම්බලම වැනි පුරාවිද්‍යා ස්ථාන අවට පිරිසිදු කොට නඩත්තු කර පවත්වාගෙන යාම හා සාමාන්‍ය පරිදි ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල කටයුතු පවත්වාගෙන යාමද පසුගිය වසරේ සාමාන්‍ය කටයුතු ලෙස සිදු කරන ලදි.



එමෙන්ම ප්‍රදේශයේ පාසල් සිසුන් අරඹයා විශේෂ සම්මන්ත්‍රණ මාලාවක් ද යාපනය ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ මැදිහත්වීම මත සිදු කරන ලදි. ඒ සඳහා යාපනය දිස්ත්‍රික්කයේ සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් ද්විත්වය බැගින් යොදා ගන්නා ලදි.

මේ අනුව යාපනය ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මූලික කොට ගෙන ලැබී තිබුණු මූල්‍ය ප්‍රතිපාදන හා මේ වසරේ අනුමත ඇස්තමේන්තු අනුව පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ රැකගත යුතු හා ආරක්ෂා කළ යුතු ස්ථාන වල පැවැත්ම සඳහා සංරක්ෂණ, නඩත්තු හා පාලන කටයුතු නිසි පරිදි සිදු කරන ලදි.

**පියතිලක බණ්ඩා**
සහකාර අධ්‍යක්ෂ (යාපනය)

## වයඹ පළාත

2018 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලය මඟින් වයඹ පළාතට රු. මිලියන 05 කට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වැය කරමින් ගවේෂණ කැණීම් වාස්තු විද්‍යා සංරක්ෂණ නඩත්තු ප්‍රවර්ධන කෞතුකාගාර හා රසායන සංරක්ෂණ යන අංශ නියෝජනය කරමින් කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික් ආවරණය වන පරිදි ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවන ලදී.

2018 වර්ෂයේදී ගවේෂණ අංශය මඟින් ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු ව්‍යාපෘති, ඛනිජ නිස්සාරණ ව්‍යාපෘති, අනවසර කැණීම් ස්ථාන පරීක්ෂාව, වෙනත් ස්ථාන පරීක්ෂා කිරීම්, පුරාවිද්‍යා වටිනාකම් පරීක්ෂාව වැනි කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව අනවසර කැණීම් පුරාවස්තු විනාශ කිරීම හා සොරකම් කිරීම පිළිබඳ ස්ථාන පරීක්ෂා කිරීම් 75 ක් පරීක්ෂා කර වාර්තා ලබා දී ඇත. පාෂාණ හා ඛනිජ නිස්සාරණ ව්‍යාපෘති ස්ථාන සඳහා වාර්තා ලබාදීමට ස්ථාන 315 ක් පරීක්ෂා කර ඇත. ස්ථානීය ගවේෂණ හා ක්ෂේත්‍ර ගවේෂණ ස්මාරක ලියාපදිංචි කිරීම සඳහා කුරුණෑගල මාළිගා පරිශ්‍රය ගවේෂණය කිරීම හා සංගමුව රජමහා විහාර භූමිය හා තදාශ්‍රිත ප්‍රදේශය ගවේෂණ කටයුතු සිදු කරන ලදී. රාජ්‍ය ආයතන, මහජනතාව දැනුම් දීම හා ප්‍රධාන කාර්යාලයීය දැනුම්දීම් මත ස්ථාන පරීක්ෂා කිරීම් 84 කට වැඩි ප්‍රමාණයක් සඳහා වාර්තා ලබාදී ඇත. ස්මාරක ගැසට් කිරීම උදෙසා ස්ථාන පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර ඇත. එමෙන්ම චංචල පුරාවස්තු ලේඛනගත කිරීම යටතේ පන්නල මැද්දේපොල රජමහා විහාර කෞතුකාගාරයේ තැන්පත් කර තිබූ පුරාවස්තු 580 ක් ද පන්නල කවුඩුමුන්න ඉන්ද්‍රසාරාමය සහ ලිහිණියගල්ල සාලිය රජමහා විහාරය යන විහාරස්ථාන යන්හි විසිරී තිබූ පුරාවස්තු 52 ක්ද ලේඛනගත කරන ලදී.

පසුගිය වසර තුළ නඩත්තු අංශය යටතේ කලාප කාර්යාල 09 නඩත්තු කටයුතු සිදු කරන ලදී. මෙහිදී කලාප අංක 01 (පුත්තලම) කල්පිටිය ඕලන්ද පල්ලියේ පැරණි ස්මාරක ගොඩනැගිලිවල බිත්ති තහවුරු කිරීම සිදු කරන ලදී.

කලාප අංක 02 ( තෝනිගල) පවත්වාගෙන යාම යටතේ නඩත්තු කටයුතු සිදු කරන ලදී. කලාප අංක 03 රාජාංගනය පවත්වාගෙන යාම යටතේ මාර්ග සංඥා පුවරු යෙදීම ජන්තාඝර ගොඩනැගිලි නඩත්තුව ඇතුළු සුළු නඩත්තු කටයුතු සිදු කරන ලදී. ඊට අමතරව කලාප අංක 04 යාපහුව පවත්වාගෙන යාම යටතේ යාපහුව පුරාවිද්‍යා ස්ථානය පවත්වාගෙන යාමට අමතරව ගනේකන්ද පුරාණ විහාරය නාගොල්ල මාළිගාතැන්න පුරාවිද්‍යා





ස්ථානය හා කබල්ලෑලෙන පුරාණ විහාරය කළුවැන්නාව ටැම්පිට විහාරයය ආදියෙහි සුළු නඩත්තු හා සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. විශේෂිත නඩත්තු ව්‍යාපෘතියක් ලෙස යාපහුව වැඩබිම් කාර්යාලය අලුත්වැඩියා කිරීම යාපහුව සංචාරක බංගලාව සඳහා ජලය ලබාගැනීම හා දොර ජනෙල් රෙදි යෙදීම සිදු කරන ලදී.

මීට අමතරව මාලිගාතැන්න කලාප කාර්යාලයේ අලුත්වැඩියාව සිදු කරන ලදී. කලාප අංක 05 අරංකැලේ පුරාවිද්‍යා ස්ථානය පවත්වාගෙන යාම හා කම්බි වැටවල් සකස් කිරීම සිදු කරන ලදී. කලාප අංක 06 කුරුණෑගල පවත්වාගෙන යාමට අමතරව සේරුවාගල නාථගනය යන පුරාවිද්‍යා ස්ථානයන්හි සුළු නඩත්තු කටයුතු සිදු කරන ලදී. කලාප අංක 07 (පඩුවස්නුවර) පවත්වාගෙන යාමට අමතරව පුරාවිද්‍යා පරිශ්‍රයේ පිහිටි කොටවෙහෙර පන්සල් වත්ත තුළ වන අවශේෂ ගොඩනැගිලි තහවුරු කිරීම හා නිකපිටිය නිකසලානුවර රිදීකන්ද බිංගිරිය විහාර හා පඩාවැව ඉපැරණි වැටි බැම්ම ආශ්‍රිතව සුළු නඩත්තු කටයුතු සිදු කරන ලදී.

කලාප අංක 08 පවත්වාගෙන යාමට අමතරව රත්මලේ පොකුණ හා බුන්නැහැපොල පුරාණ විහාරය පැන්තැනිගොඩ යන ස්ථානයන්හි සුළු නඩත්තු කටයුතු සිදු කරන ලදී.

පසුගිය වසරේදී වාස්තු විද්‍යා සංරක්ෂණ ව්‍යාපෘති යටතේ ශිලාපොක්කරණිය රජමහා විහාරය ඉදිරි මණ්ඩපය සංරක්ෂණය බිහල්පොල රජමහා විහාරය ධාතු මන්දිරය සංරක්ෂණය පනාවිටිය තොරතුරු මධ්‍යස්ථානයේ සංරක්ෂණ කටයුතු හා රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව බිංගිරිය රජමහා විහාර භූමියේ සංරක්ෂණ හා භූ දර්ශණ සැකසීමේ කටයුතු සිදු කරන ලදී.

පසුගිය වසරේදී කෞතුකාගාර අංශය යටතේ පඩුවස්නුවර, පුත්තලම, යාපහුව දඹදෙණිය හා කෞතුකාගාරය පවත්වාගෙන යාම හා රාජාංගනය තොරතුරු මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අමතරව පඩුවස්නුවර හා පුත්තලම කෞතුකාගාරය සදහා ආරක්ෂිත (සී. සී.ටීවී) කැමරා සවි කිරීම සිදු කරන ලදී.

මීට අමතරව වයඹ පළාතේ ප්‍රවර්ධන අංශය මඟින් පුරාවිද්‍යා උරුමය හා පුරාවස්තු ආරක්ෂා කිරීම පිළිබඳව මහජනතාවගේ අවබෝධය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පාසල් ළමුන් තාක්ෂණික ආයතන රාජ්‍ය ආයතන යන්හී නිලධාරීන් පොලිස් නිලධාරීන් අලලා විවිධ දේශන සම්මන්ත්‍රණ ආදී කාර්යයන් 22 ක් පවත්වන්නට යෙදුනි.

**එල් . එම්. ගුණතිලක බණ්ඩා**
සහකාර අධ්‍යක්ෂ (වයඹ)

## අනුරාධපුර දිස්ත්‍රික්කය

අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාළව 2018 වර්ෂයේදී ගවේෂණ නඩත්තු, කැණීම් දත්ත විශ්ලේෂණ, ප්‍රවර්ධන, සංරක්ෂණ හා කෞතුකාගාර අංශ මඟින් අතීත උරුමයන් සුරක්ෂිතව ආරක්ෂාකර මතු පරපුර උදෙසා දායාද කිරීමේ පරමාර්ථයෙන් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වූ අතර ඒවා ගුණාත්මකව අවසන් කිරීමටද හැකියාව ලැබුණි.



කැණීම් දත්ත විශ්ලේෂණ අංශය මඟින් ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කළ අතර,

01. හාතියගිරි ආරණ්‍ය සේනාසනයේ ස්තූපය කැණීම් කොට පාදා ගැනීම.

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ ක්‍රි.පූ 03 වන සියවසේ සිට ක්‍රි.ව. 10 වන සියවසේ අග දක්වා වූ පුරාවිද්‍යාත්මක සාධක සහිත ස්ථානයකි. ලංකාවේ වංශකතාවල මෙම ස්ථානයට ස්ථානීය නාමයක් හෝ වෙනත් විස්තරයක් සඳහන් නොවුනද භූගෝලීය පිහිටීම අනුව රාජකීය නගරයට උතුරු දෙසින් පිහිටීම නිසා මුල්යුගයේ සිට මෙම ප්‍රදේශය ජනාවාස වන්නට ඇතිබව නිගමනය කළහැකි සාක්ෂියක් වන්නේ මෙම ස්ථානයේ ඇති පර්වත ලිපි ක්‍රි.ව 5 - 6 වන සියවස්වලට අයත් වීමයි.

02. ඉසින්බැස්සගල විහාර ස්ථානයේ ස්තූපය පාදාගැනීමේ කැණීම.

මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය පිළිබඳ ස්ථානීය නාමයක් හෝ වෙනත් විස්තර ලංකාවේ වංශකතාවල සඳහන් නොවුනද අනුරාධපුර රාජකීය පාලන මධ්‍යස්ථානයට කි.මී 28 ක් පමණ උතුරු දෙසින් පිහිටීම හේතුවෙන් මුල්කාලීන අවධියේ සිට ජනාවාස වන්නට ඇති බව මෙහි ඇති පර්වත ලිපියෙහි ක්‍රි.ව 5 - 6 සියවසේදී විහාර ප්‍රතිසංස්කරණයක් පිළිබඳ සඳහන් වීමෙන් නිගමනය කළ හැකි වේ.

2018 වර්ෂයේදී සංරක්ෂණ අංශය මඟින් මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රළපනාව බුදුරැස්විහාරයේ චෛත්‍යය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කළ අතර මෙම චෛත්‍යයද නිධන් හොරුන් විසින් විනාශ කර තිබුණි.

නඩත්තු අංශයට අදාළව පුරාවිද්‍යා කලාප 13 කි. ඉන් කලාප 10 ක් කලාප කාර්යාල සහිතව සේවකයන් යෙදවූ ස්ථිර වැඩබිමිය. ස්මාරක සහිත භූමි සුද්ධ පවිත්‍ර කිරීම, පෙත්මං සකස් කිරීම, ස්මාරක තහවුරු කිරීම, ස්මාරකවල ආරක්ෂාව සඳහා දෛනික මුර සේවාව පවත්වාගෙනයාම ඇතුලු නඩත්තු කටයුතු මඟින් වර්ෂය පුරාවට එම කලාප පවත්වාගෙන යනු ලබයි.

**ඩී.එම් පියතිලක බණ්ඩා**
සහකාර අධ්‍යක්ෂ (අනුරාධපුරය)



# මොණරාගල දිස්ත්‍රික්කය

දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකොළහ පුරාවිද්‍යා කලාප හතරක් ලෙසට ක්‍රියාවට නංවා නඩත්තු කාර්යයන් ඉටු කර ඇත.

2016 සිට පුරාවිද්‍යා පැරණි ස්මාරක භූමි, ආරක්ෂිත ස්මාරක හා රක්ෂිත භූමි කලාප මට්ටමින් බුදුරුවගල, මාලිගාවිල, බිබිල, ගලබැද්ද යන කලාපවලට යොමුගත කලාප නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් සේවක සේවිකා පිරිස් හා නිලධාරීන් යොමු කරමින් නඩත්තු කාර්යය සිදු කරමින් පවතී. වාර්ෂිකව ලබන නඩත්තු ප්‍රතිපාදන මත සැකසුණු ඇස්තමේන්තුවලට අදාළව ඒ ඒ වසරේ භෞතික මූල්‍ය ප්‍රගතිය ලබාගෙන ඇත. ප්‍රමුඛ නඩත්තු කාර්යයන් අතර බුදුරුවගල ප්‍රතිමා භූමි හා ක්ෂේත්‍ර නිවාසය වහල නැවත සකසා අලුත්වැඩියා කිරීම,



කතරගම ක්ෂේත්‍ර නිවාසයේ විවිධ වූ නඩත්තු කිරීම, කතරගම රාමක්‍රිෂ්ණ පුරාවිද්‍යා පැරණි කෞතුක වස්තු ගබඩාවේ නඩත්තු කටයුතු, මාලිගාවිල රක්ෂිතයේ හා බුද්ධ ප්‍රතිමාව ඇස්තමේන්තු සැකසීම, දඹේගොඩ බෝධිසත්ව ප්‍රතිමාව හා ආශ්‍රිත නඩත්තු පෙත්මන් සැකසීම, දෙමටමල් විහාර නඩත්තු පෙත්මන් සැකසීම.

හැබැස්ස පුරාවිද්‍යා රක්ෂිතයේ හා වෙහෙරයාය යටියල්ලාතොට රක්ෂිතය නඩත්තු කාර්යය කිරීම, සෙල්ලබාව (වැල්ලවාය) රක්ෂිත නඩත්තු කටයුතු, බුදුරුවගල කලාපයට අයත් පීල්ලේකෙම රක්ෂිතයේ මායින් කණු යෙදවීම, එවන් රක්ෂිත හඳුනා ගැනීම, මායිම් නිරවුල් කිරීම සිදුකරන ලදී. අවශ්‍ය ස්ථාන වෙත සේවකයින් යොදවා නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.

ගලබැද්ද කලාපයට අයත් ස්ථාන සමූහයක් නඩත්තු කටයුතුවලට යොමු කෙරිණ. ඒ අතර ශ්‍රීපාන රක්ෂිතය, ගලබැද්ද, කුමාර පොකුණ, (අවශ්‍ය ජලමාර්ග නඩත්තු කිරීම) රිටිගහවත්ත, බුද්ධම, මාණාහාරණ, මුප්පනේ විහාරය, යෝජිත නඩත්තු ක්‍රියාකාරකම් සිදු කරන්නට යෙදුණි.

බිබිල කලාපයට අයත් මැදගම බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකේ ස්ථාන දෛනික නඩත්තු කළ අතර කොටසර පියංගල, පොතුබන්ධන, කරාඬුගල, නාළයන රක්ෂිත හා ආරක්ෂිත ස්මාරක සහිත විහාරස්ථාන අවශ්‍ය නඩත්තු කටයුතු කාර්යයන් සිදු කෙරිණි.

පුරාවිද්‍යා සහයකයින් හෝ මුරකරුවන් නොමැති ස්ථාන රාශියකට දීමනා රැකවල්කරුවන් පත්කර සෑම ස්ථානවලම නඩත්තු කාර්යය දිස්ත්‍රික්කය පුරාවට අවශ්‍ය පරිදි යථාවත් කර ඇත.

ස්ථාන පරීක්ෂා කර වාර්තා ගැනීම, ලේඛනගත කිරීම, ගැසට් පත්‍රයට යොමුකිරීම, යොමු කළ ඇස්තමේන්තු අනුව ලද ප්‍රතිපාදන අනුව කාර්යය සිදුකළ අතර ඒ අතරම අනවසර කැණීම්, පුරාවස්තු සොරා ගැනීම, පුරාවස්තු විනාශ කිරීම සම්බන්ධ පොලිසිය මගින් අධිකරණ ක්‍රියාදාමයට ගොස් වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමට අවශ්‍ය නිර්දේශ ලබාදී ඇත. එම කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුගත හා ඒ ඒ පොලිස් ස්ථානවලට සම්බන්ධ පුරාවස්තු ආරක්ෂණ පොලිස් ඒකකවල නිලධාරීන් සමගින් ක්‍රියාකර ඇත. ස්ථානීය ගවේෂණ වශයෙන් බුත්තල රහතන් කන්ද, ඔක්කම්පිටිය හා හැබැස්ස, බඩල්කුඹුර, උඩඅරාව, වෙහෙරයාය, සියඹලාන්ඩුව නාමලුව රක්ෂිත ගවේෂණය ආදී පුළුල් ගවේෂණයන් සිදුකර අදාළ කාර්යය හි වාර්තා සපයා ඇත. ඇතිමලේ වෙට්ටඹුගල ජනී ජනයාගේ විස්තර සටහන් පූර්ණ නිරීක්ෂණ වාර්තා සකසා ප්‍රචාරණය කර ඇත.

දිස්ත්‍රික් පරිපාලන කටයුතු ආරම්භය සමඟ බඩල්කුඹුර තේරප්පහුව, යුධගනාව ස්ථානීය පර්යේෂණ කැණීම්, මාණාහරණ (සියඹලාණ්ඩුව) ප්‍රාකාර බැම්ම හා මළුව සංරක්ෂණ කාර්යය සඳහා කැණීම් හැබැස්ස (ඔක්කම්පිටිය) ස්තූප සංරක්ෂණ කාර්යය සඳහා කළ කැණීම් දියත් කර අවසන් කර ඇත.

දිස්ත්‍රික්කයේ ප්‍රමුඛව පිහිටා ඇති බුදුරුවගල කෞතුකාගාරය අවශ්‍ය නඩත්තු කරමින් මනා ප්‍රදර්ශන මට්ටම ඇතිකර ප්‍රදර්ශනයට අවශ්‍ය කාර්යය සිදුකර ඇත.

නිලධාරී ශිල්පීන් සේවක පිරිස් වෙත අවශ්‍ය පුහුණුව ලබාදී කාර්යයට යොමු කර මහජන ප්‍රදර්ශන මට්ටමට ස්ථානය ගෙනවිත් ඇත.

ඊට සමගාමීව ප්‍රකාශන අලෙවිය, තොරතුරු ලබාදීමේ කාර්යයන්ද බුදුරුවගල, මාලිගාවිල ස්ථාන ගත තොරතුරු මධ්‍යස්ථානවලින් ලබා ගැනීමට අවශ්‍ය කාර්යය සකසා ඇත.

මෙම වසර කිහිපය තුළම යෝජිත යුධගනාව දාගැබ සංරක්ෂණය, හැබැස්ස දාගැබ, මුතුමාල ස්තූපය (හම්බෙගමුව) සංරක්ෂණ කාර්යය දියත් කර සිදුකරමින් ඇත.



ඒ අතරින් සියඹලාණ්ඩුව මාණාහාරණ විහාරස්ථාන භූමියේ සංරක්ෂණ හා ප්‍රාකාර (ශෛලමය) බැම්මේ සංරක්ෂණ අර්ධයක් පමණ අවසන් කර ඇත. එමෙන්ම හම්බෙගමුව ස්තූප සංරක්ෂණ 2018 වසරේ ආරම්භ කර කාර්යය සිදුකරමින් ඇත. හැබැස්ස ස්තූප හා මළුව සංරක්ෂණ 2019 වසර අවසන් කිරීමට යෝජිතව ඇත.

ප්‍රවර්ධන වැඩ සටහන් 2016 වසර සිටම 2019 වසර තුළත් එම කාර්යයන් දියත් කර ඇත. පාසල් ළමයින් හා ගුරු භවතුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් නිලධාරී දැනුවත් කිරීම, ග්‍රාම නිලධාරී දැනුවත් කිරීම් හරහා ඔවුන්ගේ සහාය ලබාගැනීමේ වැඩසටහන් දියත් කර ඇත.

**නවරත්න බී. කරව්ගහංග**
සහකාර අධ්‍යක්ෂ
මොණරාගල දිස්ත්‍රික්කය

# හම්බන්තොට දිස්ත්‍රික්කය

කසාගල පුරාවිද්‍යා කෞතුකාගාරය නඩත්තු කිරීම

කසාගල පුරාවිද්‍යා කෞතුකාගාරයේත් යටගල කෞතුකාගාරයේත් නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව පුරාවිද්‍යා කලාප කාර්යාලයන්හි නඩත්තු කිරීම, උපකරණ අලුත්වැඩියාව සිදුකරන ලදී. ඒ අනුව, කටුවන, කසාගල, හම්බන්තොට, යටාල





කලාපයන්හි ඉහත කාර්යයන් ඉටු කරන ලදී.

යටාල කලාප කාර්යාලය හා කෞතුකාගාරය දිවා රාත්‍රී මුර රාජකාරී ඉටු කිරීම, දෙබරවැවවත්ත, යටාල දාගැබ් මළුව, පිටත මළු, ජලජ පැළෑටි ගලවා යටාල කෞතුකාගාරය පිටත පරිශ්‍රය, අකුරුගොඩ ඉගිනිගහවත්ත දෛනිකව නඩත්තු කර පවත්වාගෙන යාම, දෙව්රම්වෙහෙර වැඩබිම දෛනිකව නඩත්තු කර පවත්වාගෙන යාම, නැදිගම්විල රක්ෂිතය වර්ෂයකට තෙවරක් නඩත්තු කිරීම හා වල් නාශක යොදා ස්තූපය මත වැවී ඇති වල් පැළෑටි මර්ධනය කිරීම, අංජිලීගල පුරාවිද්‍යා ස්ථානයේ වර්ෂයකට දෙවරක් නඩත්තු කර පවත්වාගෙන යාම, නිමලව පුරාවිද්‍යා වැඩබිම වර්ෂයකට දෙවරක් නඩත්තු කර පවත්වාගෙන යාම සිදුකරන ලදී.

හම්බන්තොට ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මගින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි තෝරා ගත් පාසල් 34ක මෙරට පුරාවිද්‍යා උරුමය හා පුරාවිද්‍යා නීතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන සිදු කරන ලදී. එහි දී ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් පුරාවස්තු හා පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක ආරක්‍ෂා කර ගැනීම සහ ඒවායේ පෞරාණික වටිනාකම පිළිබඳව දැනුවත් කිරීම අපේක්ෂාව විය.

මීට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදලයේ ප්‍රතිපාදන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ස්ථාන රැසක නඩත්තු, සංරක්‍ෂණ ආදී කටයුතු සිදු කරන ලදී.

ඒ යටතේ වෙහෙරගල හා ඔරුකොටිගල මූලික පුරාවිද්‍යා ගවේෂණයත්, නෙලුල්ල සහ දෙව්රම් වෙහෙර මායිම් කණු සිටුවීමත්, වලස්මුල්ල කණුමුල්දෙණියේ ගල්ටැම්ගොඩ විහාරගෙය සංරක්‍ෂණයත්, කොටපාර රජමහා විහාරයේ සංඝාවාසය සංරක්‍ෂණයත්, සිත්තම්ගල්ලෙන රජමහා විහරයේ දෙවන මළුවේ බුදු මැදුරේ වහලය සංරක්‍ෂණයත්, රන්න රැකව ජයමහා විහාරයේ ධර්මශාලාව සංරක්‍ෂණයත්, තිස්සමහාරාම පුංචි අකුරුගොඩ හානි බලපෑම් ඇගයීම් කැණීමත්, මාටෙලෝකුළුණ පරිශ්‍රයේ ඇති දිසාපති තිල නිවසේ තාප්පය සැකසීමත්, කරඹගල ආරණ්‍ය සේනාසනය කෘතිය මුද්‍රණය කිරීමත්, අත්තනගල ශ්‍රී මහා විහාරයේ පුරාවිද්‍යා හානි ඇගයීම් කැණීමත් කැපී පෙනේ.

**වසන්ති අලහකෝන්**
සහකාර අධ්‍යක්‍ෂ
(හම්බන්තොට / ගාල්ල / මාතර)

## රත්නපුර දිස්ත්‍රික්කය

ප්‍රාග් ඓතිහාසික යුගයේ පුරාවිද්‍යාත්මක දත්ත ඔස්සේ ලෝකයට ශ්‍රී ලාංකීය අභිමානය එක්කළ සුවිශේෂ ස්ථානයක් රත්නපුර දිස්ත්‍රික්කයට හිමි වේ. බටදොඹලෙන,මානෙල්ලෙන, බෙලිගල්ලෙන, බටතොටලෙන, ආදී ප්‍රාග් ඓතිහාසික ස්ථාන මෙන්ම බලංගොඩ මානව සංස්කෘතිය ලෝකයට ගෙනගිය සාධක සහිත ප්‍රදේශ මෙන්ම රත්නපුර ප්‍රදේශය අනුරාධපුර අවධියේ සිට ක්‍රමිකව විකාශය වූ ආරාම සංකීර්ණ සහිතව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත් කමකින් යුක්ත ප්‍රදේශයකි.

අතීත උරුමය මතු පරපුරට දායාද කරමින් පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගනු



වස් සබරගමු පළාතේ රත්නපුර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය 2018 වර්ෂයේ ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවන ලද අතර එම ව්‍යාපෘති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන මතින් ක්‍රියාවට නංවන ලදී. මෙම ව්‍යාපෘතීන් කාර්යාලීය එක් එක් අංශය වන ගවේෂණ හා ලේඛන ගත කිරීම් අංශය, වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය, රසායන සංරක්ෂණ අංශය, කෞතුකාගාර අංශය, නඩත්තු අංශය, අභිලේඛන හා නානක විද්‍යා අංශය හා ප්‍රවර්ධන අංශ මගින් සාර්ථකව මේ වසරේ ක්‍රියාත්මක කරන ලදී.

රත්නපුර දිස්ත්‍රික්කයේ චංචල පුරාවස්තු ලේඛන ගත කිරීමේ ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක වූ තෙප්පනාවමන නන්දනාරාම විහාරයේ පුරාවස්තු ලේඛන ගත කිරීම 2017 වර්ෂයේ ආරම්භ කරන ලද අතර අවසන් අදියරේ කටයුතු 2018 වර්ෂයේ සිදුකරන ලදී. ඒ යටතේ පුස්කොළ පොත් 10 ක් ද, බුදු පිළිම 02 ක් ද, කෙණ්ඩි 01 ද ලේඛන ගත ය. කොට්ටිඹුල්වල රජමහා විහාරයේ පුරාවස්තු 14 ක් හා සබරගමුව මහ සමන් දේවාලයේ කාසි 167 ක් ද මැටි කොත් 02 ක් ද ලේඛන ගත කිරීම් පමණක් මේ වසරේ ක්‍රියාත්මක විය. මීට අමතරව ගවේෂණ අංශය මගින් බුදුගල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම ආශ්‍රිත ගවේෂණය හා පිළිම ඇද්දආර උඩවලව රක්ෂිතයට අයත් නටබුන් භූමිය ගවේෂණයට යෝජනා කර තිබුන ද නොවැළැක්විය හැකි හේතුවක් නිසාවෙන් එම ගවේෂණ සිදුකිරීමට නොහැකි වූ නමුත් ඉදිරි වර්ෂයේ දී එම කටයුතු සිදුකිරීමට නියමිතව ඇත. එමෙන්ම මහජනතාව විසින් හා රජයේ ආයතන මගින් කරන ලද ඉල්ලීම් මත ස්ථාන පරීක්ෂණ 30 ක් මේ වසරේදී සිදුවිය. අනවසර කැණීම් පිළිබඳව පරීක්ෂා කිරීම් 15 ක් හා ඛනිජ නිස්සාරණ බලපත්‍ර ලබා දීමට ස්ථානීය පරීක්ෂාවන් 173 ක් අප කාර්යාලය මගින් සිදුවිය. 2018 වර්ෂයේ සිට ගවේෂණ අංශයට අයත් ඒකකය මගින් රත්නපුර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ස්ථාන භූ ගෝලීය දත්ත ක්‍රමාංකනය ලබාගෙන සිතියම් ගත කිරීමේ කටයුතු කරගෙන යනු ලබයි.



වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය මගින් අටකලංපන්න වෙහෙරගොඩ පුරාණ විහාරයේ පැති බැම්ම ප්‍රතිසංස්කරණ කිරීමේ කටයුතු ක්‍රියාවට නැංවීමට යොදා ඇති අතර විශේෂ ව්‍යාපෘතියක් ලෙස වෙහෙරගොඩැල්ල දාගැබ සංරක්ෂණය කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත. අම්මඩුව කතරගම දේවාලයේ සංරක්ෂණ කටයුතු ද මේ වසරේ සිදුකළ අතර ඇඹිලිපිටිය ප්‍රදේශයේ උඩගම දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය මේ වසරේ සිදුවෙමින් පවතින ව්‍යාපෘතියකි.

පාසල් ළමුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ විෂය සමගාමී මාතෘකා පාදක කර ගනිමින් විශේෂ දේශන කිහිපයක් ද මේ වසරේ සංවිධානය විය.

නඩත්තු අංශය මගින් මේ වසරේ රත්නපුර පුරාවිද්‍යා කාර්යාලයට අයත් රත්නපුර කලාපය, මඩුවන්වෙල කලාපය, බුදුගල කලාපය යන කලාප තුනෙහි නඩත්තු කටයුතු සිදුකරන ලද අතර මඩුවන්වෙල වලව්වේ පාදම්වල වැලි ඇතිරීම් කටයුතු කිරීම මේ වසරේ සිදුවිය.

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත ස්ථාන පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ක්‍රියාවට නැංවීමට යෙදුණු අත්පත්‍රිකා සැකසීම අප කාර්යාලය මගින් මෙම වසරේ ද සිදුවිය. ඒ අනුව මඩුවන්වෙල වලව්ව, බුදුගල පුරාවිද්‍යා ස්ථානය, ඇහැලේපොළ වලව්ව හා අන්තඃපුර මාලිගය, රත්නපුර ඕලන්ද කොටුව, කූරගල පුරාවිද්‍යා ස්ථානය යන ස්ථානයන්හි තොරතුරු ඇතුළත් කරමින් එම අත්පත්‍රිකා සකස් විය.

රසායන අංශය මගින් මේ වසරේ ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති ලෙස මඩුවන්වෙල වලව්ව තොරණ සංරක්ෂණය මේ වසරේ ක්‍රියාත්මක විය. ඒ අනුව දීර්ඝ කාලීනව වර්ෂාවට හා හිරු එළියට නිරාවරණය වූ තොරණ මතුපිට ස්ථරය බොහෝ සෙයින් දුර්වල වී තිබූ නිසා ඇල්ගී වර්ධනය හේතුවෙන් බදාම ස්ථරය දුර්වල වූ තැන්වල තනුක කරන ලද පොලිකර් භාවිතා කර ඇල්ගී ඉවත්කොට සකසාගත් බදාම මිශ්‍රණ භාවිතා කර පළුදු සැකසීම සිදුවිය. ගිලීමලේ රන්කොත් රජමහා විහාරයේ ද ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව, මකර තොරණ සහිත ඉදිරිපස බිත්තිය, සමන් දේවාලය හා විෂ්ණු දේවාලයෙහි රසායන සංරක්ෂණ කටයුතු සිදුකරන ලදී.

ඒ.ඊ.එල්. තිලකවර්ධන
සහකාර අධ්‍යක්ෂ
රත්නපුර.

# කෑගල්ල දිස්ත්‍රික්කය

කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා 2018 වර්ෂයේදීද වෙනත් වර්ෂවලදී මෙන්ම ව්‍යාපෘති රාශියක්ම එක් එක් අංශවලට අදාළව ඉටු කරන ලදී. මේ සඳහා භාණ්ඩාගාරයෙන් ලැබෙන වාර්ෂික ප්‍රතිපාදන, මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබෙන ප්‍රතිපාදන සහ වෙනත් ආයතන මගින් ලැබෙන ප්‍රතිපාදන යොදවන ලදී.

ගවේෂණ අංශය යටතේ ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු සඳහා රු. 200,000.00 ප්‍රතිපාදන වෙන්ව තිබූ අතර, එයින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ඛනිජ සංරක්ෂණ කටයුතු, අනවසර කැණීම් ස්ථාන පරීක්ෂාව, පසුවිපරම් කටයුතු, හදිසි ඉල්ලීම් අනුව සිදු කරන ලද ස්ථාන පරීක්ෂා කිරීම් ආදී සියල්ල සිදු කරන ලදී. ඒ අනුව රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා විවිධ පුද්ගලයින් විසින් ඉල්ලුම් කරන ලද සියලු ස්ථාන පරීක්ෂා කිරීම් සිදු කරන ලද අතර, මීට අමතරව දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හබුංකඩුව පුරාවිද්‍යා පරිශ්‍රයේ හදිසි ගවේෂණයක් ද සිදු කරන ලදී. එසේම GIS ඒකකය මගින් කෑගල්ල දිස්ත්‍රික්කයට අදාළ පුරාවිද්‍යා ස්ථාන 60ක ස්ථානීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මෙහෙයවීමෙන් NSDI වෙබ් අඩවිය මගින් අන්තර්ජාලයේ ප්‍රකාශයට පත් කරන ලදී.

කෑගල්ල දැදිගම කෞතුකාගාරය පවත්වාගෙන යාම සඳහා වෙන්ව තිබූ රු. 100,000.00 ක මුදලින් දැදිගම කෞතුකාගාරයේ පවත්වාගෙන යාමේ කටයුතු සිදු කරන ලදී. මේ යටතේ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ වෙනත් අලුත්වැඩියාවන් සිදු කරන ලදී.

කෑගල්ල දිස්ත්‍රික්කයේ පැරණි ප්‍රතිමා සහ සිතුවම් රසායන සංරක්ෂණය සඳහා යටිදොළ පහල විහාරයේ සිතුවම් සංරක්ෂණය, ඇත්නාවල ශ්‍රී පුෂ්පාරාම විහාරය, සිතුවම් සංරක්ෂණය යන ව්‍යාපෘති අනුමතව තිබූ අතර, එම කාර්යයන් සාර්ථකව අවසන් කරන ලදී. එම ප්‍රතිපාදන යටතේ හදිසි සංරක්ෂණයක් වූ මාකූර පුරාණ විහාරයේ ප්‍රතිමා සංරක්ෂණය අවසන් කරන ලදී.



නඩත්තු අංශය යටතේ ව්‍යාපෘති 18ක් සිදුකරන ලද අතර සියලු ව්‍යාපෘති 100%ක ප්‍රගතියක් අත්කර ගත් අතර, එයින් කලාප 04ක් පවත්වාගෙන යාමට අමතරව එක් එක් කලාපයේ සිදුකළ යුතු හදිසි නඩත්තු කටයුතු සිදුකරන ලදී.


වාකිරිගල අම්බලම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් වාස්තුවිද්‍යා සරක්ෂණය කටයුතු සිදු කරන ලද අතර, දීර්ඝ කාලයකින් තහවුරු කිරීමක් සිදුව නොතිබුණි. ඒ අනුව වහලයේ දිරාගිය දැව කොටස් හා නව උළු යොදා නඩත්තු කිරීම් මේ වන විට සාර්ථකව අවසන් කර ඇත.

අලවතුර ගණේගොඩ විහාරය කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි පුරාවිද්‍යා ස්ථාන අතුරින් ගල් කැටයම් බහුල පුරාණ විහාරයකි.

මෙම විහාරය සඳහා පිවිසීමට ඇති ගල් පඩිපෙල වර්ෂා ජලය බැසයාම හේතුවෙන් ඛාදනයට ලක්ව තිබූ අතර, එම කොටස් තහවුරු කිරීම අවසන් ය.

මහ බෙලිගල පුරාවිද්‍යා රක්ෂිතයේ පිහිටි පුරාවිද්‍යා ස්මාරක අතුරින් බොහෝ ස්මාරක මෙතෙක් කැණීම්, සංරක්ෂණ හා තහවුරු කිරීම්වලට ලක්ව නැත. ඒ අනුව නිශ්චිතව උපයෝගීතාව පැහැදිලි නැති ගොඩනැගිල්ලක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය පාදාගැනීමේ කටයුතු 2018 වසරේ දී අවසන් කළ අතර එම ගොඩනැගිල්ල 2019 වසරේ දී සංරක්ෂණය කිරීමට නියමිතය.

කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක හා මාවනැල්ල ප්‍රා. ලේ. කොට්ඨාස ඇතුළත් කලාපයෙහි ප්‍රධාන පුරාවිද්‍යා වැඩබිමක් වශයෙන් පවත්වාගෙන යන දනගිරිගල පුරාවිද්‍යා ස්ථානයේ රාජකාරි කටයුතු





ඉටුකිරීමට හා කාර්ය මණ්ඩලයට කාර්යාල කටයුතු කිරීමට ස්ථිර ගොඩනැගිල්ලක් නොවූ අතර, එම අවශ්‍යතාව සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු සාර්ථකව අවසන් කරන ලදී.

පාසල් 04ක සිසුන් සඳහා පුරාවිද්‍යාව, ජාතික උරුමය, පැරණි කලාව විද්‍යාව හා තාක්‍ෂණය යන මැයෙන් දේශන පවත්වන ලදී, මීට අමතරව කාර්ය මණ්ඩලය සඳහා පුරාවිද්‍යා කටයුතු සම්බන්ධයෙන් ද දේශන පවත්වන ලදී. මීට අමතරව මෙම අංශය යටතේ කෑගල්ල දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාලය සඳහා පුස්තකාලයක් පිහිටුවීම සිදුකරන ලද අතර ඒ සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන් සහභාගි කරගනිමින් පුරාවස්තු ආඥාපනත පිළිබඳ දේශනයක් සිදු කරන ලදී.

මධ්‍යම සංස්කෘතික අරමුදල් ව්‍යාපෘති අනුව රුවන්වැල්ල ජුබිලි අම්බලම, මාම්පිට විහාරයේ ආවාසගෙය ටෙරාකොටා බිම්ගල් ඇල්ලීම, බෙලිගල රජමහා විහාරයේ සිවිලිම සංරක්‍ෂණය, අම්බුළුගල ශ්‍රී දන්තපාය මෝරාගම්මන සංඝාවාසයේ සංරක්‍ෂණ වැඩ අවසන් කරන ලදී.

**එච්. බී. ඒ. කේ. තිල්මල්ගොඩ**
සහකාර අධ්‍යක්‍ෂ (කෑගල්ල)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
සීතාවක, අවිස්සාවේල්ල

## බස්නාහිර පළාත

පුරාවිද්‍යා උරුමයන් ආරක්‍ෂා කර පවත්වා ගෙන යාමේ ජාතික කර්තව්‍ය වෙනුවෙන් කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්ක කේන්ද්‍රකර ගනිමින් බස්නාහිර පළාත් පුරාවිද්‍යා කාර්යාලය මගින් ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය. වාර්ෂිකව වෙන්කරනු ලබන භාණ්ඩාගාර ප්‍රතිපාදන හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන, වෙනත් බාහිර ආයතන ප්‍රතිපාදන මත ව්‍යාපෘති සිදුකරනු ලබයි. ඒ අනුව, ගවේෂණ, කැණීම්, වාස්තු විද්‍යා සංරක්ෂණ, නඩත්තු හා ප්‍රවර්ධන යන අංශයන් විසින් පුරාවිද්‍යා කටයුතු සිදුකරනු ලබයි.





2018 වසරේ බස්නාහිර පළාත් පුරාවිද්‍යා කාර්යාලයේ ගවේෂණ අංශය මගින් ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඉන් දෛනික ස්ථාන පරීක්ෂා කිරීම් යටතේ වසර පුරා බස්නාහිර පළාතේ මහ ජනතාව, රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි ඉල්ලීම පරිදි නිර්දේශ ලබාදීම සිදුකරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වාර්ෂිකව සිදුකර ගෙන පැමිණි ගවේෂණ ව්‍යාපෘති ඉදිරියටම සිදුකර ගෙන යාමේ අරමුණු ඇතිව 2018 වර්ෂයේ වෙන්කරන ලද ප්‍රතිපාදන තුළින් හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගවේෂණය කරන ලදී. අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගවේෂණය කිරීම ද සිදුකරන ලද අතර, අධික වර්ෂාව හේතුවෙන් තාවකාලිකව නතර කිරීමට සිදුවිය.

කැණීම් අංශය විසින් ද මීගමුව කොටුපවුරේ සංරක්ෂණ ව්‍යාපෘතියට සමගාමීව කැණීම් කටයුතු මෙහෙයවන ලදී. මීගමුව කොටුවේ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් ලක්ෂණ හඳුනාගැනීමේ අරමුණින් මෙම කැණීම් ව්‍යාපෘතිය ද සිදුකරනු ලැබිණි. මෙය 2018.04.02 දින ආරම්භ කළ අතර 2018.07.06 දින අවසන් කරන ලදී. එම කැණීම් කටයුතු තුළින් පාංශු ස්තරායනය හඳුනා ගනිමින් ආරක්ෂිත බලකොටුව ඉදිකිරීමේ අවධි හඳුනා ගැනීම මෙහි දී සිදුකරන ලදී. මෙයට අමතරව කෝට්ටේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට සමගාමීව කොටුබැම්ම පාදා ගැනීමේ අරමුණින් කැණීම් ස්ථාන කිහිපයක් සිදුකරන ලදී.

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පුරාවිද්‍යා කළාප කාර්යාල හයක් මගින් පුරාවිද්‍යා ස්ථාන නඩත්තු කර පවත්වා ගෙනයනු ලබයි. ඒ අතර කෝට්ටේ කෞතුකාගාරය ද නඩත්තු කිරීම ද වෙයි. ඒ අනුව වාර්ෂිකව ස්ථාන නඩත්තු කර පවත්වා ගෙනයාමේ ඇස්තමේන්තු තුළින් පුරාවිද්‍යා ස්ථාන නඩත්තු කටයුතු සිදුකරන ලදී. ඒවා භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් සිදුකරන ලදී. තවද පිළිකුත්තුව පුරාවිද්‍යා ස්ථානය නඩත්තු කර පවත්වා ගෙනයාම, හැවනිවල ශ්‍රී විවේකාරම පුරාණ විහාරයේ නඩත්තු කටයුතු, අත්තනගල්ල විහාරයේ නඩත්තු කටයුතු, අස්ගිරිය විහාරයේ සෙල් ලිපි ආවරණයක් ඉදිකිරීම, නාගොඩ ඉසිපතනාරාමයේ නඩත්තු කටයුතු, පොකුණුවිට රජමහාවිහාරය, උග්ගල්බඩ මල්අස්නේ දේවාලය, බුලත්සිංහල දේවමිත්තාරාම විහාරය, ඈතගම සුමනාරාමය, පාහියංගල පුරාවිද්‍යා ස්ථානය, කොළඹ ඕල්කට් ගොඩනැගිල්ල, පිළිකුත්තුව ලෙන් විහාරය, වාද්දුව විවේකාරාමය ආදී ස්ථානවල නඩත්තු කටයුතු සිදුකරන ලදී.

2019 වසර තුළ වාස්තු විද්‍යා සංරක්ෂණ ව්‍යාපෘති යටතේ කිතුල්ගොඩ ගනේගොඩැල්ල පුරාණ විහාරයේ පිළිමගෙය, කෙසෙල්හේනාව රජමහා විහාරයේ පිළිමගෙය සංරක්ෂණය, වෙහෙරගලකන්ද පුරාණ විහාරයේ පිළිමගෙය සංරක්ෂණය, මොරගොල්ල ධම්මිකාරාමයේ පිළිමගෙය සංරක්ෂණය, කහඳුව රජමහා විහාරයේ පොහොයගෙය සංරක්ෂණය, පින්තුපිටිය කෝවිලේ වහලය සංරක්ෂණය, මීගමුව නිවුස්ටඩ් බාලිකා විද්‍යාලයේ මිෂන්හවුස් ගොඩනැගිල්ල සංරක්ෂණ කටයුතු සිදුකෙරෙමින් පවතී.

බස්නාහිර පළාතේ පුරාවිද්‍යා නඩත්තු ව්‍යාපෘති දෙස අවධානය යොමු කිරීමේ දී කෝට්ටේ පුරාවිද්‍යා රක්ෂිත සඳහා දැල්වැට යෙදීම, ඊ.ඩබ්. පෙරේරා වලව්වේ සිවිලිම අලුතින් යෙදීම හා වාද්දුව විවේකාරාමයේ නඩත්තු කටයුතු ද 2019 වසරේ දී සිදුකිරීම වැදගත් වෙයි.

කෞතුකාගාර අංශය යටතේ කෝට්ටේ කෞතුකාගාරය පවත්වාගෙන යාම, කෝට්ටේ කෞතුකාගාරයේ දෙවන මැදිරිය ප්‍රදර්ශන ප්‍රතිසංවිධානය ව්‍යාපෘති සිදුකෙරෙමින් පවතී.

බස්නාහිර පළාතේ ප්‍රවර්ධන අංශය මගින් පුරාවිද්‍යා සතියට සමගාමීව පොත් හා අත්පත්‍රිකා මුද්‍රණය, පාසැල් සිසුන් දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම ලෙස ව්‍යාපෘති කිහිපයක් සිදුකෙරෙමින් පවතින අතර, අභිලේඛණ හා නාණකවිද්‍යා අංශය යටතේ පුස්කොළ පොත් සුචිගත කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

**එම්.ඒ.එස්.ටී.කේ. මදුරප්පෙරුම**
සහකාර අධ්‍යක්‍ෂ (බස්නාහිර)

# නිල්ල පිරුණු කඳු ගැටයේ දෙව්යන්ගේ නිවහන

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හපුතලේ ප්‍රධාන බස්නැවතුම්පළට ඉහළින් නිල්ල පිරුණු කඳු ගැටයක් මත හපුතලේ ශාන්ත මාක්ස් දේවස්ථානය පිහිටා ඇත. මෙම දේවස්ථානයේ ඉතිහාසය ක්‍රි.ව. 19 වන සියවස තෙක් අතීතයට දිව යයි. වැවිලිකරුවන් ලෙස ශ්‍රී ලංකාවට පැමිණි බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් තම පවුල්වල සාමාජිකයන් සමඟ ජීවත් වීම සඳහා හපුතලේ, බණ්ඩාරවෙල, නුවරඑළිය ආදී ප්‍රදේශවල තමන්ගේ නිවෙස්ද ඉදිකරන ලදී. ඔවුහු වැඩි පිරිසක් කතෝලික ආගමික භක්තිකයන් වූහ. තම වාසභූමිවලට ආසන්නව ආගමික කටයුතු සිදුකිරීම සඳහා ඔවුන්ගේ කිතුණු දෙව්මැඳුරු තනා ගත්හ. වර්තමානයේ ද එම දෙව්මැඳුරු ජීවමාන තත්ත්වයෙන් පවතී.

මේ අතරින් 1869 සැප්තැම්බර් මස 19 වන දින ඉදිකරන ලද හපුතලේ ශාන්ත ඇන්ඩෘ දෙව්මැඳුර මිහිඳුම් සලු අතර සැඟව ගත් නිල්ල පිරුණු කඳු ගැටයක, අභිමානයෙන් වැජඹෙමින් කියාපාන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයෙන් අපට උරුම වී වර්තමානය තෙක් පැමිණි අතීත උරුමයක අපූර්වත්වය යි. මෙම ස්ථානය දෙස් විදෙස් සංචාරකයන්ගේ ද නොමඳ ආකර්ෂණය දිනා ගත් දෙව්මැඳුරකි.

අතීත උරුම ආරක්ෂා කර අනාගත පරපුරට දායාද කිරීමේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභිලාශය ඉටු කිරීම සඳහා 2002.11.22 දිනැති අංක 1264 දරණ ගැසට් පත්‍රයෙන් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස මෙය ගැසට් කර ප්‍රකාශයට පත්කර තිබේ.

මෙම දෙව්මැඳුරට ශාන්ත ඇන්ඩෘ යන





නාමය ලබා දී ඇත්තේ ජේසුතුමන්ගේ අනුගාමිකයෙකු වූ ඇන්ඩෘස්තුමාගේ නමිනි. "ශ්‍රද්ධවන්තයෙකු වූ ශාන්ත ඇන්ඩෘගේ දේවස්ථානය" යනු එහි අදහස යි.

පරිසරයේ සුන්දරත්වය විඳිමින් මෙම දෙව්මැඳුරේ ඉදිරිපිට පියගැට පෙළේ නගින විට ප්‍රධාන පුරාවිද්‍යා ස්මාරකය වන දෙව්මැඳුර අපගේ නෙත ගැටේ. මෙය පල දෙකේ වහළයක් සහිතව නිමවා ඇති අතර බ්‍රිතාන්‍ය පාලන සමයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට අනුව ඉදිකර වහළය ලී වලින් කලාත්මකව නිමවා තිබේ. වහළයේ පල දෙක එක්වන ස්ථානයේ ඉදිරිපස කුරුසයක් සවිකර ඇත.

දෙව්මැඳුරේ ප්‍රධාන ද්වාරය අසළට පිවිසි ශාලාව අභ්‍යන්තරයේ ප්‍රධාන දේව ප්‍රතිමාව හා ඒ පිටුපසින් ඇති ගොතික් කලාවෙන් හැඩ වූ අලංකාර කවුළු තුන දිස් වේ.

ගොතික් චිත්‍ර රොමේනියානු ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය ලබාගෙන පරිණාමයට පත් වූ කලා නිර්මාණයකි. 12 වන සියවසේ සිට 16 වන සියවස දක්වාම විශේෂයෙන් දේවස්ථාන හා පල්ලිවල වාස්තු විද්‍යාත්මක අලංකාරය සඳහා ගොතික් කලා කෘති භාවිතයට ගෙන ඇත. හපුතලේ ශාන්ත ඇන්ඩෘ දේවස්ථානයේ ඇති ගොතික් නිර්මාණ මේ සඳහා කදිම සාක්ෂියකි.

වර්ණවත් ආලෝකය ගොඩනැගිල්ල තුළට ඇතුළු කර ගැනීමේ වාස්තු විද්‍යාත්මක උපක්‍රමයක් වශයෙන් භාවිතා කර ඇත. මෙහි නිර්මාණය කර ඇති සිතුවම් මගින් නිරූපණය වන්නේ ජේසුස් වහන්සේ කුඩා ළමුන් කෙරෙහි දැක් වූ කරුණාව පිළිබඳව ය.

දෙව්මැඳුර පිහිටි බිමේ දැකිය හැකි අනෙක් ස්මාරක වර්ගය වන්නේ 19 වන සියවසේ කිරිගරුඬෙන් නිමවන ලද සොහොන් කොත් දැකිය හැකිය. දෙව්මැඳුර මැදිවන සේ ඒ වටා සොහොන් භූමිය නිමවා තිබේ. මෙම සොහොන් කොත් එවකට විසූ බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ හා පූජකවරුන්ගේ බව සැලකේ.

දෙව්මැඳුර වරින් වර අලුත්වැඩියා කිරීම් වලට භාජනය වී ඇතත් මුල්කාලීන වාස්තු විද්‍යා අංග වෙනස් නොකර ආරක්ෂිතව පවත්වා ගෙන යනු ලබයි.

දේවස්ථානයේ ඉදිරිපස මිදුලට හපුතලේ නගරය හා ඒ ආශ්‍රිත පරිසරය අලංකාරව දර්ශනය වේ.

දෙව්මැඳුර පිළිබඳ තොරතුරු රැස් කිරීමේ දී සහයෝගය ලබා දුන් බදුල්ල ශාන්ත මාකස් දේවස්ථානයේ ප්‍රධාන පූජකතුමන් වෙත හා ඡායා රූප ලබා ගැනීමේ දී නොමඳ සහයෝගය ලබා දුන් හපුතලේ ශාන්ත මාක්ස් දේවස්ථානයේ භාරකරු මෙහි දී කෘතවේදී ව සිහිපත් කරමි.

**රසාංජලී විජේසුන්දර**
ගවේෂණ සහකාර
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
බදුල්ල.

# ප්‍රාග් මානව ශිෂ්ටාචාරයේ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික



කෑගල්ල, රත්නපුරය, කළුතර යන දිස්ත්‍රික්ක මෙරට ප්‍රාග්ඓතිහාසික ලෙන් සංචිතයේ වැඩි වපසරියක් ආරක්ෂා කරමින් පර්යේෂණ අවශ්‍යතා සඳහා ප්‍රබල දායකත්වයක් ලබා දෙමින් සිටී.



එවන් පසුබිමක අදට වඩා හෙටට වටින උරුමයක් අපට ඇති බව බොහෝ දෙනෙක් විශ්වාස නොකරන්නේ ඒ පිළිබඳව වූ දැනුම ඔවුන් වෙත නිවැරදිව ගලා නොයන බැවින් බව අපගේ විශ්වාසයයි. සත්‍යය වශයෙන්ම අප ඉතිහාසය වෙනුවෙන් වූ කියවීම බොහෝ අලුත්විය යුතු කාලය එළඹ තිබේ. ඒ අතරින් පෘතුවි ඉතිහාසය, මානව ශිෂ්ටාචාරයේ ආරම්භය, විකාශනය, මානව ජීවිකාව, සංස්කෘතිය, සමාජ ක්‍රමය, යැපීම් ක්‍රමය, පිළිබඳව අප දන්නා සීමාව ඉතාම සීමිතය. එය හැදෑරීම සඳහා වෙන්කර ඇති ඉඩකඩ ද සීමිතය. නවීන මානව ශිෂ්ටාචාරයන්ගේ අතීතය වැඩිමනක් රැඳී ඇත්තේ ගල්ලෙන්වල රැඳි සාධක මතය. එම ගල්ලෙන් මත පවතින තොරතුරු දත්ත ගොනුවකට (Data Package) සමාන කළ හැකිය. සියලු දෙය ඒ තුළ රැඳී පවතියි. ලෝකයේ මානව ශිෂ්ටාචාරයන්ගේ වැඩිමනක් තොරතුරු හමුව ඇත්තේ මෙවන් ගල්ලෙන් වලිනි. මෙම ගල්ලෙන්වල මානව ඉතිහාසය, මානව යැපීම් ක්‍රම, පරිසරය, දේශගුණය, නියෝජනය කරන නිරවුල් පස් තට්ටු අතිවිශාල ප්‍රමාණයක් පර්යේෂණ වලදී අනාවරණය වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක පුරාවිද්‍යා හානි ඇගයුම් සිදුකිරීමේ දී ජාතික හා ප්‍රාග්ඓතිහාසික වශයෙන් වැදගත් ලෙන් සංකීර්ණ 04 ක් වෙත අවධානය යොමුකිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. එම ලෙන් සංකීර්ණ නම්, නෙළුම්දෙණිය, පලපොලුව, මාම්පිටිය ප්‍රාග් ඓතිහාසික බඹරගල ලෙන් සංකීරණය, බෙලින්කන්ද ප්‍රාග්ඓතිහාසික ලෙන් ගුහා සංකීර්ණය ලෙස හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ගල්ලෙන්වල දැනට පවතින මුල් පරිසර තත්ත්වය එක මීටකට ගතහොත් ප්‍රමාණය අක්කර 02 ක උපරිමයකට සීමාව පවතී. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික තොතරතුරුවල විශිෂ්ටතම සොයාගැනීම් සියල්ලක්ම රැඳී ඇත්තේ මෙම සීමා සහිත ගල්ලෙන්වලය. එළිමහන් හෝ විවෘත ප්‍රාග්මානව ජනාවාසයන්හි ඓතිහාසිකත්වය තනි අවධියක් හෝ සීමිත කාල පරාසයක් දක්වා සීමිතව පවතින බවක් දැකගත හැකිය. එළිමහන් හෝ විවෘත ජනාවාසයන්හි පස් තැම්පතු ඉතා ඉක්මනින් විනාශයට පත්වීම මෙන්ම

# සැබෑ පිළිබිඹුව ගල්ලෙණ..!



හායනයට පත්වීම ද වේගවත්ය. පුරාවස්තු හමුවීම ද අවම වන අතර පුරාවිද්‍යාත්මක වටිනාකම ද අවම වේ. එහෙත් ගල්ලෙන්වල තත්ත්වය මීට හාත්පසින්ම වෙනස් තත්ත්වයක් දැකගත හැකිය. ගල්ලෙන්වල අවධි ගණනාවක් මෙන්ම අවුරුදු ගණනාවක තොරතුරු අඛණ්ඩව පෙළ ගැසීම විශේෂත්වයකි.

## ප්‍රාග්ඓතිහාසික ගල්ලෙන් පිළිබඳව ආචාර්ය නිමල් පෙරේරා මහතාගේ අදහස්

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ප්‍රාග්ඓතිහාසික ගල්ලෙන් පිළිබඳව මෙතෙක් ශ්‍රී ලංකාවෙන් බිහිවූ විශිෂ්ට ප්‍රාග්ඓතිහාසික පුරාවිද්‍යාඥයෙකු වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ දැනට ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්ව විද්‍යාලයේ ගෞරව සම්මානිත ආචාර්ය නිමල් පෙරේරා මහතා ප්‍රාග් ඓතිහාසික ලෙන් පිළිබඳව මෙවැනි අදහසක් දරයි.

"දැනට ලෝක ප්‍රාග් ඉතිහාසයේ වැදගත් සොයා ගැනීම් අපට ලැබෙන්නේ ගල්ලෙන් තැම්පත් මගින්. ගල්ලෙන්හි පාංශු තැම්පත් එළිමහන් ජනාවාසවලට වඩා විධිමත් හා නිරවුල් සාධක පෙළ ගස්සනවා. එමෙන්ම ගල්ලෙන් තැම්පත් විතැන්වීම අඩු නිසා විශාල හා දිගුකාලීන නිරවුල් පස් තට්ටු ප්‍රමාණයක් ලැබෙනවා. මේ දක්වා ලෝක ප්‍රාග් ඉතිහාසයේ මානව පරිණාමය, මානව සංස්කෘතිය පිළිබඳව විශිෂ්ටතම සොයාගැනීම් සියල්ලක්ම ගල්ලෙන් ආශ්‍රිත සංදර්භයන්ගෙන් අනාවරණය වී ඇත.

මෙරට ප්‍රාග් ඉතිහාසයේ තොරතුරු සහිත මුල් සාධක වලින් 80% පමණ අපට ලැබී ඇත්තේ පහතරට තෙත් කලාපයේ ගල්ලෙන්වලින්. ඒ අනුව ගල්ලෙන් මඟින් අනාවරණය වෙන තොරතුරු ඉතාම විශිෂ්ටයි. දකුණු ආසියාවේ ජීවත්වූ නූතන මානවයාගේ (හෝමෝ සේපියන්) ආදිතම ජනාවාසයන් වාර්තා වෙන්නේ ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයෙන්. එම ගල්ලෙන් කළුතර, කෑගල්ල, ගම්පහ හා රත්නපුරය දිස්ත්‍රික්කයන්ට සීමා වෙනවා. ප්ලයිස්ටෝසීන අවධියේ අවසානයේ එනම් අදින් වසර 50000 සීමාවේ සිට මධ්‍ය හොලෝසීනයේ අවසන් සීමාව තෙක් නිරවුල් තොරතුරු මෙම ලෙන් මඟින් හෙලිදරව් වීම ඉතාම විශේෂයි.

දකුණු ආසියාවේ ජීවත්වූ නවීන මානවයාගේ පෞරාණිකම සංස්කෘතික තොරතුරු මෙන්ම අතීත පරිසරයට අනුගතවූ මානවයාගේ යැපීම් ක්‍රමය, ජීවන රටාව, මිනිසුන්ගේ සංස්කෘතිය, අභිචාර, මලවුන් පිදීම, ප්‍රාග්ඓතිහාසික කලාව, ආදින්ගේ නිරවුල් තොරතුරු මෙමගින් හෙලිදරව් වේ. මෙම සාධක දැනටමත් බොහෝ සේ විනාශයට පත්වෙමින් පවතිනවා. විශේෂයෙන්ම ගල්ලෙන් මඟින් තොරතුරු ලැබෙන මෑත කාලීන පස් තට්ටු විනාශයට පත්වීමෙන් ගල් යුගයෙන් පසුව උදාවන පූර්ව ඓතිහාසික යකඩ යුගයත් ගල් යුගයත් අතර ඇති පරිවර්තීය අවධිය සොයා සිදු කරන පර්යේෂණයන්ට ඉතාම විශාල බාධාවක්. ගල් යුගයේ මිනිසුන් කෙසේද යකඩ යුගයට පරිවර්තනය වුනේ යන්න සොයා බලන පස් තට්ටු දැනටමත් විනාශවී හමාරයි. 19 වැනි සියවසේ වතු වගාව නිසා ගල්ලෙන්හි මතුපිට පස් තට්ටු පොහොර සඳහා ඇද දැමීමත්, ඓතිහාසික යුගයේ භික්ෂූන් වහන්සේලාගේ භාවිතය සඳහා මතුපිට පස් තට්ටු වැඩි ප්‍රමාණයක් නොදැනුවත්කමින් ඇද දැමීමත් නිසා විනාශයට පත්ව ඇත.

ඉතිරිය 28 වන පිටුවට

**එච්. එම්. එස්. කේ. ඇරැවගම**
පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරි (ප්‍රවර්ධන)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
සීතාවක.

# ශ්‍රී ලංකාවේ පුරාණ වාරි කර්මාන්තය සමග බැඳුණු සංස්කෘතික මුහුණුවර



පරිසරයේ පැවති දුෂ්කරතා මඟහරවා ගනිමින් පැවති සම්පත් උපයෝගී කර ගෙන ගමකට ඉදිකරන ලද ගම් වැව ගමේ වැසියන්ගේ කුසගින්න නිවීමට බත සපයන, නෑමට, බීමට වැනි වෙනත් අවශ්‍යතා සඳහා දියවර සපයන ජල ගබඩාවක් විය. වර්තමානයේ එතරම් බල නොපැවැත්වුවත් අතීතයේදී සිය අවශ්‍යතා නිසි කලට සපුරන මෙම සම්පත කෙරෙහි ගැමියන් තුළ පැවතියේ ගෞරවයකි. භක්තියකි. වැවයි දාගැබයි ගමයි පන්සලයි සංකල්පය අනුව නිරන්තරයෙන් ඔවුහු ක්‍රියා කළහ. මේ අනුව වැව, ගැමියන්ගේ, ගමේ, ජන ජීවිතයේ, සංස්කෘතියේ ප්‍රධාන අංගය බවට පත්විය. වැව ගහට පොත්ත සේ යළි වෙන් කළ නොහැකි ආකාරයට ජන ජීවිතය සමඟ බන්ධනය විය. ඒ අනුව ජන ජීවිතයේ සෑම අංශයක් කෙරෙහි ම වැව තීරණාත්මක සාධකයක් විය. මේ අනුව ඔවුන්ගේ සිරිත් විරිත්, කෑම බීම, භාෂාව, ඇදහිලි හා විශ්වාස, ජීවනෝපාය මාර්ගය ආදී සෑම අංගයක් සඳහා ම වැව නැතිවම බැරි අංගයක් විය.

වසර දෙදහසකට අධික කාලයක් පැවති බෞද්ධ සංස්කෘතියක් ලංකාවේ වියළි කලාපයේ පැවතිණ. බෞද්ධ සංස්කෘතිය සමඟ බැඳුණු සංස්කෘතික චින්තාවක් තිබේ. සංස්කෘතික චින්තනය හෙවත් සංස්කෘතිකව මිනිසුන් හිතන ආකාරය සිතිය යුතු ආකාරය නොවේ. වැවක හෝ ජලාශයක පළමුවෙන්ම ගන්නා ජලය පැන් ලෙස බෝධීන් වහන්සේට පූජා කිරීම සංස්කෘතික සිතිවිල්ලකින් ඇති වන ක්‍රියාකාරකමකි. මිනිස්සු එවැනි ලෙස සිතන ආකාරය සංස්කෘතික සිතිවිල්ලකි. එවැනි සංස්කෘතික සිතිවිලිවල ආකාරයට සදාචාර ධර්ම රටකට බිහිවේ. කුඹුර සහ වැව සමඟ එකට ජීවත්වුණ සංස්කෘතිය සමඟ ගෞරවනීයව හැසුරුණු පන්සල සමඟ සමීප සම්බන්ධකම් තිබුණ සම්ප්‍රදායේ ජනතාවක් මෙරට බිහිවිය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි වැව් (වාපි) යනු හෙළ බෞද්ධ සංස්කෘතියෙහි විල් විය. විල්පත්තුව, විලච්චිය ආදී ගම් මෙන් ම විල සහ වැව යනුවෙන් අවසන් වන ගම් ද ලංකාවේ විවිධ පළාත්වල වෙයි. මුල් කාලීන ජනාවාසකරණයෙහි ලා මෙවැනි ග්‍රාමීය වැව්වල දායකත්වය ඉතා ඉහළ මට්ටමක පැවති බව හඳුනාගැනීමට පුළුවන. එවැනි ග්‍රාමීය වැව් ආශ්‍රිතව ජනාවාස බිහිවූ බවට පැහැදිලි සාක්ෂි පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් ද අනාවරණය කරගත හැකි ය. නැට්ටුක්කන්ද ලිපියේ සඳහන් "එරකපි" නම් ගම බිහිවීමට එරිකවාපි නම් වැවක් මුල්වී තිබීම, මිහින්තලේ ලිපියක දැක්වෙන "ලොණ වාපි" යන්න එකතුවී "ලොණපි" යනුවෙන් සඳහන් ස්ථාන නාමය සකස්වීම, හඳගල ලිපිය "අනුලපිවපි" යනුවෙන් සඳහන්වීම, මිහින්තලේ රාජගිරි කන්ද ලිපියක "උපලවි" (උපලිවවි) යනුවෙන් ග්‍රාම නාමයන් සඳහන් වීම මෙයට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

වාරි කර්මාන්තය හා බෞද්ධ සංස්කෘතිය අතර සම්බන්ධතාවය විමසීමේදී එය ලාංකේය අනන්‍යතාව ලොවම විදහා පාන ජල ශිෂ්ටාචාරයේ ප්‍රබල සලකුණකි. එයට හේතුවී ඇත්තේ මෙරට වාරි කර්මාන්තය ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිටම වර්ධනය වී ඇත්තේ බෞද්ධාගමික පසුබිමක් තුළ වීමය. විහාරස්ථානවලට වැව් අමුණු පූජා කිරීම පිළිබඳ තොරතුරු සමකාලීන සෙල්ලිපි සහ වංසකථා මූලාශ්‍රයන්ගෙන් අනාවරණය වීම මෙයට නිදසුනකි. මෙරට වාරි කර්මාන්තය පිළිබඳව සඳහන් සියළුම සෙල්ලිපි කිසියම් බෞද්ධාගමික අරමුණක් සඳහා කරන ලද ඒවා විය. මෙම ලිපි බෝහොමයක දැක්වෙන්නේ වැවක් ඇළ මාර්ගයක් හෝ වාරි මාර්ගයකින් ලබාගත් බදු ආදායමක් විහාරස්ථානයක් සඳහා පූජා කිරීම පිළිබඳ ව ය. ඒ අනුව මෙරට බුදුදහම සහ වාරි කර්මාන්තය අතර දැඩි සම්බන්ධතාවක් ආරම්භයේ සිටම පවතින බව පැහැදිලි ය. පළමු වරට විහාරයකට ආදායම් උපයන මාර්ග ලෙස වැව් පූජා කිරීමේ ව්‍යවහාරය ආරම්භ වන්නේ ලජ්ජතිස්ස රජුගේ නාවුල්පොත හා දුවේගල ශිලා ලිපිවලිනි. භාතික තිස්ස රජු විසින් මාමිනියා වැව, ගවරතිස්ස විහාරයට පූජා කොට ඇත. චන්ද්‍රමුඛසීව රජු මණිකාරගම නම් වැවක් කරවා එය ඉසුරුමුණි විහාරයට පූජාකළ බව මහාවංසයේ දැක්වේ. ගජබාහු රජු ගාමිණිතිස්ස වැව කරවා එහි ආදායම අභයගිරි විහාරයේ මහදන්වැට පැවැත්වීමට ලබාදී ඇත. සුභ රජු කහවණු 500 දී ගත් උප්පලදෝණික නම් වැවත් තවත් කහවණු 500 දී මඩ අස්කරවා එය ඒකද්වාරික නම් විහාරයට පූජාකළ බව විහාරගල සෙල්ලිපියේ සඳහන් වේ. වසභ රජු තම ප්‍රධාන වාරි මාර්ග ව්‍යාපෘතිය වූ



ඇළහැර ඇළෙන් බදු ගැනීමේ අයිතිය මුවෙල විහාරයට පවරා ඇත.

### වැව් පුද සිරිත් හා බැඳුනු බෞද්ධ සංස්කෘතිය

වැවට අදාළව පුරාණ ගම්වල පිරිස් ප්‍රධානම කාරණා දෙකක් උදෙසා සංවිධානගත විය. පළමුවැන්න වැවේ රාජකාරියයි. දෙවැන්න දේව කාරියයි. වැවේ රාජකාරියේ දී වැව, ඇළ කුඹුර වේල්ල, ආරක්‍ෂාව නඩත්තුව නිසි පරිදි මෙහෙය වීම යන කාරණා ප්‍රධාන වෙයි. වැවේ දේවකාරිය සංවිධාන ව්‍යුහයක් අනුව සිදු කර තිබේ. බෞද්ධ සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වූ මෙය පිටතින් බැලූවිට ගමේ වැව සම්බන්ධ වූ අභිචාරී කටයුතු විශ්වාසය හා බැඳී ඇත. වැවත්, ගොවි බිමත්, ගොවිතැනත්, ගොවිතැනට යොදා ගන්නා හරකා බානත්, ගොවිතැනේ යෙදෙන අයත්, ඔවුන්ගේ අඹුදරු පවුලත් ආරක්‍ෂා කරගෙන වැඩි අස්වැන්නක් ලබාගැනීම පුජාවන්ගෙන් බලාපොරොත්තු වන එකම පැතුමයි. වැවේ දේවකාරී ලෙස මුත්තා පොලේ තැබීම, බාර හාරවීම, මුට්ටි නැවුම් මංගල්ලාව කිරීම, පැන් පෙරහර, මහදාන, දුගී දන්දීම, අලුත් සහල් මංගල්ලාව, දැකුම් මංගල්ලාව ආදී කොටගත් කාර්යයන් රාශියක් ඇත. මේවා එකිනෙක සංවිධාන වීමේ ක්‍රමවේද, සිරිත්, රාශියක් ම පවතී. මේ සියලු කාරියන් ද වැවේ මුල් භාරකාරත්වය දරන ගමරාළ උන්දෑ පංගුකාර සභාවේ උදව්, සහභාගිත්වය ලබා ගනිමින් ඉටුකරනු ලැබීය.

වැව ගැන ඇති ජන කතා, ජන ප්‍රවාද හා කවි වැවේ ඓතිහාසිකත්වය මෙන්ම සෞන්දර්යාත්මක අගය පෙන්නුම් කරයි. වැව් බැඳි රටේ මිනිසා වැව සමඟ බද්ධ කරන නීති රීති පද්ධතිය වන්නේ ජනශ්‍රැතියයි.

වාරි කර්මාන්තය සමග ගොඩනැගෙන ජන විශ්වාස ආශ්‍රිත ව සැකසුණු දැනුම සම්භාරය ගැමියන්ගේ පරම්පරාව තුළ නිර්මාණාත්මක ව ඉදිරිපත් කර ඇත්තේ ජනශ්‍රැතියට තවත් සටහනක් එකතු කරමිනි.

ලංකා සමාජය තුළ ජන සිරිත් සහ සම්ප්‍රදායන් පිළිබඳ ව අධ්‍යනයේදී පැහැදිලි වන ප්‍රධානම කරුණ නම් ජනශ්‍රැතියෙන් බෝහෝ දේ වැවට නෑකම් කියන බවයි. ග්‍රාමීය සමාජ ව්‍යුහය පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වන්නේ ජනවහරේ පවතින ග්‍රාමීය සබඳතාව හුවා දක්වන වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි, කෙතරම් ව්‍යුහාත්මකව ගැලපුණා ද යන්නය.

අතීතයේදී වැව හා ගම අතර පැවතියේ අවියෝජනීය සම්බන්ධයකි. එය පිළිඹිබු කරන ප්‍රධාන සාධකයක් වන්නේ සංස්කෘතිය හා බැඳුණු ජනශ්‍රැතීන් ය. නමුත් වර්තමානය වනවිට සක්‍රීය මට්ටමේ පවතින වැවක් ආශ්‍රිත ව වුව ද අතීතයේදී වැව හා ගම අතර පැවති සම්බන්ධතාවය මෙන් සමීප බවක් නොපවතියි. වැව හා ගම අතර පැවති ආධ්‍යාත්මික සහ සංස්කෘතික බන්ධනය ගිලිහීයාම වැවේ පරිහානිය කෙරෙහි ද හේතුවන්නට ඇත. වියළි කලාපයේ බොහෝ වැව් ගම්මාන සම්බන්ධයෙන් ද මෙම තත්ත්වය එසේම දැකගත හැකි ය. ග්‍රාමීය ජන සමාජය ක්‍රමයෙන් සංකීර්ණ වීම තුළ වැව හා බැඳුණු සිරිත් විරිත්, තහංචි ආදිය හරිහැටි පිළනොපැදීම නිසා අභාවයට ගිය අතර ගම් වැව් කේන්ද්‍ර කරගත් වාරි සංස්කෘතිය තවදුරටත් පිළිසකර නොකිරීම නිසා ක්‍රමයෙන් විනාශයට පත්වෙමින් ඇත.

**මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි**
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලය

## මධ්‍ය වලව නිම්නයේ පූර්ව පුරාවිද්‍යා පර්යේෂණ

මධ්‍යම වලව දකුණු නිම්නය මෙරට ඉතිහාසයේ ඉහල ජන ව්‍යාප්තියක් තිබූ අතීත මානව හා සංස්කෘතික ලක්ෂණ සහිතවූ පුරාවිද්‍යාත්මක තොරතුරු සැඟව පවත්නා අති සංවේදී පරිසර කලාපයකින් සමන්විත භූ කලාපයකි. මධ්‍ය වලව දකුණු නිම්නය ආශ්‍රිතව සිදුකර ඇති පූර්ව පර්යේෂණ බොහෝ ප්‍රමාණයක තොරතුරු හමු නොවෙයි. බොහෝ දුරට මෙම කලාපය ආශ්‍රිතව එතරම් පර්යේෂණයන් සිදු වී නොමැති බව කරුණු අධ්‍යයනයේදී සනාථ වුවකි. 1960 - 1977 පමණ දක්වා යන වර්ෂවල පාලන වාර්තාවන්හි තරමක් දුරට මෙම කලාපයේ පුරාවස්තු සම්බන්ධව යම් යම් තොරතුරු සටහන් වී තිබේ.

කූරගල සම්බන්ධ පැරණි ගවේෂණ ගැන රත්නපුර දිස්ත්‍රික්කයේ හිටපු දිසාපතිවරුන්ගේ රාජකාරී දිනපොත් වල යම් යම් සටහන් දක්නට ලැබෙයි. 1910-02-12 දින ආර්. බී. හෙලින්ස් , 1911-01-12 දින ජී. කුක්සන්, 1914-03-26 දින ආර්. එක්න් කේග් සහ 1924-06-25 දින සී.එච්. කොලින්ස් යන මහතුන් කූරගල ට ගොස් ඇති අතර ස්ථානය සම්බන්ධ සටහන් තබා ඇත. මින් සී. එච්. කොලින්ස් මහතාගේ සංචාරය හා ඔහු විසින් කල්තොට, කූරගල ප්‍රදේශය ආශ්‍රිතව කරන ලද ගවේෂණය වැදගත් සටහනකි. එම ගවේෂණය අළලා 1932 වසරේ රාජකීය ආසියාතික සංගමයේ වාර්ෂික සඟරාවේ 85 කලාපයට (J.R.A. S. (CEYLON) Vol xxxii /85) THE ARCHAOLOGY OF THE SABARAG AMUWA BINTANNA නමින් පලකර ඇති ලිපිය විශේෂිත වේ. කූරගල ඇති පූර්ව බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන් ලිපි ඔහු විසින් සිංහලට ද පරිවර්තනය කර ඇත.

උක්ත ලිපියෙහි කොලින්ස් මහතා සිදුකළ ගවේෂණය මගින් ගල්පාය, බඹරගල ප්‍රදේශයේ තොරතුරු ද වාර්තා කර ඇත. බඹරගලින් පිටපත් කර ගන්නා ලද සෙල්ලිපි 3 ක් බෙල් මහතා වෙත යවන ලද බවද එම ලිපියේ දක්වා ඇත. බඹරගල ඇති සෙල්ලිපි 08 ක් ද 1965 වසරේ පිටපත් කර ඇති බව 1965/66 පාලන වාර්තාවේ දැක්වේ.

මධ්‍ය වලව නිම්නයේ දකුණු දිග ප්‍රදේශයේදී හමුවන සංඛපාල රජමහා විහාරය ආශ්‍රිතව පැරණි ගවේෂණ සම්බන්ධ තොරතුරු එතරම් දක්නට නොවෙතත්, මේ සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ හිටපු දිසාපතිවරුන් වෙත ජේ. ඩබ්. බර්ඩ් (J. W. Bird) (1864) ජී. එම්. බයර්ඩ් (G. M Bayerd) (1901) එච්. පාකර් (H. Paker) (1909) සී. එච්. කොලින්ස් (C. H. Colins) (1928-1933) යන පුද්ගලයින්ගේ දින සටහන්වල සුළු වශයෙන් තොරතුරු සඳහන් වේ. 1864-09-05 දින ජේ. ඩබ්ලිව් බර්ඩ් මහතා (J. W. Bird) විසින් සිය දින සටහනෙහි මෙසේ සඳහන් කර තිබේ.

''සංඛපාල නම් පැරණිම විහාරස්ථානයකට ගියෙමි. පැරණි (නාගරි) අක්ෂරයෙන් යුත් ලෙන් ලිපි දැකගන්නට හැකි වන අතර මෙම ස්ථානය විනාශ වෙමින් පවතී.''

1901-10-11 වන දින මෙම ස්ථානයට ගිය ජී.එම්. බයර්ඩ් (G. M Bayerd) මහතා මෙබඳු සටහනක් තබා ඇත.



''ගල් ගෙවල් ගාව පන්සලට පැමිණියෙමි. දොර ලෑල්ලේ කවි ලියා තිබෙනවා දැකගන්නට ලැබුණ අතර මෙම කවි ලියූ කතෘට රාජසිංහ රජතුමා විසින් විශාල සම්මානයක් තෑගි කර ඇත.''

1909 වර්ෂයේදී මෙම ස්ථානය නැරඹීමට ගිය හෙන්රි පාකර් මහතා සඳහන් කරන්නේ, ගල් තලාවක් මත හිල් 09 කින් යුත් ඔළිඳ සෙල්ලම් කරන ස්ථානයක් ගලක නෙලා තිබෙන අයුරු දැකගත් බවයි. එමෙන්ම කටාරම් කොටන ලද ගල්ලෙන් මෙන්ම පැරණි සෙල්ලිපි කිහිපයක් ද දැකගත් බවයි. එවකට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වශයෙන් කටයුතු කළ එෆ්. ලුවිස් මහතා එම සෙල්ලිපි පිටපත් කළ බවද සඳහන් කරයි.

**එස්. ඩී. ජී. ට්. සන්දනායක**
පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරි
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
රත්නපුරය

# පරගහවත්ත පුරාවිද්‍යා ගවේෂණයක්

කළුතර දිස්ත්‍රික්කයේ පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යකුපිටිය ග්‍රාම වසමේ පිහිටා තිබෙන පරගහවත්ත ඓතිහාසික බෝධීන් වහන්සේ පිළිබඳ පුරාවිද්‍යාත්මක ගවේෂණයක ආරම්භය සිදු වූයේ 2018 වසරේදීය. බස්නාහිර පළාත් පුරාවිද්‍යා ගවේෂණ කණ්ඩායමක් විසින් පාලින්ද නුවර ප්‍රදේශයම ආවරණය වන පරිදි කරන ලද සොයා බැලීම් අවස්ථාවේ දී මෙම ස්ථානය නිරීක්ෂණයට ලක් විය. එහිදී මෙම බෝධිය සහ එහි අවටින් ලැබුණු පුරාවස්තු පිළිබඳ විශ්ලේෂණයක් කරන ලදී.

පරගහවත්ත බෝධිය පිළිබඳ ඓතිහාසික තොරතුරු අපට හමුවනුයේ කෝට්ටේ යුගයේ සිදුවූ දේශපාලන බල අරගලයන්ට පසුබිම්වයි. දාසය වන සියවසේ ඇතිවූ මෙම බල අරගල වල ප්‍රතිඵලයක් ලෙසට පැළෑඳ නමින් රාජධානියක් බිහිවන්නට ඇති බවට ඉතිහාස තොරතුරු රාශියක් ඇත. කෝට්ටේ සත්වන භුවනෙකබාහු රජුගේ දුවණිය වූ සමුද්‍ර දේවිය විවාහ කර ගත් තනියවල්ලභ රජුගේ මුණුපුරු වීදිය බණ්ඩාර කුමරු පස්යොදුන් කෝරළයට පලා වීමෙන් පසු මෙම රාජධානියේ කතාපුවත ඇරඹෙයි. පරංගීන් සමග විරසක වී අත්අඩංගුවට පත්ව පසුව සිරගෙයින් පලා යෑමට සමත් වූ වීදිය බණ්ඩාරයන් පස්යොදුන් කෝරළයේ පැළෑඳට පැමිණෙයි. පැළෑඳ රාජධානිය ඉතා කෙටි කලකින් අවසන් වූ නමුදු වීදිය බණ්ඩාර කෝට්ටේ රජ වාසලේ සෙන්පතිව සිටි සමයේ මෙම පෙදෙසේ පාලනය සඳහා මැදිහත් වීමක් සිදු කර ඇත.


පරගහවත්ත බෝධිය පිළිබඳ නිගමනයන්ට එළඹිය හැකි වන්නේ මෙම ඓතිහාසික පසුබිම තුළය. වර්ෂ 1553 දී සීතාවක



රාජසිංහ සහ පරංගීන් එකට එක්ව වීදිය බණ්ඩාරයන් ගේ බල ආධිපත්‍ය විනාශ කරලීමට පැළෑඳ ආක්‍රමණය කිරීමෙන් පසු සිදුවූ අවසාන සටනින් වීදිය බණ්ඩාරයන් පරාජයට පත්වෙයි. එහිදී ඔහු තම අතපත්තු හමුදාවත් සමග දෙවිනුවර දක්වා පසුබසින අවස්ථාවේදී රන්පොත පාරෙන් ඉස්තිබා පලාගිය බව රාජාවලිය වාර්තා කරයි. මේ රන්පොත පාර යනු වර්තමාන හරන්කහපොත මාර්ගයයි. පැළෑදේ සිට හරන්කහපොතට ගමන් කරන විට අපගේ ප්‍රස්තුතය වන පරගහවත්ත ඓතිහාසික බෝධිය හමුවේ.

පරගහවත්ත බෝධිය කාලයක් වනගතව තිබී යළි හෙළි පෙහෙළි කොට වන්දනාමානයට ලක් කරන ලද්දේ 2018 වසරේදී පමණය. එම ස්ථානයේ බුදු මැදුරක් තැනවීම එහි පළමු කාර්යයයි. මෙහිදී භූමියේ පස් ඉවත් කරන කල්හි එයින් මතුවූ වරාගන් කීපයක් නිසා මෙම කාර්යයට මුල් වූ තරුණ පිරිසට මෙහි තිබෙන ඓතිහාසිකත්වය වැටහිණ. වරාගන් යනු කහවනුවෙන් කොටසකි. නමුත් ඒවා රත්තරන් නොවේ. රන් ආලේප කරන ලද අච්චුවකින් වක්කරන ලද ලෝහ කැබලිය. වරාගන්වලට අමතරව බෝධිය වටා තිබෙන බෝධි ඝරය පිළිබඳවද විමර්ශනය කෙරුණි. එහිදී හඳුනාගන්නට යෙදුණේ මෙම බෝධිඝරය ඉනිගල්වලින් සකස් කරන ලද්දක් බවයි. මෙලෙස ඉනිගල් මගින් බෝධිඝර වට කිරීම මෙන්ම ස්තූප මලු සැකසීමට කෝට්ටේ යුගයේ කරන ලද උත්සාහයන් ගැන වාර්තා වෙයි. වරකාගොඩ වෙහෙර ගොඩැල්ල ස්තූපයද එලෙස ඉනිගල්වලින් වට කර තිබේ.

පරගහවත්ත බෝධිස්ථානයේ දෙවනි විශ්ලේෂණ අවස්ථාව නම් එහි ඉදි කිරීමකට නැවත පස් ගැනීමේදී වළන් කටු කීපයක් මතු වීමයි. මෙම වළන් කටු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් අංශය විසින් පරීක්ෂා කරන ලදුව කෝට්ටේ යුගයට අයත් බවට නිගමනයක් කර ඇත. පුරාවිද්‍යා ක්‍රමවේද අනුව එහිදී ලැබුණු වළන්ගැට්ටේ සම්පූර්ණ විෂ්කම්ය සෙ.මී. 20 ක් පමණ වෙයි. එනම් අඟල් අටක් පමණ කරකින් යුතු විශාල හට්ටියක් මේ මගින් හඳුනාගත හැකිය. කෝට්ටේ යුගයේ භාවිත කරන වළන්වල ස්වභාවය නම් සුදු පැහැයට හුරු වීමයි. එයට හේතුව භාවිත කරන ලද පසේ යකඩ ප්‍රමාණය අඩුවීමයි. කිරිමැටි මිශ්‍රවීමයි. සාම්ප්‍රදායික පුරාවිද්‍යා ක්‍රමවේද මගින් මෙම හට්ටියේ කරේ විෂ්කම්භය මැනීමට අමතරව මෙහිදී නවත් දියුණු තාක්ෂණයක් භාවිත කිරීමට ද





උත්සාහ දරන ලදී. නව නිපැයුම් කරුවෙක් වන දිනේශ් කටුගම්පළ මහතා විසින් නිර්මාණය කරන ලද වෘත්තාමානය (රේඩියුස් මීටරය) නම් නවතම උපකරණයක් එයට යොදා ගන්නා ලදී.

පරගහවත්ත බෝධිය අසලින් ලැබුණු හට්ටි කැබැල්ලේ අරය නිවරදිව ගණනය කරලීමට මෙම වෘත්තාමානය යොදා ගත් අතර ඒ මගින් හෙළි වූයේ සෙ.මී. 21 ක පමණ විෂ්කම්භයක් එයට තිබී බවයි. පෙර සඳහන් කරන ලද වරාගන් කැබලි තැන්පත් කර තැබීමට හෝ මෙම ස්ථානය පරිහරණය කළ පුද්ගලයන් ගේ දෛනික කටයුතු සඳහා මෙම හට්ටිය උපයෝගී කරගන්නනට ඇති බවට සැක කළ හැකිය. පොළව මට්ටමේ සිට අඩියක් පමණ පහළ ස්ථාරයක මෙම හට්ටි කොටස හමුව ඇති අතර එයට අමතරව අලංකරණය කරන ලද වළඳක කොටසක් වශයෙන් ගත හැකි කුඩා වළන් ගැටියක්ද මෙහිදී නිරීක්ෂණයට හසුවිය. මෙම පුරාවස්තු වලට අමතරව යබොර කොටස් මෙහි හමුවෙයි. පරගහවත්ත බෝධිය පිහිටි කඳු ගැටයට යාබදව පුරාණ වැවක බැම්ම සහ වැව්පිටිය ද දක්නට හැකිය. මේ අනුව නිගමනය කළ හැක්කේ බෝධීන් වහන්සේ හාත්පස තිබූ කර්මාන්ත සහ ජනාවාස වල ස්වභාවයයි. ඉදිරි ගවේෂණ කටයුතු වලට මෙම සොයා ගැනීම් ඉතාමත්ම වැදගත් වේ.

මතුගම සෙනෙවිරුවන්
ස්වාධීන පුරාවිද්‍යා ගවේශක

# ආසියාවේ වැඩිම වට ප්‍රමාණය සහිත වෘක්ෂය (බයෝබැබ්)



මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලිමුනෙයි ග්‍රාමයේ මෙය පිහිටා ඇත. මැදවච්චිය මන්නාරම මාර්ගයේ හෝ යාපනය මන්නාරම මාර්ගයේ මන්නාරම නගරයට පිවිසීමට ඇති පාලම පසුව් හමුවන සිව් මංසලින් දකුණු දිශාවට වූ පල්ලිමුනෙයි මාර්ගයේ කිලෝමීටර 01 ක් පමණ පැමිණීමෙන් මේ කරා ළඟා විය හැකිය.

ඓතිහාසික වශයෙන් වැදගත්කමක් ගන්නා බයෝබැබ් හෙවත් පෙරක්කු ගස ක්‍රි.ව 1477 දී අරාබි ජාතික නැවියන් විසින් සිටුවන ලද බවට විශ්වාස කෙරේ. මෙම ගසෙහි වට ප්‍රමාණය මීටර් 19.51 ක් ද, උස මීටර් 7.5 ක් ද වේ. මෙහි මැද විශාල කුහරයක් දක්නට හැකි අතර, සාමාන්‍යයෙන් මිනිසුන් 10 දෙනෙකුට පමණ පහසුවෙන් එහි වාඩිවී සිටිය හැකිය. එය ජලය රඳවා ගැනීම පිණිස සකස් වූවකි.

සාමාන්‍යයෙන් වසර දෙකකට පමණ වරක් ජුලි, අගෝස්තු මාසවලදී මල් හටගන්නා අතර, ඉන් අනතුරුව ඵල හට ගනී. අලංකාර හැඩයෙන් යුතු මලක් වන අතර, ඵල සාමාන්‍යයෙන් ඉතා දැඩි කටු සහිත සිහින් බූවකින් යුක්තය. හොඳින් වැඩුණු ගෙඩියක් සාමාන්‍යයෙන් අඩියක් පමණ දික්වන අතර, වට ප්‍රමාණය සෙ.මී. 25.30 ක් පමණ වේ. බෙලිගෙඩියකට සාමාන්‍යයෙන් සමාන කමක් දක්වන මෙහි මදය ද බෙලි වලට බොහෝ අතට සමානය. මෙම වෘක්ෂය පිළිබඳව ප්‍රධාන මතවාද දෙකක් පවතී. එනම් මෙම වෘක්ෂය ඖෂධීය වශයෙන් ඉතා වැදගත් වන අතර, මෙහි පංචාංගයම ඖෂධ වශයෙන් භාවිතයට ගන්නා බවත්, අතීතයේ ඇති වූ රෝගී තත්ත්වයන් සුව කර ගැනීම සඳහා ගෙනැවිත් රෝපණය කළ බවත්, මෙහි ඵල ඉතා රසවත් මෙන්ම පෝෂදායී ගුණයෙන් අනූන පලතුරක් බවත් එක් මතයකි.

අනෙක් මතවාදය වනුයේ මාන්තායි වරාය නගරය සක්‍රියව පැවති කාල වකවානුවේ මන්නාරම ඉතාමත් ජනාකීර්ණ වෙළඳ නගරයක් වූ බැවින් එහි වෙළඳාම සඳහා පැමිණි අරාබි වෙළඳුන් විසින් තම ප්‍රවාහන මාධ්‍ය ලෙස යොදා ගත් බූරුවන්ගේ සහ අශ්වයින්ගේ ආහාර පිණිස මෙම ශාක මෙරටට රැගෙන විත් රෝපණය කළ බවයි. මෙම සුවිසල් පෙරක්කු ගස හැරුණු කොට ප්‍රමාණයෙන් කුඩා වූ ශාක 25-30 ක් පමණ මන්නාරම දූපත තුළ දක්නට හැකිය. මීට අමතරව යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ් දූපතෙහි ද සුවිසල් පෙරක්කු ( බයෝබැබ් ) ගසක් දක්නට හැකිය.

විවිධ මානව ක්‍රියාකාරකම් හා ජනාකීර්ණත්වය හේතුවෙන් උතුරු පළාතට ආවේණික වූ බයෝබැබ් ගස් විනාශ වී යාමේ තර්ජනයකට මුහුණ පා ඇත. එබැවින් ආසියාවේ වැඩිම වට ප්‍රමාණයෙන් යුක්ත ශාකයෙහි ආරක්ෂාව පිණිස 1955 වසරේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් බවට මෙය ප්‍රකාශයට පත් කොට තිබේ.

මෙම ඓතිහාසික මෙන්ම ලෝක ප්‍රකට බයෝබැබ් වෘක්ෂය ආරක්ෂා කර ගැනීම අප කාගෙත් වගකීමක් වන්නේය.

**එම්. චමින්ද සිල්වා**
කලාපභාර නිලධාරී (මන්නාරම)

## උතුරු නැගෙනහිර පළාතේ ජාතික උරුමයන් ආරක්ෂා කරගනිමින් ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීමේ සංවිධානය "සහජීවන".

**පුනරුද පුවත් හසුන**
**PUNARUDA NEWS LETTER**

සියලු ජාතීන්, ආගම් අතර සමගිය හා සහජීවනය ඇති කිරීමේ පරමාර්ථයෙන් සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය හා ඒකාබද්ධව "සහජීවන" සංවිධානය පිහිටුවා ගෙන තිබේ.

මෙහි විශේෂත්වය වනුයේ උතුරු නැගෙනහිර පළාතේ සියලු ජාති ආගම් නියෝජනය කරන ජාතික උරුමයන් ආරක්ෂා කර ගැනීමට ජනතාව තුළ අවබෝධයක් ඇති කරවීමයි. මේ වනවිට මඩකලපුව තෙවිලියාමඩුව, ත්‍රිකුණාමලය කුච්චවේලි, පිච්චමල් රජමහා විහාරය, යාපනය නාවක්කුලිය, වව්නියාව බෝගස්වැව ආදී ප්‍රදේශ වෙත දකුණේ සිංහල, දමිළ, මුස්ලිම් ජනතාව කැඳවාගෙන ගොස් තිබේ.

# පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කිරීමක දී නඩු පවරන්නේ කෙසේ ද?

පුරාවස්තු සඳහා බලපාන්නා වූ නීතිය 1940 අංක 09 දරණ පුරාවස්තු ආඥා පනත මඟින් හඳුන්වා දී ඇත. එකී පනත 1955 අංක 02, 1998 අංක 24 දරණ පනත්වලින් සංශෝධනයට ලක් වී ඇති අතර වර්තමානයේ 1998 අංක 24 දරණ පනතේ විධි විධාන ක්‍රියාත්මක වේ. දඩ පමණක් 2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනත මඟින් සංශෝධනයට ලක් වී ඇත. මෙම පනතට අනුව පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කිරීමේ වරදක දී පැනවිය හැකි උපරිම දඩය රු.250,000 කි.

පුරාවස්තුවක් යනු විනාශයට ලක් වුවහොත් කිසිවිටකත් නැවත යථා තත්ත්වයට පත් කළ නොහැකි නිශ්චල හෝ චංචල දේපලකි. එසේ වීමට නම් එය වසර 100 කට නොඅඩු කාලයක් තිස්සේ පැවත එන්නක් විය යුතුය. 1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝධන) පනත පැනවීම මඟින් ශ්‍රී ලංකාවේ තිබෙන පුරාවස්තු සුරක්ෂිත කොට නිසි කළමණාකාරීත්වයෙන් යුතුව ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරන නීතිමය තත්ත්වයක් හඳුන්වා දීමට මූලික වශයෙන්ම ව්‍යවස්ථාදායකය අරමුණු කරගෙන ඇති බව පෙනී යයි.

පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කරන්නන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වැටලීමේ කණ්ඩායමක් පනත මඟින් හඳුන්වා දී නොමැතිවීම හේතුවෙන් එකී තැනැත්තන් අත්අඩංගුවට ගෙන නීතියේ රැහැනට හසුකර ගැනීම පිළිබඳ වගකීම පොලීසිය වෙත පවරා ඇත. තව ද පනත උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නඩු පැවරීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද පුරාවස්තු ආඥා පනත මඟින් බලය පවරා ඇත. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 108 වන වගන්තියේ සිට 125 වගන්තිවල වරදක් විමර්ශනය කිරීම පිළිබඳ බලතල පොලීසිය වෙත ලබා දී ඇති අතර එකී වගන්තිවල සීමාවන්ට යටත්ව පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කරන්නන්



අත්අඩංගුවට ගැනීම, විමර්ශන පැවැත්වීම, චෝදනා ගොනු කිරීම ආදිය පොලීසිය විසින් සිදු කරනු ලබයි.

පුරාවස්තු ආඥා පනත යටතේ සිදු කරනු ලබන වැරදි අපරාධමය වැරදි ගනයට අයත් වේ. අපරාධ නඩුවක් පැවරීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ආනුෂාංගික කරුණු සියල්ල පිළිබඳව ඇතුළත් වන්නේ 1979 අංක 15 දරණ අපරාධ නඩු විධි විධාන සංග්‍රහ පනතේ ය. කිසියම් වරදක් පිළිබඳව මුල් තොරතුරක් ලැබුණු පසු සැකකරුවන් අත්අඩංගුවට ගැනීම, ප්‍රකාශ සටහන් කිරීම, විමර්ශන පැවැත්වීම, චෝදනා පත්‍ර ගොනු කිරීම ආදී කරුණු පිළිබඳව අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ සඳහන් වේ. මෙය වැඩි දුරටත් පැහැදිලි කරන්නේ නම් අපරාධ නඩුවක ආරම්භයේ සිට අවසානය දක්වා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සඳහන්වේ. පුරාවස්තු ආඥා පනතේ ප්‍රතිපාදන මත පමණක් පිහිටා අධිකරණයක නඩුවක් පැවරිය නොහැක. අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමේ දී සහ චෝදනා පත්‍ර ගොනු කිරීමේ දී පුරාවස්තු ආඥා පනතේ ප්‍රතිපාදන උපයෝගී කර ගනියි. පුරාවස්තු ආඥා පනත යටතේ පවරන නඩු සම්බන්ධයෙන් අධිකරණ බලය තිබෙන්නේ මහේස්ත්‍රාත් අධිකරණයට යි. මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරිය යුතු ආකාරය පිළිබඳ විධි විධාන අපරාධ නඩු විධාන සංග්‍රහයේ xiv වන පරිච්ඡේදයේ 136 (1) වගන්තිය මඟින් හඳුන්වා දී ඇත. මෙවැනි පසුබිමක් යටතේ පුරාවස්තු ආඥා පනත පමණක් නොව වෙනත් කුමන හෝ විශේෂ පනතක් හෝ දණ්ඩ නීති සංග්‍රහයේ විධි විධාන හෝ උල්ලංඝනය කළ ද මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීම සිදුකළ යුත්තේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ xiv වන පරිච්ඡේදයේ 136 (1) වගන්තියෙහි සඳහන් කරුණු මත බව පෙනී යයි.

නීතිඥ රංජිත් ගමගේ
සහකාර නීති නිලධාරී

# දෙහිවත්ත සිරිවඩ්ඪන රජමහා විහාරයේ පුරාණ දාගැබ ප්‍රතිසංස්කරණය කොට ජන අයිතියට පත්කෙරේ.

ශ්‍රී ලංකාවේ බුදුදහම යනු ජීවමාන උරුමයකි. පුරාණ වුවත් අදටත් මෙරට ජනයා විසින් අනුගමනය කරනු ලබන මෙන් ම ඔවුන්ගේ වන්දනාවට පාත්‍ර වන්නකි.

මේ අරමුණින් ප්‍රතිසංස්කරණය වූ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෙහිවත්ත සිරිවඩ්ඪනාරාම විහාරයේ පුරාණ දාගැබ පුරාවිද්‍යාත්මක අවධි සාධක දිස්වන පරිදි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය මගින් ප්‍රතිසංස්කරණය කොට 2019 ජුනි මස 16 පොසොන් පුරපසොලොස්වක පොහෝ දින කොත් පැලඳ වීමට නියමිතය.

මෙම දාගැබ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂයේ දී කැණීම් කටයුතු සිදුකළ අතර අවධි තුනකට අයත් දාගැබ් දැකගත හැකිය. එයින් පළමු ස්තූපය ඉදිකිරීම ක්‍රිස්තු පූර්ව 2- ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් මුල් දාගැබ ද ක්‍රිස්තු වර්ෂ 4-6 සියවස්වල පළමු කන්චුක පැළඳවීම ද 9-10 සියවස්වලට අයත් දෙවන කණ්චුක පැලඳවීමට අදාළ අවධි සාධක දැකගත හැකිය. මෙයින් පැහැදිලි වන අනෙක් කාරණය වන්නේ එවකට සිටි සෑම පාලකයෙකු විසින්ම මෙම ස්තූපය කෙරෙහි අවධානය යොමු කොට සිය රාජ්‍ය කාලය තුල ස්තූපයට කණ්චුක පැලඳවීමෙන් තම ගෞරවය පුද කොට ඇති බවයි.

සංරක්ෂණ කටයුතු 2017 වර්ෂයේ මුල්භාගයේ දී ආරම්භ කරන ලදී. මෙම ස්තූපයේ සහ ප්‍රදේශයේ ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී මෙහි කාලය රුහුණේ පාලකයාව සිටි ගෝඨාභය රජතුමන් විසින් කරවන ලද්දක් ලෙස සැලකිය හැකිය. තදාසන්නයේ ඇති විල්ගම්වෙහෙර, සේරුවිල, නීලපොල ආදී ස්තූප රාශියක් පුරාණයේ රෝහණ දේශයට අයත්ව ඉදිවන්නට ඇති බවට සිතිය හැකිය.

මෙම ස්තූපය ප්‍රතිසංස්කරණය සිදු කරන ලද්දේ දෙහිවත්ත සිරිවඩ්ඪනාරාම පුරාණ විහාරයේ විහාරාධිපති ගෞරවනීය කලවානේ කෝසලතිස්ස හිමියන්ගේ ඉල්ලීම පරිදි ව්‍යාපාරික උෂාන් අබේවික්‍රම මහතාගේ මූල්‍ය දායකත්වයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යාත්මක, තාක්ෂණික සහ ශ්‍රම දායකත්වයෙනි.

තව ද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඓතිහාසික යුගය පෙළ ගැස්වීමේ දී සහ සමස්ත ඉතිහාස කථාව පිළියෙළ කිරීමේ දී පුරාවිද්‍යාත්මක ගවේෂණ සහ කැණීම් මගින් ලබාගත් දත්ත මහත් අඩුවක්ව පවතී. එබැවින් මෙම එක් එක් කටයුතුවලින් එක්රැස්වන දත්ත ඉතා වැදගත් වේ.

දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා කටයුතුවලට නායකත්වය සහ මඟ පෙන්වීම නිසිලෙස ලබා දෙමින් කටයුතු මෙහෙයවනුයේ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ ඩබ්ලිව්.එච්. සුමනදාස මහතා විසිනි. දහසකුත් එකක් බාධක මැද්දේ පසුනොබස්නා වීර්යයකින් යුක්තව එතුමා කටයුතු නොකළේ නම් මෙබඳු සාර්ථකත්වයන් ලැබීම අපහසු බව කෘතවේදීව කිව යුතුය.





දාගැබේ කැණීම් කටයුතු අතරතුරේ ...



ස්තූපය ප්‍රතිසංස්කරණය අවසන් අදියරේ ...

ප්‍රියන්ත ජයසිංහ
ප්‍රාදේශීය පුරාවිද්‍යා කර්යාලය
ත්‍රිකුණාමලය

21 වන පිටුවෙන් ...

# ප්‍රාග් මානව ශිෂ්ටාචාරයේ සැබෑ පිළිබිඹුව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික ගල්ලෙන්!!

ලෝක ප්‍රාග් ඉතිහාසයට නවීන මානවයා සංස්කෘතකමය වශයෙන් අදින් වසර මිලියන 2 කදී අප්‍රිකාවෙන් එකතුවී ලක්ෂ 01 කදී අප්‍රිකාවෙන් පිටව සෙසු මහද්වීප වලට සේන්දුවීම සිදුවෙනවා. එවැනි ජනාවාසයන් පිළිබඳව අධ්‍යනයේදී ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ගල්ලෙන් ඉතාම ප්‍රබල දායකත්වයක් සපයා තිබෙනවා. මෙම ගල්ලෙන් වපසරිය දැනුවත්කමින් හෝ නොදැනුවත්කමින් සීඝ්‍ර විනාශයකට පත්වීම ඉතාම ඛේදනීයයි. මේ නිසාම අපේ ප්‍රාග්ඓතිහාසික ගල්ලෙන් පද්ධතිය ලෝක උරුම ස්ථානයන් අතරට පත්කර ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක්. වසර 2000 න් පසුව මාගේ මැදිහත්වීමෙන් ගල්ලෙන් මඟින් අනාවරණය වන තොරතුරු ජාත්‍යන්තර පත්‍රිකා හා කෘතීන් හරහා ජාත්‍යන්තරයට එකතු කිරීමට හැකියාව ලැබෙන අතර එමගින් ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඉතිහාසයට නව එළියක් ලැබුනු බව මගේ විශ්වාසයයි".

ශ්‍රී ලංකාවේ ඉන්දියාවේ ද නොමැති තරම් ප්‍රාග්ඓතිහාසික ගල්ලෙන් දැකගත හැකිය. බටදොඹලෙන, පාහියන්ගල, කූරගල, කිතුල්ගල වැනි ගල්ලෙන් පිළිබඳ මුළු ලෝකයක් අද වනවිට තොරතුරු හුවමාරු කරගනී. නවීන මානව සාධක සියල්ලක්ම රැඳී පවතින්නේ මෙම ගල්ලෙන්වලය. ශ්‍රී ලංකාවේ ගල්ලෙන් ඉතා විශාලය. එය ප්‍රාග්ක්‍රේම්බ්‍රිය යුගයේ සිදු වූ විශාල පාරිසරික විපර්යාසයන්හි ප්‍රතිඵලයකි. එම තත්ත්වය මතින් ඇති වූ ප්‍රාග්ඉතිහාසයේ අනන්‍යතාවය ආරක්ෂා කරගැනීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට තරමක අභියෝගයක්ව පවතී. විශේෂයෙන්ම විවිධ සංවර්ධන යෝජනා යටතේ ඇතිවන කළුගල් අවශ්‍යතාවයන් පිරිමසා ගන්නට මෙම පාෂාණ උද්ගතයන් භාවිතයට ගැනීම ඉතාම කණගාටුදායක තත්ත්වයකි.

ශ්‍රී ලංකාවේ ආදිතම මානවයා ජීවත් වූ බවට වැඩි සාධක ප්‍රමාණයක් පහතරට තෙත් කලාපයේ ලෙන් මඟින් අනාවරණය වේ. මෙමඟින් අදින් වසර 48,000 සිට අදින් වසර 4,000 දක්වා වත්මන් මානවයා ජීවත් වූ බවට ජනාවාස සාධක සොයා ගෙන තිබේ. මෙම ගල් ලෙන් පසුගිය දශක දෙක තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කැණීම් පර්යේෂණවලට ලක්කර තිබේ. එමගින් අනාවරණය වන්නේ පසුගිය වසර 50,000 කාලය තුළ ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපයේ ෂර්ම කලාපීය වනාන්තරවලින් එල්ල වූ අභියෝග ජය ගෙන ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා සාර්ථක ලෙස තම ජීවිකාව ගෙන ගිය බවය.

ඒ අනුව මෙතෙක් ප්‍රාග්ඓතිහාසික සංචිතයට හසු නොවූ ගල් ලෙන් විශාල ප්‍රමාණයක් විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් දියත් කිරීමට යාමේදී සිදු කරනු ලබන පුරාවිද්‍යා හානි ඇගයුම් නිරීක්ෂණ මඟින් අනාවරණය කරගැනීමට හැකිවී තිබේ. ඒ අතරින් 2019 වර්ෂයේ ප්‍රාග්ඓතිහාසික සාධක රැඳි ගල්ලෙන් 04 ක් පිළිබඳව තොරතුරු අනාවරණය කරගැනීමට හැකිව තිබේ. එම ලෙන් මඟින් අනාවරණය වන තොරතුරු මෙරට ප්‍රාග්ඓතිහාසික කාලපරිච්ඡේදයේ බොහෝ හිස්තැන් පිරවීමට පිටුබලයක් වනු ඇත. විශේෂයෙන්ම මෙම ගල්ලෙන් ශිලා යුගයේ අදින් වසර 1000 ත් 10000 ත් අතර පවතින මතභේදාත්මක තොරතුරු රැසකට විසඳුම් සෙවිය හැකි ස්ථාන වනු ඇත.

ශ්‍රී ලංකාවේ ගල්ලෙන් සංකීර්ණයන්ගේ විශේෂත්වය වන්නේ, නවීන මානවයා නොහොත් වත්මන් මානවයා අප්‍රිකාවෙන් නික්මීමෙන් පසුව පිහිටුවන ලද ආසියාවේ පැරණිතම ජනාවාස සහිත ප්‍රාග්ඓතිහාසික මානවයින්ගේ මානව ශිෂ්ටාචාර පිළිබඳව සංචිත තොරතුරුවල සිට, පූර්ව ඓතිහාසික යකඩ යුගයේ මිනිසාගේ සෙවනට දායකවීම මෙන්ම, ඓතිහාසික යුගයේදී බුදු දහමින් පෝෂණයව රජදරුවන් විසින් පුද පූජාවෙන් ඓතිහාසික වූ සංකීර්ණ ජාතික උරුම පද්ධතියකින් ආවරණයවී තිබීමය.

# සම්පූර්ණ ලෝහයෙන් නිම වූ ප්‍රදීපාගාරය- ඌරුමලෙයි.

මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඌරුමලෙයි දකුණු ග්‍රාම නිලධාරී වසමේ ඌරුමලෙයි ග්‍රාමයේ මෙය පිහිටා තිබේ. මන්නාරම නගරයේ සිට තලෙයිමන්නාරම මාර්ගයේ කි.මී. 30 ක් පමණ ගමන් කිරීමෙන් හමුවන රෝහල අසලින් වම් පසට ඇති ඌරුමලෙයි මාර්ගයේ කි.මී. 3 ක් පමණ ගමන් කිරීමෙන් හමුවන ධීවර වරාය අසලින් වම් පසට මීටර් 500 ක් පමණ ගමන් කිරීමෙන් හමුවන නාවික හමුදා අනුකණ්ඩය සහිත භූමියට පිවිසීමෙන් මෙය දැක බලා ගත හැකිය.

පෘතුග්‍රීසීන් විසින් මෙරටට හඳුන්වා දෙනු ලැබූ ප්‍රදීපාගාර ඉදිකිරීමේ සංකල්පය පසුව ලන්දේසීන් විසින් හා ඉංග්‍රීසි ජාතිකයින් විසින් වඩා වර්ධනය කර ගනිමින් පවත්වා ගෙන ගොස් ඇත. ඉංග්‍රීසි ජාතිකයින් විසින් 1848 ගාල්ලේ ඉදිකරන ලද ප්‍රදීපාගාරය මෙරට හමුවන නියමාකාරයේ අංග ලක්ෂණ සහිත ප්‍රදීපාගාරය බවට වාර්තා වේ.

මෙරට දක්නට ලැබෙන බොහොමයක් ප්‍රදීපාගාරයන්හි අමුද්‍රව්‍යයන් ලෙස කලුගල්, කොරල්, හුණුගල්, සහ වෙනත් රටවල් වලින් ආනයනය කළ ගල් වර්ග බහුල වශයෙන් භාවිතා කර ඇති අතර ලෝහ හා දැව කොටස් භාවිතය ඉතාම අල්ප වශයෙන් සිදුව තිබේ. නමුදු එකී සංකල්පයෙන් ඔබ්බට ගොස් ඌරුමලෙයි ප්‍රදීපාගාරයක් සම්පූර්ණයෙන්ම ලෝහ භාවිතයෙන් ඉදිකර තිබේ. මෙයට සමාන ලෝහයෙන් ඉදි කළ තවත් ප්‍රදීපාගාරය මුලතිව් දිස්ත්‍රික්කයේ ද පැවති බව වාර්තා වන නමුත්



වර්තමානය වන විට එය විනාශව ගොස් ඇති අතර එහි ප්‍රදීපාගාරයක් දක්නට නොමැත. එබැවින් ලක්දිව දක්නට ලැබෙන සම්පූර්ණයෙන් ලෝහයෙන් ඉදිකළ එකම ප්‍රදීපාගාරය ඌරුමලෙයි ප්‍රදීපාගාරය වේ.

වෘත්තාකාරව යකඩ කුළුණු හයක් හා මැදින් එක් යකඩ කුළුණක් සිටින සේ කුළුණු හතකින් යුක්තව ප්‍රදීපාගාරය ඉදි කර ඇත. ඉහළට යාමේ දී ක්‍රමයෙන් සිහින් වන ලෙස සකසා ඇති මෙහි පහළ කොටසෙහි කණු දෙකක් අතර පරතරය මීටර් 05 ක් පමණ වන අතර ප්‍රදීපාගාරයේ සමස්ථ උස මීටර් 20 ක් 25 ක් පමණ වේ. කණු වල ශක්තිමත් භාවය රඳවා ගැනීමට කතිර ආකාරයට වානේ කම්බි යොදා ඇති අතර එකී කම්බි මි.මී. 40 ක් පමණ වේ. එහි පහළ කොටසෙහි ඇතැම් වානේ කම්බි යුධමය වාතාවරණය පැවති සමයෙහි කපා ඉවත් කර ඇති බවත් දක්නට හැකිය. ප්‍රදීපාගාරයේ ඉහල කොටසෙහි කණු 06 ක් වටා කණු වල පිටත පෘෂ්ඨය වැසෙන සේ ඝනකම් තහඩුවක් මඟින් ආවරණය කර ඇති අතර ඒ මත වේදිකාවක් ආකාරයට වෘත්තාකාරව තහඩු දැලක් එළා එය වටා කෙටි කණු සවිකර ඇත. වර්තමානය වන විට මෙහි කණු කිහිපයක් කැඩී ගොස් ඇති අතර කණු 08ක් පමණ ඉතිරිව ඇත. දෙවුන්දර ප්‍රදීපාගාරයේ ඉහළ වේදිකාවට තරමක් සමාන බවක් පෙන්වන මෙය දෙවුන්දර හා සමානව එය වටා ගමන් කිරීමට හැකි වන සේ සකසන්නට ඇතැයි සිතිය හැකිය.

එම්. සී. සිල්වා
කලාපභාර නිලධාරී (මන්නාරම).

# දෙගල් තීරයක පිහිටි දෙගලතිරිය පුරාණ රජමහා විහාරය

කෑගල්ල සිට දම්පැල්ගොඩ මාර්ගයේ කිලෝ මීටර් 15 ක් පැමිණීමෙන් හමුවන බෝගස් හන්දිය නම් ස්ථානයෙන් වම්පසට දිවෙන මාර්ගයේ කිලෝ මීටර් 1.5 ක් ගියවිට මෙම විහාරස්ථානයට පිවිසිය හැකිය. දෙගල් තීරයක පසාරුවගිය පාෂාණ උද්ගතයක නිර්මාණය කරන ලද දෙගලතිරිය පුරාණ රජමහා විහාරයේ ජනප්‍රවාදගත අතීතය වලගම්බා රජ දවස තෙක් දිවයයි.

ශ්‍රී ලංකාවේ මෙවැනි ආකාරයේ ලෙන් පියස්සක් දක්නට ලැබෙන එකම ස්ථානය ලෙසින් මෙම විහාරස්ථානය හඳුන්වා දිය හැකිය. දිගින් කිලෝ මීටර් එකහමාරකට ආසන්නව විහිද යන දිගු පාෂාණ උද්ගතයේ උතුරු අන්තයට වන්නට පිළිම ගෘහය සහිත ලෙන් පියස්ස දැකගත හැකිය. මෙම ලෙන් පියස්සේ විශේෂත්වය වන්නේ ඉහල ආවරණය හා පහල පදනම් කොටස පාෂාණ උද්ගතයන් දෙකකින් නිර්මාණය වී තිබීමය. වලගම්බා රාජ්‍ය කාලයේ මෙම විහාරස්ථානය හා සම්බන්ධ ජනප්‍රවාද පැවතිය ද පුරාවිද්‍යාත්මක සාධක හඳුනා ගෙන නැත.

පශ්චාත් අනුරාධපුර සමයේදී නෙලන ලද කටාරම් ද්විත්වයක් දැකගත හැකි මෙම ලෙන් පියස්සේ නැගෙනහිර පාදමේ මතුපිට පෘෂ්ඨයේ විවිධ සලකුණු හා සංකේත කීපයක් දැනගත හැකිය. මීට අමතරව පාෂාණ උද්ගතයේ විවිධ ස්ථානයන්හි ස්වභාවික ජල කෙම්, පොකුණු හා සකසන ලද ගල් සිදුරු දැකගත හැකිය. කටාරමේ ස්වභාවය හා ස්වරූපය ගත්කල භික්ෂූන් වහන්සේලාගේ භාවනානුයෝගී කාර්යයන් වෙනුවෙන් වෙන් කර සකස් කරන ලද ස්ථානයක් ලෙස හඳුනා ගත හැකිය.

පසුකාලීන අවශ්‍යතාවයන් පුළුල් වීමත් සමඟ ලෙන් විහාරයේ වැඩි ආරක්ෂාවක් සඳහා බටහිර අන්තයට වන්නට ලෙන් කටාරමට පහලින් පැති තුනකින් යුතු වහලයක් ඉදිකර ඇත්තේ ගල්කණුමත රට උළු සෙවිලිකරය. දැනට ලෙන් විහාරයේ දක්නට ලැබෙන සිතුවම් හා පිළිමයන් නවීකරණයට ලක්ව ඇති අතර මීට පෙර මෙම විහාරස්ථානයේ පිළිම ගෘහයේ නා අරටුවෙන් කරන ලද හිටි පිළිමයක් තිබූ බව පැරැන්නන් සඳහන් කරයි.

**එච්. එම්. එස්. කුමාර**
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
කෑගල්ල

# සියවසක් සපුරණ සිසිරගිරි මන්දිරය

අදින් දශක 09කට පෙර ලංකාවේ තේ, රබර් හා කෝපි වතු වැඩිම ප්‍රමාණයක්, අක්කර දස දහසක් අයත් වූ තනි පුද්ගලයෙකු සිටියේ නම් ඒ යටියන රටේ මහත්තයා පමණි. එංගලන්ත සුද්දාගේ වතු අධිරාජ්‍ය බිඳ හෙළූ යටියන උපන් ගැමියෙකු වූ ඩී. ඒ. රණවීර මහතාට එම සියලු ධනය, බලය අත්පත් වූයේ ඔහු ඉදිකළ සුවිසල් සිසිරගිරි වලව්වේ භූමි වාසනා බලයෙන් බව ජනප්‍රවාදයේ පවතී.

ඒ අතීත කතාවට අනුව යටියන මහතා එකල සාමාන්‍ය ගැමියෙකු වූ අතර පදිංචිව සිටියේ දැනට සිසිරගිරි වලව්ව ඉදිකර ඇති ඉඩමේම ඉහළ කොටසට වන්නට තනා ගත් කුඩා නිවෙසකය. එම නිවසට ජලය ලබා ගත්තේ ඉඩමට පහළින් පිහිටි ළිඳකින් වූ අතර දිනපතා කළයෙන් දිය ගෙන යාම යටියන මහතාගේ බිරිඳ වූ කඹුරුපිටිය හාමිනේගේ දින චරියාවේ අංගයකි.

සුපුරුදු පරිදි දිනක් මෙසේ කළයෙන් දිය ගෙන යන කඹුරුපිටිය හාමිනේ කන්දේ මඳ දුරක් ගමන් කොට මහන්සිය හේතුවෙන් කළය බිම තැබුවාය. බිම තැබූ කළය අරුම පුදුම අයුරින් බුබුළු දමමින් උතුරන්න වූ බවත් එම සිදුවීමෙන් පසු යටියන මහතා විසින් නිවිති ශාස්ත්‍රකරුවන් ගෙන්වා ඒ පිළිබඳව විමසා බැලූ විට ඔහුන්ගේ උපදේශය වූයේ එම ස්ථානයේ ඇති භූමි ලාභය හේතුවෙන් එසේ වූ හෙයින් එය මධ්‍යම සිටින සේ වටකොට නිවසක් තනා පදිංචි වන ලෙසයි. ඒ අනුව එම ස්ථානයෙහි ඉදිකළ නිවස සිසිරගිරි වලව්වයි. ඒ ආසන්න වශයෙන් 1916 වර්ෂයයි. එතැන් පටන් පියවරෙන් පියවර ධනවතෙකු වූ යටියන මහතා ඉදිරියේ සුදු ජාතින් පවා වික්ෂිප්ත වූ අවස්ථාවන් එමටය.



එකල මහනුවර queens (රැජින) හෝටලය වෙන්දේසියේ දී වැඩිම ලංසුවට එය ලබාගත් යටියන මහතා සුදු ජාතිකයින්ගෙන් ඇහුවේ තමුන්ට සල්ලි ඕනෙ මොන රටේ බැංකුවකින්ද? යනුවෙන්ය. ඒ වනවිටත් එංගලන්තයේ බැංකුවල පවා තම මුදල් තැන්පත් කර තිබූ යටියන මහතාගේ ධන බලය හමුවේ සුදු ජාතිකයන් විපිලිසර විය. එකල තිබූ මිල අධිකම සුපිරි වාහනයක් වූ ජගුවර් වර්ගයේ මෝටර් රථ තුනක් ලංකාවට ගෙන්වූ බව දැනගත් යටියන මහතා එම රථ තුනම ඒ වෙලේම මුදල් ගෙවා නිවසට රැගෙනවිත් තිබේ. මෑතකදී එම වාහන නිෂ්පාදිත මව් සමාගම විසින් කළ සමීක්ෂණයකදී ආසියාවේ ඉතිරිව ඇති එම වර්ගයේ එකම වාහනය ලෙස ඉන් එකක් හඳුන්වන ලදී. මාතර, හැටන්, නුවරඑළිය ආදී ප්‍රදේශවල තේ, රබර්, කෝපි වගා අක්කර දස දහසට වැඩියෙන් ඔහුගේ තනි අයිතියට නතු විය.

එවන් අතීත ශ්‍රී විභූතියකට උරුමකම් කියන ලද පුද්ගලයෙකු ජීවත් වූ සිසිරගිරි මන්දිරය අද වන විට පාළු, හුදකලා ස්ථානයකි. 1988 භීෂණ සමයේ දී මෙම සුවිසල් මන්දිරයට ගිනි තබා එහි තිබූ සියලු වටිනා දේ පැහැරගෙන ඇති අතර ගින්නෙන් ඇති වූ හානිය සුළුපටු නොවන බව අදටත් එහි යන්නෙකුට දැකගත හැකිය.

විශාල තාප්පයකින් වට වී ඇති නිවස පිහිටි වත්ත ඉදිරිපිට වසර 100කට වඩා පැරණි අරලිය ගස් සමූහය එහි පිවිසෙන්නෙකුට හුදකලා ගුප්ත බවක් ඇති කරවයි. නිවස ඉදිරිපිට කිරිගරුඬින් තැනූ දුර්ලභ අප්සරා මූර්ති 02කි. එහි දෑස්වලට එබ්බ වූ මැණික් ගල් පසුකාලීනව සොරුන් විසින් ගලවාගෙන ගොස් ඇති බව පෙනේ. දෙමහල් මන්දිරයේ නිමාව, අති විශාල නිදන කාමර, පිඟන් ගඩොල් ඇල්ලූ නවීන නාන කාමර, මුළුතැන්ගෙවල් 02ක්, සේවක කාමර, විවෘත ආලින්ද, සඳළුතල, කුඹුක්ලීය ඔපදමා මනා නිමාවකින් යුක්තව කළ ගෙබිමේ ශේෂ වූ කොටස් ආදිය මන්දිරයේ අතීත ශ්‍රී විභූතිය කොතරම්දැයි නිහඬව කියා පායි.

මාතර සිට කි. මී. 13ක් යටියනට පැමිණ අපරැක්ක පාරේ ගමන් ගන්නෙකුට මෙම හුදකලා මන්දිරය දැකබලාගත හැකිය.)

**අරුණි බණ්ඩාර**
සංවර්ධන නිලධාරී
පඬුවස්නුවර පුරාවිද්‍යා ස්ථානය

# කෝට්ටේ කොටු බැම්ම සංරක්ෂණය කෙරේ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝට්ටේ රාජධානියට අයත් මෙම පැරණි ප්‍රාකාර බැම්ම දැකිය හැකිය. ඇතුල් කෝට්ටේ, ඇතුල් කෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරී වසම් දෙකට අයත්ව විහිදී ඇති මෙම ප්‍රාකාර බැම්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ස්මාරකයකි.

උතුරේ ආර්යය-චක්‍රවර්ති පරාජය කිරීම සඳහා ප්‍රභූ රාජ නිශ්ශංක අලකේශ්වරයන් කෝට්ටේ නගරය තෝරාගෙන ඇත. තෝරාගත් ස්ථානය කොළොන්න ඔයටත්, දියවන්නා ඔයටත් තුන් පැත්තකින් මැදිවී තිබීම හේතුවෙන් ආරක්‍ෂාව සම්බන්ධයෙන් ඉතා සුදුසු ස්ථානයක් විය. ජලයෙන් හා වගුරු භූමියෙන් ආරක්‍ෂාවක් නොමැති බලකොටුවේ දකුණු දෙසින්, පිට දිය අගල හා ඇතුල් දිය අගල ලෙසින් අගල් දෙකක් නිර්මාණය කර ඇත. මැනවින් සංවිධානය කරන ලද ආරක්ෂිත ප්‍රාකාර බැම්මක් නිර්මාණය කර ඇති අතර, එහි නටබුන් අද ද දැකිය හැකිය.





කෝට්ටේ රාජධානි සමයේ දී (ක්‍රි.ව. 1400 -1597) මෙම ප්‍රදේශය ඓතිහාසික වශයෙන් වැදගත් වූ බව සාහිත්‍ය මූලාශ්‍ර සහ ජනප්‍රවාදවලින් ද, ජීවමාන පුරාවිද්‍යාත්මක සාධක වලින් ද සනාථ වේ. ක්‍රි.ව. 1400 - 1565 තෙක් කෝට්ටේ හෙවත් ශ්‍රී ජයවර්ධනපුර අගනුවරක් වශයෙන් පැවතුණි. දාහතර වන ශත වර්ෂයේ අග භාගය වන විට ලංකාවේ ජනගහනයෙන් වැඩි කොටසක් පදිංචිව සිට ඇත්තේ බටහිර වෙරළ ආසන්නවය. මෙම කාලය තුළ රජරට වාරි තාක්‍ෂණය බිඳ වැටීමත්, වසරේ වැඩි කාලයක් වර්ෂාව බටහිර වෙරළාසන්න ප්‍රදේශයට ලැබීමත් නිසා මෙම ප්‍රදේශය ජනාවාසකරණය සඳහා ඉතා සුදුසු භූමියක් විය. කෝට්ටේ රාජධානිය බිහිවීමට මෙය ප්‍රධාන හේතුවක් වූ අතර, පොළොන්නරු රාජධානියෙන් පසු පැවති අනෙකුත් රාජධානිවලට වඩා දිගු කාලයක් රාජධානියක් ලෙස පැවතීමට එය හේතුවක් වන්නට ඇත.

කෝට්ටේ පැරණි බලකොටුව ඉදිකිරීමේදී පැරණි කොටු බැම්මේ හැඩය තීරණය කර ඇත්තේ ස්වාභාවික දුර්ගයන්ගේ පිහිටීම පදනම් කරගෙනය. උතුරු, නැගෙනහිර හා දකුණු දිශාවෙන් දියවන්නා ඔය හා වගුරු බිම් තීරුවත්, බටහිර දිශාවෙන් කොලොන්න ඔයත් මායිම් කරගෙන කොටු බැම්ම දිගින් කිලෝමීටර 3.5ක පමණ භූමි භාගයක නිර්මාණය කර ඇත. නිරිත දිශාවෙන් ඇතුල් දිය අගල හා පිට දිය අගල නිර්මාණය කර ඇති අතර, ඒවා කොලොන්න ඔය හා දියවන්නා ඔය හා වගුරු බිම්වලට සම්බන්ධ වනසේ ඉදිකර ඇත. වර්තමානයේ දී ස්ථාන කිහිපයකින් ම කොටු බැම්ම හඳුනාගත නොහැකි වේ. කෝට්ටේ රාජධානිය ආරාජික වීමත් සමග ජනාවාසකරණය හා මෑත කාලීන ශීඝ්‍ර සංවර්ධනය නිසා පැරණි බැම්මේ සමහර ස්ථාන විනාශව ගොස් ඇත.

18" x 10" x 8" ක දිග පළල හා උසින් යුතු කබොක් ගලින් ඉදිකර ඇති කොටු බැම්මේ හඳුනාගෙන තහවුරු කළ කොටස් අඩි 8' ක පළලකින් යුත් වෙයි. ඇතැම් ස්ථානයක අඩි 10' ක් පමණ වෙයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් අවස්ථා කිහිපයකදී කොටු බැම්ම කොටස් වශයෙන් සංරක්‍ෂණය සිදුකර ඇත.

සුරංග ජයසිංහ
බස්නාහිර පළාත් කාර්යාලය

# මහනුවර නාථදේවාලය සහ එහි පෞරාණික ස්ථාන

මහනුවර නගරයේ උපත හා නාථ දේවාලය අතර සෘජු සබඳතාවක් පවතී. එහිදී වැදගත් සාධකයක් වනුයේ නාථදේවාල ශිලා ලිපියයි. මෙම ශිලා ලිපිය ක්‍රි:ව 1541 දක්වා කාලයකට දිවයයි. එහි සෙංකඩගල දෙවියන් නාථ සාමි නමින් හඳුන්වා ඇත. මෙම දෙවියන් වෙනුවෙන් එම නාමයට ඉඩමක් පිදූ බව වෙයි. එය ක්‍රි.ව. 1360 දීය. සෙන්බණ්ඩ නැමැති බ්‍රාහ්මණයා සෙංකඩගල රාජධානිය පිහිටුවන්නේ ජයබිමක යැයි පැවසූ නිසා එම ජයභූමිය සෙවීමට භූමි පරීක්ෂකයකු සමඟ යන ගමනේදී මෙම නාථදේවල භූමියට පැමිණ ඇත. එම බ්‍රාහ්මණයාට අනුව ඔවුන් සොයන්නාවූ ජයභූමියෙහි පළමුව සුදුමැට්ද, දෙවනුව වැලිද, තෙවනුව ජලයද, සිව්වනුව සුදු කැස්බෑ වෙකුද හමුවිය යුතු බව නිගමනය විය. එම සිව් වැදෑරුම් භූමි ලක්ෂණ මෙම භූමියෙන් හඳුනා ගැනීමට හැකි වී ඇත. ඒ අනුව සෙන්බණ්ඩ බ්‍රාහ්මණයාගේ නිගමනයන්ට අනුව මෙම ස්ථානයෙහි නාථදේවාලය තනවා ඊට නුදුරුව රජ මාළිගෙය තැනවූ බව කියවේ. මේ බව දුම්බර විත්තිය, අස්ගිරි තල්පත ආදියෙන් ද සානාථ වී ඇත. ඒ අනුව සෙංකඩගල හෙවත් මහනුවර රාජධානියේ උපත සිදුවීමටද නාථදේවාල භූමිය ඉවහල්වී ඇතිබව පෙනීයයි. මෙම සාධකයනට අනුව තහවුරු වන්නාවූ තවත් වැදගත් කරුණක් වන්නේ නාථදේවාල පුරාණය මහනුවර රාජධානිය පිහිටු වීමටත් පූර්ව අවධියකට අයත් වන බවයි.

නාථ දෙවියන් ලෙස සලකනු ලබන්නේ මෛත්‍රී නාථ හා ලෝකේශ්වර නාථ යන බෝසතුන් වහන්සේලා දෙදෙනාම වෙයි. එනම් ථේරවාද බුදු සමයට අයත් මෛත්‍රී බෝසතුන් හා මහායානික අවලෝකිතේශ්වර නම් මනඃකල්පයට අයත් බෝසතුන් දෙදෙනායි. මෙහිදී විශේෂත්වයක් වන්නේ ලංකාවෙහි ථේරවාදය මුල් බැසගෙන තිබුනද මෙම ස්ථානයෙහි වන නාථදේවාල පිළිමය අවලෝකිතේශ්වර පිළිමයක් වීමයි. පිළිමයෙහි මකුට පාදයෙහි අමිතාභ බුදුන්ගේ ධ්‍යානී බුදුරුව දක්වා ඇත. අවලෝකිතේශ්වර බෝසතුන් ලෙඩ සුව කිරීමට ප්‍රමුඛත්වයේ පවතින බවට සලකති. මෙම හේතුව නිසාවෙන්ම එකල සිටම අද දක්වා සිංහල අවුරුදු චාරිත්‍රයක් ලෙසින් සිදුකරනු ලබන නානුමුර මංගල්‍ය නාථදේවාලය මුල් කරගනිමින් සිදු කරනු ලබයි.

මෙම නාථදේවාලයේ වාස්තු විද්‍යාත්මක සැලැස්ම දකුණු ඉන්දියාවේ ආරම්භ වූ බවට සලකන ගෙඩිගේ ක්‍රමය බව පෙනීයයි. මෙය විශේෂයෙන්ම විජයනගර් වාස්තු විද්‍යා කලාවේ ආභාසය ලත් ගඩලාදෙණිය, මහනුවර ආදාහන මළුව ගෙඩිගේ ආදී සැලැස්මන්ට ද සමාන වෙයි.

නාථදේවාල මළුවේ චෛත්‍ය දෙකක් වෙයි. එයින් එක් චෛත්‍යයක බුදුරදුන්ගේ පාත්‍රධාතුව තැන්පත් කර ඇති බව සලකති. එසේම එම චෛත්‍ය අසලම වටකුරු පාදමක් වෙයි. මෙම පාදම මහනුවර යුගයේ රාජාභිෂේකයන්ට හා රජවරුන්ගේ නම් තෝරාගත් ස්ථානය ලෙසට ද සලකති. පැරණි බෝධිඝරයක්ද විද්‍යාමාන වෙයි. එය බෝකොටුවකින් හා ප්‍රක්ෂේපණ මණ්ඩපයකින් සේම සඳකඩ පහනකින්ද යුක්ත වෙයි. විද්වතුන් එම බෝධිඝරය පොළොන්නරු නිර්මාණ ශෛලයයට අයත් ලක්ෂණ වලින් යුක්ත වන බවට සලකති.

ජේ.ඒ.එස්.එන්. ජයසූරිය
සංවර්ධන නිලධාරී
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
පඬුවස්නුවර.

# කැලණි විහාරයේ සිතුවම් ඡායාරූප වාර්තාකරණය ග්‍රන්ථයක් මගින් ප්‍රකාශයට පත් කෙරේ

විවිධ හේතූන් මත මේවනවිට විනාශ වෙමින් පවතින පුරාවිද්‍යාත්මක හා සෞන්දර්යාත්මක වශයෙන් වටිනාකමින් යුත් පැරණි සිතුවම් ඡායාරූප මගින් වාර්තාකරණය කිරීමේ වැඩසටහනක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අරඹා තිබේ.

එම වැඩසටහන යටතේ මේ වනවිට ඓතිහාසික දෙගල්දොරුව රජමහා විහාරය, පොළොන්නරුව ලංකා තිලකය, කැලණිය රජමහා විහාරයන්හි බිතුසිතුවම් වඩාත් විද්‍යාත්මක ලෙස ඡායාරූප වාර්තාකරණයට ලක් කොට තිබේ.

මෙම ඓතිහාසික ස්ථානයන්හි ඡායාරූප වාර්තාකරණය මගින් ලබා ගත් ඡායාරූප ගොනු කර සුවිශේෂී ග්‍රන්ථයක් නිර්මාණය කිරීම, මෙරට පුරාවිද්‍යා ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයකි. එම ග්‍රන්ථය වෙළුම් I හා II ලෙස කොටස් දෙකකින් යුක්තය. ඉතා කඩිනමින් එය ප්‍රකාශයට පත්කර ජනතාව අතට පත් කිරීමට නියමිතය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශයේ සියලුම කාර්ය මණ්ඩලයේද අනෙකුත් අංශයන්හි සහයෝගයෙන්ද මෙම කාර්යය ඉටු කරන ලදී.







# නිර්මාණ පිටුව

## හික්මීම

දළින් අනින පයින් මඩින
රුදුරු සැහැසිකම් කළ ඇතු
අන්න බලන් සැදැහැ සිතින්
කරඬුව ගෙන යනවා

දෙපයින් අහසට නැගෙමින
හේෂාරව නද නැගූ අසු
අන්න බලන් ආදරයෙන්
රජුට අසුන දෙනවා

අඟිනවුලා මුල් උදුරා
ගුරු තවරා ගත් ගවදෙන
අන්න බලන් මවක වෙමින්
කිරි දෙන්නට එනවා

නින්දා රළු බස් පහරින
සසල නොවී නිසසල වන
අන්න බලන් දැමුණු දනා
නෙත රසඳුන් වෙනවා

**මහින්ද දිසානායක**
(වී පැළුරෙන් ගීත කාව්‍යයෙනි.)





## සුනාමිය

අපි මුහුද බලන්න දුවන කොට
සත්තු කැලේට දිව්ව දවස

**එච්. එම්. එස්. කේ. ඇරැගම**



## කුම්භකර්ණ සෙයාව

ආරංචි ද වැඩක්......
මොකක් ද?
රාවණා රජ්ජුරුවෝ සිහි මූර්ජාවෙන් මිදිලලු.
නෑ.....නෑ නෙවෙයි ඔව්.
ආ..... දන්නවද තවත් වැඩක්.....
සීගිරියේ උමං දොරකින් රත්රන් මතු වෙලාලු.
මොනවා !
ඒ මදිවට මේ ලඟ දී,
රන්මසු උයනේ විශ්ව චක්‍රයෙන් කුරුමිට්ටෝ බැහැලලු.
අම්මපා ! හිතාගන්නත් බෑනේ.
ඒත් ඉතිං වැඩක් නෑනේ
අර මොකෝ,
මේ මොන පෙරළිය, වුනත්,
අපේ උන්ගේ ඇස් ඇරෙන්නේ නෑනේ.
අපේ උන් කීවේ !
දන්නැද්ද,
පුරාවිද්‍යාඥයෝ.......


**පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර.**
මහනුවර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය.

## නික්මීම

සසරෙ බැඳෙමින් ආ මගේ
තව භවයක ඇරඹුමේ
විඳින විඳවන ජීවිතේ
අරුත වැටහුනු යාමයේ
බැම් බිඳින මග සොයා යන්නෙම්
අග රැඳුනු නිවනක සුවේ
(සිතුවම සහ නිසදැස)

**දීපාල් විජේතිලක**

# හරස් පද ප්‍රහේලිකාව



## හරහට

3. මෝල්ගස , කුල්ල
5. පුස්කොල කලාවේ නැවතීම හඟවනු වස් යෙදූ සළකුණ
6. පඩිය, සෝපානය මෙනම්
8. අශ්ව ආහාරයකි
10. දත් ඇන්දට පිටතින් ඇදුණු දත
13. මරණය දක්වන ලියමන
14. පළතුරක් මෙන්ම, මෙය කැපීමෙන් හානි සිදු වේ
15. පුරාණ ලංකාවේ පාලන ඒකක
16. මෙකී පානය ශරීර සුවයට හේතු වේ
17. නීච, පහත් මෙන්ම ස්වප්නය යන අරුත් ගැන්වේ
18. මෙය අතගා ගැනීම කෙනෙකුට අලාභයක් ගෙන දීමක් ලෙස සැලකේ
21. වෙනස්වන සුළු
23. 15, 16 වන සියවස් තුළ රජු හැඳින්වීමට මෙම පදය යොදන ලදී

## පහළට

1. වාස්තු විද්‍යාවේ නෞකාවරණය යනුවෙන් හැඳින්වෙන්නේ මෙම බැම්ම ය
2. මෙය දැමීම ක්‍රීඩාව කි
3. බුදුන් වහන්සේ, මුනිවරයා, තවුසා මෙනමින් හැඳින් වේ
4. ලම්භකර්ණ වංශික
6. යෝනකයා
7. ඉදිකටුව, හිසෙහි ගසන කූර
9. නොමේරූ, මුහුකුරා නොගිය
11. අලුත් සුදු වැල්ල
12. වෙඩි බෙහෙත් පෙට්ටිය
14. ශක්තිය පිරිහුණු, දුබල
15. උපකාරය, රැකුල
18. අධිෂ්ඨානය
19. සිහිය
20. වැරදි කළවුන්ට ගෙවීමට නියම කෙරේ
21. තුනී නොවූ ඝන වූ යන අරුත ඇත
22. අසිපත, කඩුව

(හරස් පද ප්‍රහේලිකාව සකසා අප වෙත සැපයුවේ, මහනුවර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ අයි.ඩී.එම්. විජේබණ්ඩාර මහතා විසිනි.)

## විශ්‍රාමික, වයෝවෘද්ධ මම

අවුරුදු ගණන් මහ වනයේ බොහෝ දුක් විඳලා
වෙහෙස දරාගෙන රජයට මා සේවය කරලා
යාගත නොහැකි වූ දැන් මා එක තැනට වෙලා
මම දින ගෙවමි පෑනත් සමඟ එකතු වෙලා

වනන්තරේ ගස් යට ඇතුපැල් ගොඩනගා ගෙන
කෝටුවලින් සාදාගත් මැසි උඩ නිදා ගෙන
සැප නින්දක් නැතිව රෑ තිස්සේ නිදි මරා ගෙන
සේවය කරපු හැටි මතකයි අනාගතේ සැපබලා ගෙන

(රත්නපුර, දුරෙක්කන්ද පදිංචි ඇම්.ආර්.ජී. කුලතිලක මහතා විසින් ලියා එවූ කවි රැසක් අතරින් මෙම කවි දෙක තෝරා පල කරනුයේ ඔහුට කෘතගුණ සැලකීමක් වශයෙනි. වයස අවු 89 සපුරන ඔහුට දීර්ඝායුෂ පතමු.)

*"විශ්වාසදායක යැයි අප සිතන ඇතැම් අය නොසිතූ ලෙසින් විපත් පමුණුවයි."*

*"ඔබ ඇසුරු කරන අය අනුව සමාජය ඔබේ ගතිගුණ කෙබඳුදැයි වටහා ගනී."*

# උරුම රකින මිනිස්සු ...

**ශ්‍රී ලාංකිය පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය, ධනය කැප කළ බොහෝ දෙනෙක් සිටිති. මේ වනවිට ඔවුන් අතරින් ඇතැමෙක් මෙලොව හැර ගොසිනි. අපගේ ව්‍යායාමය පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අමිල සේවාවක් ඉටු කළ දැනට ජිවතුන් අතර සිටින මිනිසුන් සොයා ගොස් ඔවුනගේ තොරතුරු සහ අත්දැකීම් ඔබ සමග බෙදාහදා ගැනීමයි. මේ යටතේ මෙවර කිර්ති ද සිල්වා, පී. ඩබ්. කරුණාරත්න යන මහත්වරුන් පිළිබඳව කරුණු සාකච්ඡා කෙරේ.**



## කීර්ති සිල්වා මහතා

1972 වසරේ ආධුනික සැලසුම් ශිල්පියෙකු ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බැඳුණු කීර්ති සිල්වා මහතා 2003 වසරේ පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස විශ්‍රාම ගියේය. ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති පුරාවිද්‍යා ස්ථාන රැසක ඔහු සේවයේ යෙදී ඇති අතර තිස්සමහාරාමය, අනුරාධපුරය, මහනුවර ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්තව සේවය කර ඇත.

ඔහු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ ආකාරයත් ඉන් අනතුරුව රටපුරා රාජකාරී ඉටුකළ ආකාරයත් ඔහුගේ වචනයෙන් මෙලෙසිනි.

"අපිව බඳවා ගත් සම්මුඛ පරීක්ෂණයට හයසීයක් විතර දෙනෙක් සහභාගි වුනා. එයින් 02යි තේරුණේ. එයින් ප්‍රථමයා ලෙස මාව තේරුණා. මුල්ම පත්වීම කොළඹ ප්‍රධාන කාර්යාලයට ලැබුණේ.

1973 වසරේ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල 04ක් ලංකාවම ආවරණය වන පරිදි විමධ්‍යගත කළා. තිස්සමහාරාමය, අනුරාධපුරය, බස්නාහිර, මහනුවර ආදී ලෙස. එයින් මම තිස්සමහාරාමයට අනුයුක්ත කළා. වසරක් පමණ එහි කටයුතු කරගෙන ගියා. ඒ අතරේ සඳගිරිය, යටාල ස්ථානභාර නිලධාරී ලෙසත් කටයුතු කිරීමට සිදුවුණා.

අපට කාර්යාලයක් තිබුණේ නෑ. මහමාර්ගය අයිනේ ටකරන් මඩුවක එය පවත්වාගෙන ගියා. නැදිගම්විල පුරාවිද්‍යා ස්ථානයේත්, තෙලුල්ල පුරාවිද්‍යා ස්ථානයේත් කටයුතු පරීක්ෂා කළේත් අධීක්ෂණය කළේත් එතැන සිටයි. එම කටයුතු සඳහා එල්. ඩී. ගුණවර්ධන මහතාත්, එච්. පී. පියසේන මහතාත් මා සමග කටයුතු කළා.

මීට අමතරව තිස්සමහාරාමයේ ම රැඳී සිටිමින් සිතුල්පව්ව වැඩබිමේ කටයුතු නිරීක්ෂණය කිරීමට සිදුවුණා. එකල පොදු ප්‍රවාහන පහසුකම් හෝ දෙපාර්තමේන්තුවේ වාහන තිබුණේ නෑ. අපි එකල ඝන කැළයේ කි. මී. 25 - 30 ගමන් කළේ පයින් හෝ පා පැදියෙන්.

1974 දී එවකට පුරාවිද්‍යා කොමසාරිස් රාජා ද සිල්වා මහතාගේ අනුමැතියෙන් එවකට සහකාර කොමසාරිස් රෝලන්ඩ් සිල්වා මහතාගේ උපදෙස් පරිදි මාළිගාවිල වැඩබිමට අනුයුක්ත කළා. මාළිගාවිල එවකට හිටපු ජයතිලක මහතා නාලන්ද ගෙඩිගේ ගලවා ඉවත් කිරීමේ කටයුතු සඳහා අනුයුක්ත කළා. මාළිගාවිල රාජකාරී කටයුතු කරන ගමන් හැබැස්ස, බුදුරුවගල, දෙමටමල් විහාරය, ගලබැද්ද, ආදී ස්ථානයන්හි කටයුතු අධීක්ෂණය කිරීමේ රාජකාරිත් මා වෙත පැවරුණා.

එවකට මොණරාගල දිසාපතිවරයා වූ ස. ජ. සුමනසේකර බණ්ඩා මහතා මෙම ස්ථානයන්හි පුරාවිද්‍යා කටයුතු සඳහා සුවිශේෂී සහයෝගයක් ලබා දුන්නා.

1976 වසරේ අග භාගයේ දී මුල්කිරිගල පුරාවිද්‍යා කටයුතු වලට සම්බන්ධ වුණා. එහි පියගැට පෙළ සැකසීම හා ඉහළ තුන්වන විහාර කොටසේ ඉපැරණි පියස්ස සංරක්ෂණය කිරීමත් සිදුවුණා. එම කටයුතු සඳහා ජෝර්ජ් රාජපක්ෂ මැතිතුමාගෙන් ලැබුණු අනුග්‍රහය අමතක කරන්න බෑ. මුල්කිරිගල රාජකාරී කටයුතු අතරතුරේ කසාගල, නයිගල ආදී ස්ථානවල කටයුතු අධීක්ෂණය කළා.

1978 දී යළි කොළඹ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කෙරුණා. ඒ සැලැසුම් ශිල්පී 02 ශ්‍රේණියට උසස්වීමක් සමගයි. ලංකාව පුරා පුරාවිද්‍යා ස්ථාන පරීක්ෂා කරමින් වැඩබිම්වලට යෑමට සිදුවුණා. මේ රාජකාරී කටයුතු අතරේ 1982 දී පමණ මට සවුදි රජයේ සැලසුම් ශිල්පියෙකු ලෙස කටයුතු කිරීමට අවස්ථාව උදාවුණා. එහිදී මගේ රාජකාරිය වුණේ විශාල ගොඩනැගිලි සඳහා ජල ප්‍රවාහන කටයුතු වෙනුවෙන් සැලසුම් ඇඳීමයි. වසර 02ක ගිවිසුම් ගත කාලයයි. මේ විදේශීය රාජකාරී ජීවිතයේ සුවිශේෂී අත්දැකීමක් තියෙනවා කියන්න.

මම සවුදි රජයේ රාජකාරී ඉටුකළේ ග්‍රීක සමාගමක් යටතේ. එම සමාගම විසින් විදේශීය හා එරට තරුණ ශ්‍රමිකයින් එකතු කරලා වොලිබෝල් කණ්ඩායමක් හැදුවා. මගේ ක්‍රීඩා විලාසය දැක්ක ග්‍රීක සමාගමේ කළමනාකරුවන් පුදුමයට පත්වුණා. පැවැති සෑම තරඟයකින්ම පාහේ අපේ කණ්ඩායම ජය ගත්තා. මට රන් පදක්කම් හිමිවුණා. (කීර්ති සිල්වා මහතා ඒවා එකිනෙක ගෙන අපට පෙන්වයි.) මගේ පාසල අම්බලන්ගොඩ ධර්මාශෝකය. මම කලක් එහි වොලිබෝල් කණ්ඩායම නියෝජනය කළා. ඊට අමතරව මම ශිෂ්‍යභට කණ්ඩායමේත් හිටියා.

1988 දී මට ඉතාලියේ ශිෂ්‍යත්වයක් හිමිවුණා. ජාත්‍යන්තර ස්මාරක සංරක්ෂණය කිරීමේ 06 මාසික පාඨමාලාවක් සඳහා.

1989 වසරේ දී නාලන්ද ගෙඩිගේ අවසන් අදියරේ කටයුතු සඳහා මාව අනුයුක්ත කළා. එම ව්‍යාපෘතියේ දී සුවිශාල ගල්ගෙඩි පිළිවෙලකට සැකසීමට සිදුවුණා. එය ඉතාම අසීරු කටයුත්තක් වුණා. මේ බැරෑරුම් කටයුත්තට උරදීලා කටයුතු කලේ වස්කඩුවේ විමලසේන නම් පෙදරේරු ශිල්පියා. අපි වසර 02ක් පමණ එකදිගට එහි කටයුතු කළා. මේ රාජකාරී අතරතුරේ මට තාක්ෂණික ස්වයේ (සුප්‍රා) අධිශ්‍රේණියේ පත්වීමක් ලැබුණා.

සිල්වා මහතාගේ රාජකාරී ජීවිතය තුළ අනුරාධපුර ජේතවන ව්‍යාපෘතිය, එහි වාහල්කඩ සැකසීම, දියතලාව සංචාරක බංගලාව ඉදිකිරීම, කොටසර පියංගල ටැම්පිට විහාරය ප්‍රතිසංස්කරණය, දඹේගොඩ බෝධිසත්ව ප්‍රතිමාව, දීඝවාපිය, මොල්ලිකුලම, පොල්වත්ත විහාරය ආදී ස්ථානවලත්, නැගෙනහිර පළාතේ අම්පාර, ත්‍රිකුණාමලය මඩකලපුව ආදී ස්ථානවලත් රාජකාරී ඉටු කර ඇත. ත්‍රස්තවාදී උවදුර උග්‍ර සමයක ඔහු එහි රාජකාරීවල නියැලී ඇත. මීට අමතරව උතුරු පළාතේ මහාකච්චිකුඩ්ඩු අරණ වැනි ස්ථානවල රාජකාරී ඉටුකර ඇත. 1997 වසරේ ඔහු සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) තනතුරට පත්වෙයි.

2003 වසරේ විශ්‍රාම යෑමෙන් අනතුරුව නැගෙනහිර පළාතේ අම්පාර දීඝවාපිය පුරාවිද්‍යා ස්ථානයන්හි උපදේශකවරයෙක් ලෙසත්, මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ හම්බන්තොට, මාතර, ගාල්ල ආදී ස්ථානයන්හි පුරාවිද්‍යා ගවේෂණයෙහි නියැලී ඇත.

කීර්ති සිල්වා මහතා සමාජ සුභ සාධනය වෙනුවෙන් ඉටුකළ සේවය ඇගයීම වස් සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් සංවිධානය කළ දකුණු පළාත් සාමදාන විනිශ්චයකාර විශිෂ්ට සේවා සමර්පණය සම්මානයද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (බලපිටිය) විසින් සංවිධානය කළ වැලිතොට ප්‍රතිභා අභිසෙස් අභිමාන 2018 ගෞරව සම්මාන සමරු තිළිණය ද කැපී පෙනේ.

කීර්ති සිල්වා මහතාගේ පවුලේ විස්තරය අපි ඔහුගෙන් අසා සිටියා.

"මගේ බිරිඳ කමලා පල්ලියගේ. ඇය බලපිටිය සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙස කටයුතු කරලා

විශ්‍රාම ගිහිං. ඇය මටත් වඩා සමාජ සේවා කටයුතුවල නියැලෙනවා. ඇය කාන්තා බලමණ්ඩලයේ සභාපති. සාමවිනිසුරු. මට දරුවෝ 04යි. පුතාලා 03යි. දුවයි. දුව පාසල් ගුරුවරියක්. පුතාලා දෙන්නෙක් ඉංජිනේරුවන් ලෙස කටයුතු කරනවා. එක් පුතෙක් ගුවන් නියමුවෙක්....."

කීර්ති සිල්වා මහතා විසින් විවිධ පුවත්පත් සඟරා ආදිය සඳහා ලිපි ලේඛන සපයා ඇති අතර 2018 වසරේ "පුරාවිද්‍යා" සමීක්ෂණ වාර්තා" මැයෙන් පිටු 63කින් යුත් කුඩා ග්‍රන්ථයක් ද ප්‍රකාශයට පත් කළේය.

අවසන් වශයෙන් කීර්ති සිල්වා මහතා පිළිබඳව මෙම වචන පෙළත් ලිවීමට අමතක නොකරමි. "දායාද" පුරාවිද්‍යා පුවත් අටුවාව ආරම්භයේ සිට අද දක්වා විවිධ තේමාවන් ඔස්සේ ඊට ලිපි සපයමින් ද ස්වේච්ඡාවෙන්ම සඟරාවේ පිටපත් අදාළ ආයතන හා පුද්ගලයින්ට බෙදාහැරීමටත් කටයුතු කරන පුද්ගලයෙකි. ඔහුට ස්තූතිය පුද කරන්නට මෙය අවස්ථාවක් කර ගනිමි.

---



## ජී. ඩබ්. කරුණාරත්න මහතා

1961 වසරේ මග පෙන්වන්නෙකු (මාර්ගෝපදේශකයකු) ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු කරුණාරත්න මහතා 1990 වසරේ ප්‍රාදේශීය කෞතුකාගාර නිලධාරියෙකු ලෙස විශ්‍රාම ගියේය. කැණීම්, කෞතුකාගාර සහාය ලෙසත්, අනතුරුව කෞතුකාගාර නිලධාරියෙකු ලෙසත් ඉතා වගකීමක් සහිත තනතුරක රාජකාරී කටයුතු පුරා වසර 30කට වැඩි කාලයක් විවිධ පළාත්වල ඉටු කළ පුද්ගලයෙකි. දෙස් විදෙස් සංචාරකයින් සඳහා ශ්‍රී ලාංකේය ප්‍රෞඪ උරුමය පිළිබඳව සිංහල, ඉංග්‍රීසි ද්වි භාෂාවෙන් ම වසර 10කට ආසන්න කාලයක් මාර්ගෝපදේශකවරයෙකු ලෙස සේවය කළ තැනැත්තෙකි. කැණීම් කෞතුකාගාර, මාර්ගෝපදේශනය ආදී ක්ෂේත්‍ර ගණනාවක සිය ශක්‍යතාව ප්‍රකට කළ කරුණාරත්නයන් දැන් වයස අවුරුදු 89 සපුරයි. අපගේ මෙම සම්මුඛ සාකච්ඡාවට මාස කිහිපයකට උඩදී දැඩි ශල්‍යකර්මයකට ලක්වූ ඔහු දැන් ඉතා නිරෝගී සුවයෙන් සිටී.

සිය සේවා කාලය පිළිබඳව කරුණාරත්න මහතා සිය හඬ අවදි කළේ මෙලෙසිනි.

"මම මුලින්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුණේ මගපෙන්වන්නෙකු ලෙසයි. (Lecture Guide) රාජකාරී සේවා ස්ථානය අනුරාධපුර පැරණි පුරාවිද්‍යා කාර්යාලය. පරණ කච්චේරි ගොඩනැගිල්ල. අනුරාධපුරයේ ඉඳගෙන සීගිරිය, පොළොන්නරුව ආදී පළාත්වල මග පෙන්වන්නෙකු ලෙස කටයුතු කළා. මේ රාජකාරිය පහසුයි වගේ පෙනුනට ඉතා භාරදූර මෙන්ම සංකීර්ණ වැඩක්. එක පැත්තකින් අපට හමුවන විදේශිකයාගේ තරාතිරම ඒ කියන්නේ ඔහුගේ අධ්‍යාපන, සමාජ මට්ටම ගැන ක්ෂණිකව තේරුම් ගැනීමට සිදුවෙනවා. ඒ අනුව පුරාවිද්‍යා කැණීම්, සංරක්ෂණය, කෞතුකාගාර ගැන දිග පළල තීරණය කර ගැනීමට සිදුවෙනවා. එහිදී තොරතුරු සන්නිවේදනයට භාෂා මාධ්‍ය ඉතා වැදගත්. දෙස් විදෙස් සංචාරකයින් සඳහා මාර්ගෝපදේශනය සිදු කරන අතරතුරේම රාජකාරී ලැයිස්තුවට කැණීම් කෞතුකාගාර සහායකගේ රාජකාරියත් ඇතුළත් කරලා වගකීම් පැවරුවා.

1960 දශකයේ අග භාගයේ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධියට දකුණු පසින් කැණීමක් ආරම්භ කළා. මුල සිට අවසානය තෙක් කැණීම් කටයුතුවල නියැලුණා. මේ අතරතුරේ 1966-67 වසරවලදී යාපනයේ කන්තරෝඩයේ කැණීම්වලටත් සම්බන්ධ වුණා. 1966 වසරේ දීම මට සහකාර කෞතුකාගාර තනතුරත් ලැබුණා.

1968 දී අනුරාධපුරයෙන් මහනුවරට ස්ථාන මාරුවක් ලැබුණා. මගේ ස්ථිර සේවා ස්ථානය මහනුවර වුනත් එහි රැඳී සිටීමට සිදුවුණේ ඉතා අඩුවෙන්. ඊට හේතු කිහිපයක් බලපෑවා. එකක් මහජනතාව දැනුවත් කෙරෙන ප්‍රසිද්ධ උත්සව, පාසල්, වෙනත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන විසින් සංවිධානය කරනු ලබන කෞතුකාගාර ප්‍රදර්ශන රාජකාරී ඉටු කිරීමත් මට පැවරී තිබුණා. මේවා දවස් දෙක තුන හතර පැවැත්වෙනවා. කෞතුක භාණ්ඩ රැගෙන ගොස් ප්‍රදර්ශනයක් පැවැත්වීම ඉතාම වගකීම් සහගත වැඩක්. දෙවැනි කාරණය එවකට කෞතුකාගාර නිලධාරී ලෙස අනුරාධපුරයේ රාජකාරී කළ ජයන්ත උඩුවර මහතා සහකාර කොමසාරිස් ලෙස කොළඹ ප්‍රධාන කාර්යාලයට මාරුවීමක් ලැබුවා. එවිට අනුරාධපුරයේ හිස්වූ කෞතුකාගාර තනතුරෙහි කටයුතු කිරීමත් මා වෙත පැවරුණා.

කෞතුකාගාර නිලධාරී තනතුරෙහි රාජකාරී ඉටු කරමින් සිටින අතරේ ප්‍රාදේශීය කෞතුකාගාර නිලධාරී තනතුරත් මට හිමිවුනා. අනුරාධපුර ප්‍රාදේශීය කෞතුකාගාර නිලධාරී තනතුර යනු සුවිශාල රාජකාරියක් පැවරෙන විශාල ප්‍රදේශයක පැතිරුණු එකක්. එකල ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය, උතුරුමැද (අනුරාධපුරය) යන සියලු ප්‍රදේශ ආවරණය කිරීම අනුරාධපුර ප්‍රාදේශීය නිලධාරියාට පැවරී තිබුණා. මෙම රාජකාරියේ භයානකම කොටස තමා කෞතුකාගාරයේ සියලු කෞතුක භාණ්ඩ ලේඛනයකින් එම නිලධාරියාට පැවරීම.

අතිවිශාල අනුරාධපුර කෞතුකාගාරයේත්, මහනුවර කෞතුකාගාරයේත් සියලු මැදිරිවල තැන්පත් කර ඇති කෞතුක භාණ්ඩ පිළිබඳ අවබෝධයක් මට තිබුණා. කෞතුක භාණ්ඩ ප්‍රදර්ශන මැදිරිවල තැන්පත් කිරීම, ඒවා හුවමාරු කිරීම, ඉවත් කිරීම ඉතාම ප්‍රවේශමෙන්, ඉවසීමෙන් කළ යුත්තක්. ඊට හැමෝටම අවස්ථාව උදාවන්නේ නැහැ. දිනපතාම පාහේ මෙම කෞතුක භාණ්ඩ දැකලා, අතපත ගාලා ලබාගත් මාගේ දැනුම පිළිබඳව එවකට පුරාවිද්‍යා කොමසාරිස්වරු දැනගෙන සිටියා. ඒ අතරින් ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා ප්‍රමුඛයි. ඔහුගේ පාලන සමයේ කතරගම කෞතුකාගාරයේ කටයුතුත් ඉටුකිරීමට මට පැවරුණා.

එවකට කැණීම්, කෞතුකාගාර අංශ දෙකම එකට තිබුණු නිසා කෞතුකාගාරයේ රාජකාරී අතරතුරේ පුරාවිද්‍යා කැණීම්වලටත් සම්බන්ධ වුණා. යාපනයේ කන්තරෝඩයේ මුල්කාලීන කැණීම් කටයුතුවලදී අප හා එක්වුණු එම්. පී. සෙල්වරත්නම් මහතා ගැන වචනයක් කියන්නම ඕනෑ. එවකට මාර්ගෝපදේශක වරයෙකු වූ ඔහු එම කටයුතුවලට පූර්ණ සහයෝගය ලබාදී කටයුතු කළා.

කැණීම්, කෞතුකාගාර කටයුතුවලට අමතරව පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු සඳහාත් සහාය ලබාදීමට හැකිවුණා. මහනුවර කෞතුකාගාරය, ගල්මඩුව, ලංකාතිලකය ඒ අතර ප්‍රධානයි. එමෙන්ම වාකිරිගල, දනගිරිගල, ගඩලාදෙණිය, ඇම්බැක්ක ආදී ස්ථානවල සංරක්ෂණ කටයුතු සඳහාත් සහභාගි වුණා.

අවශ්‍ය අවස්ථාවන්හි මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංරක්ෂණ ව්‍යාපෘති, කෞතුකාගාර ව්‍යාපෘතිවලදී මාගේ සහාය ලබාදී තිබෙනවා."

අවසන් වශයෙන් අපි කරුණාරත්න මහතාගෙන් පවුලේ විස්තර විමසා සිටියා.

"මගේ බිරිඳ කමලා කරුණාරත්න. පුතාලා තුන් දෙනයි. එක දුවයි. ඔවුන් සියලු දෙනා රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ ඉහළ රැකියාවල නිරත වෙනවා ..."

අපි එම සංග්‍රහශීලී එමෙන්ම නිහතමානී මිනිසාගේ නිවසින් ආපසු කොළඹ බලා එන ගමනේ මගේ සිහියට නැඟුණේ තම දුවගේ, බෑණාගේ, ලේලියගේ මානුෂික බැඳියාවේ වටිනාකම ගැනයි.

**(මෙම පුද්ගලයින් පිළිබඳව තොරතුරු සම්පාදනයේ දී හිටපු සහකාර අධ්‍යක්ෂවරයෙකු වූ එම්. ඒ. ජේ. ආර්. මඩගම්මන මහතාගෙන් ලැබුණු සහයෝගය අගය කරමු.)**

**සටහන : සුනිල් බණ්ඩාර කෝරළගේ**
ඡායාරූප : පාලිත හේරත්

# කොළඹ - මහනුවර මහා මාර්ගයේ සංකේතය වූ ඩෝසන් කුලුන

කොළඹ - මහනුවර මාර්ගයේ ගමන් ගන්නා විට කඩුගන්නාව නගර ආරම්භයේ දකුණු පස ඉහළින් දිස්වන ඓතිහාසිකමය වශයෙන් වැදගත් වන ස්මාරකය ඩෝසන් කුලුන යි. වර්ෂ 2007 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් මෙය පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ලියාපදිංචි කර ඇත. මුහුදු මට්ටමේ සිට අඩි 1730 ක් උසින් පිහිටි මෙම සුවිශේෂී ස්මාරකය බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා විසින් කැප්ටන් විලියම් ෆ්‍රැන්සිස් ඩෝසන් නම් රාජකීය ඉංජිනේරුවරයා සමරනු වස් ඉදිකර වූවකි.

ක්‍රි. ව. 1505 දී ලංකාව ප්‍රථම වතාවට බටහිර ජාතීන් අතුරින් පෘතුගීසීන්ට යට විය. ඔවුන්ගේ අවධානය මෙරට මාර්ග තැනීම වැනි යටිතල පහසුකම් දියුණු කිරීම කෙරෙහි යොමු නොවූ බව පැහැදිලිය. පෘතුගීසීන්ට පසුව මෙරට යටත් කර ගත් ලන්දේසීන් (ක්‍රිස්තු වර්ෂ 1640 - 1766) වෙළඳාම අරමුණු කරගෙන කටයුතු කළ බැවින් කොළඹ හා ගනුදෙනු කිරීමට අවශ්‍ය වූ ප්‍රධාන මාර්ග සංවර්ධනයට කටයුතු කළහ. එපමණකින් නොනැවතුණු ඔවුන් භාණ්ඩ ප්‍රවාහනයේ පහසුව සඳහා ගංගා, ඇළ දොළ උපයෝගී කර ගෙන ඇල මාර්ග පද්ධතියක් සකස් කරන්නට යෙදුණි.

කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගය සකස් කිරීම ඇරඹියේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට මෙරට නතු වීමත් සමඟ ය. එසේ වුවත්, ගමනාගමන කටයුතු සඳහා 10 වන සියවසේ සිට උපයෝගී කර ගෙන තිබූ අතර, ජොන් ඩොයිලි විසින් එය ශ්‍රේෂ්ඨ මහනුවර මාවත ලෙස හඳුන්වා ඇත.

ශ්‍රී ලංකාවේ පළමු මහා මාර්ගයෙහි ඉදිකිරීම් කටයුතු බ්‍රිතාන්‍ය යුගයේ දී මෙසේ ඇරඹියේ එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙනි. එය වර්ෂ 1820 දී ආරම්භ කෙරිණි. මෙහි ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කරමින් එය ප්‍රධාන වශයෙන් ගොඩනංවන ලද්දේ රාජකීය ඉංජිනේරුවරයා වූ කැප්ටන් විලියම් ෆ්‍රැන්සිස් ඩෝසන් ය. (Captain W. F. Dawson) - 1825 - 1829* ඒ සඳහා ජෝන් ෆේසර්, තෝමස් ස්කිනර්ගේ දායකත්වය ද හිමිවිය. කොළඹ සිට කැළණිය, මහර, හෙනරත්ගොඩ, වේයන්ගොඩ, පස්යාල, වරකාපොල, අඹන්පිටිය, කෑගල්ල, මාවනැල්ල සහ පේරාදෙණිය හරහා මහනුවරට ඉදිකරන ලද මේ මාර්ගය ගණේතැන්නේ දී පැරණි මාර්ගය හා සම්බන්ධ කරන ලදී.

කොළඹ - මහනුවර මාර්ගයේ අවසන් කොටස කඩුගන්නාවේ සිට මහනුවර දක්වා කඩුගන්නාව දුර්ග මාර්ගය මැදින් ඉදිකරන ලදී.

මෙම කොළඹ - නුවර මාර්ගය තැනීමේ කටයුතුවල දී අන් සියල්ලන්ටම වඩා වගකීමක් දැරීමට කැප්ටන් ඩෝසන්ට සිදු වූ බව සඳහන්ය. විශේෂයෙන් කඩුගන්නාව දුර්ගය තුළින් මාර්ගය තැනවීමට උත්සාහ කිරීම මහත් පරිශ්‍රමයක් දරා කළ යුතු කාර්යයක් විය.

ඩෝසන් කුලුන 1832 දී ඉදිකළ බව හෙන්රි ඩබ්. කේව් සඳහන් කරයි. සිමෙන්ති, වැලි හා හුණු මිශ්‍ර බදාම යොදා ගෙන ඉදිකර ඇති මෙය උසින් අඩි 128ක් වේ. කුලුන ආරම්භයේ දී අඩි 22 ක් දිගින් හා අඩි 30 ක් උසින් යුත් කුටියකි. කුලුන වටා ප්‍රදක්ෂිණාවක් ඇති අතර, පියගැට පෙළ දෙකක් ඉදිරිපස යොදා ඇත. එමෙන්ම කුළුණේ දකුණු පස පිවිසුම් දොරටුවක් සකස් කර ඇති අතර, කුලුන ඉහළට සිලින්ඩරාකාර ලෙස සකස් කර ඇති බව දිස් වේ.



මෙම ඩෝසන් කුලුනේ කොටස් වශයෙන් බුරුත දැව කඳක් යොදා සකස් කළ කණුවක් දැකගත හැකි ය. මෙය උපයෝගී කොට ගෙන බිත්තිය හා සම්බන්ධ වන ලෙස කුලුනේ ඉහළට පිවිසීමට ඉලිප්සාකාර ලෙස පියගැටපෙළ නිර්මාණය කර ඇත. කුලුනේ නඩත්තුව පිණිස ඉහළට යෑමට මුලින් නිර්මාණය කළ මෙම ඉලිප්සාකාර දැවමය පියගැටපෙළ වර්තමානයේ දෙස් විදෙස් සංචාරකයින් විසින් කුලුන ඉහළට නැග හාත්පස දර්ශනය නැරඹීම සඳහා වැඩි වශයෙන් යොදා ගනු ලැබේ. එසේම පියගැටපෙළ සහිත මෙකී කුලුන තුළට වාතාශ්‍රය ලැබීම සැලැස්වීමට බිත්තියේ කුඩා සිදුරු යොදා තිබේ. එපමණක් ද නොව, කුලුනේ ආරක්ෂාව සඳහා ගඩොලින් කළ ආරුක්කුවක් සහිත පියස්සක් ඉදිකර ඇත.

2016 වර්ෂයේ දී කඩුගන්නාව නගර සංවර්ධන වැඩපිළිවෙල යටතේ මෙහි අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත.




වාසනා සිරිමල්වත්ත
ප්‍රකාශන නිලධාරී

# කාලීන අවශ්‍යතාවක් වූ උරුම කළමනාකරණය

උරුමය ආරක්ෂාකර ගැනීම සඳහා ක්‍රියා කරනු ලබන්නේ උරුමය සම්බන්ධ අයිතියක් හා බැඳීම් පවතිනු ලබන පාර්ශ්ව කරුවන් (Stakeholders) විසිනි. මෙහිදී පාර්ශ්ව කරුවන් ලෙස විග්‍රහ කරනුයේ ''යම් දෙයක් හෝ යම් කාර්යයක් සාර්ථකව කර ගැනීම සඳහා ඒ හා සම්බන්ධතා දක්වන සියලු පිරිස්, සහභාගී වන්නන්, සංවිධාන හෝ පද්ධතීන් ගේ සමස්ත එකතුවක්'' ලෙස වේ. ඒ අනුව උරුමය සමඟ සම්බන්ධතාවන් දක්වන පාර්ශ්ව කරුවන් හරහා උරුමයේ ආරක්ෂණය සඳහා කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ.

උරුමය යන්න විග්‍රහයට බඳුන් වන්නේ කාර්මික විප්ලවයෙන් පසුව විවිධ රටවල් සොයා ගිය ගවේශකයින් එම දේශයන් තුළ තමා නොදුටු හා වෙනස් සංස්කෘතික ලක්ෂණයන් ගෙන් යුක්ත ද්‍රව්‍ය අවශේෂයන් හා මානවයා පිළිබඳව සොයා බැලීමට ගත් උත්සාහයේ අවසන් ප්‍රතිඵලය නිසා වේ. මෙම වෙනස් මානව ප්‍රජාවන්ට අයත් වූ දෑ පිළිබඳව අධ්‍යයනය කිරීමට යොමුවීමත් සමග එම ශේෂයන් අතීත මානවයාට අයත් හෝ පැවත ගෙන එනු ලබන දෙයක් යැයි සලකා උරුම සංකල්ප ලෙස හැඳින්වීමටත් පවත්වා ගෙන ඒමටත් කටයුතු කරන ලදි. කෙසේ වෙතත් දෙවන ලෝක යුද්ධයෙන් පසුව මෙම අතීත මුතුන් මිත්තන් ගෙන් පැවත ආ බොහෝ පුරාවිද්‍යාත්මක සාධකයන්ට හානි පැමිණ වීම් සිදුවූ අතර



එමනිසාවෙන්ම උරුම සංකල්ප පිළිබඳව විධිමත් ආකාරයෙන් කථාබහට ලක් කරන්නට විය. 15 වැනි සියවසේ යුරෝපය පුරා පැතිර යන පුනරුදයත් සමග විවිධ පුද්ගලයින් විසින් ඓතිහාසික වැදගත් කම්වලින් යුතු කෞතුක භාණ්ඩ එකතු කිරීමට ගත් උත්සාහය මෙයට මුල්වූ බව පෙනේ.



පුරාවිද්‍යාත්මක සංස්කෘතික උරුමය සංකල්පීය වශයෙන් දියුණු වීමට ආරම්භ වන්නේ ක්‍රිස්තු වර්ෂ 1666 දී ස්වීඩනයේ රාජකීය ප්‍රඥප්තිය තුළින් වන බලපෑම නිසාවෙන් බව හඳුනා ගත හැකිවේ. මෙම ප්‍රඥප්තිය මගින් සියලුම පෞරාණික වස්තු රජයේ දේපලක් ලෙස ප්‍රකාශයට පත් කරන අතර එම වස්තූන්ගේ ආරක්ෂාව සඳහා ද විවිධ මැදිහත්වීම් සිදු කරනු ලබයි. මෙය ආදර්ශයක් කරමින් බොහෝ රටවල් සංස්කෘතික උරුමය ආරක්ෂාකර ගැනීම සඳහා විවිධ ක්‍රියා මාර්ග යෙදූ බව දැකගන්නට ලැබේ. භූ අභ්‍යන්තරයේ ඇති උරුමය නීතිමය පාලනයට යටත් කිරීම ද මෙහි එක් අවස්ථාවක් වේ. මෙහි වර්ධනීයම අවස්ථාවක් ලෙස මුහුදු පතුලේ, විශාල ගංගා හෝ විල්වල පතුල්වල තැම්පත්ව ඇති පුරාවස්තු ආරක්ෂණයට නීති අණපනත් සකස් කිරීම සඳහන් කළ හැකි වේ.


මෙම පොළෝ අභ්‍යන්තරයේ ඇති පුරාවස්තු පිළිබඳව නැතහොත් උරුමය පිළිබඳ නීතිමය පාලනයට මුලින්ම ලක් කරනුයේ 18 වැනි සියවසේදී ඩෙන්මාර්කය විසිනි. පසුව එංගලන්තය විසින් 1885 දී ද, ඇමරිකාව 1906 දී ද මේ සඳහා මුල් වී කටයුතු කර ඇත. ලෝකය පුරා විවිධ ප්‍රදේශ තුළ මෙවැනි ලෝකයට අනන්‍ය වූ පැරැන්නන් විසින් නිර්මාණය කරන ලද සංස්කෘතික නිර්මාණ විශාල ප්‍රමාණයක් හඳුනා ගත හැකි වේ. කාර්මික විප්ලවයත් සමග දේශ ගවේශකයින් විසින් විවිධ වූ රටවල් සොයා ගත් අතර එම දේශයන් තුළවූ උරුමය වාර්තා ගත කිරීමටත් තම දේශයන් කරා රැගෙන යාමටත් කටයුතු කර ඇත. 1815 දශකයෙන් පසුව ලංකාවේ විශාල පුරාවස්තු ප්‍රමාණයක් එංගලන්තයට ගෙන ගිය බවට සාධක ලැබෙන අතර ඒවා එංගලන්තයේ කෞතුකාගාර තුළ ප්‍රදර්ශනයට තබා ඇති අයුරු දැක ගත හැකි ය.

උරුමය ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදා වෙන් කර එම උරුමය ආරක්ෂා කිරීමට අවශ්‍යය කටයුතු සම්පාදනය කරනු දැක ගත හැකි වේ. එහි පළමු කොටස වන්නේ සංස්කෘතික උරුමය වන අතර දෙවන කොටස වන්නේ ස්වාභාවික උරුමයි. මෙකී කවර උරුම සාධකයක් හෝ ලෝක උරුමයක් වූ පසු සමස්ත ලෝක ප්‍රජාවටම අයත් වන උරුමයක් බවට පත්වේ. මෙහිදී සංස්කෘතික උරුමය සඳහා විශාල නැඹුරුවක් ලෝකය තුළ දැක ගත හැකි වේ. සංස්කෘතික උරුමය නැමති සංකල්පය තුළට ස්මාරක, ගොඩනැගිලි සමූහ හා ක්ෂේත්‍ර යන අංගයන් අයත් වේ. යුනෙස්කෝ සංවිධානය මගින් 1972 වර්ෂයේ නොවැම්බර් දහසය වැනි දින පැරිසියේ දී එළි දක්වා ඇති Convention Concerning The Protection Of The Cultural And Natural Heritage ප්‍රඥාප්තිය මගින් උරුමය පහත ලෙස අර්ථ ගන්වයි.

ස්මාරකයන්ගෙන් ඓතිහාසික කලාත්මක හෝ විද්‍යාත්මකව සලකන විට සමස්ත ප්‍රජාවටම බලපාන කැපී පෙනෙන විශ්වීය අගයක් ඇති වාස්තුවිද්‍යා නිර්මාණ, සුවිශාල කැටයම්, චිත්‍ර, පුරාවිද්‍යාත්මක ව්‍යුහයක් හෝ අංගයක්, ශිලාලේඛන, ගුහා නිවාස සහ එවැනි කටයුතුවල එකතුවක් ලෙස සලකනු ලැබේ.


ඉතිරිය 38 වන පිටුවට

ඩබ්.එම්.සී. සඳරුවන්
සංවර්ධන නිලධාරී,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
(ප්‍රධාන කාර්යාලය),
කොළඹ 07.





ගොඩනැගිලි සමූහ යන්න තුළින් වාස්තුවිද්‍යා නිර්මාණයේ සුවිශාලකම නිසා නිර්මාණයේ ඒකාග්‍රතාවය නිසා හෝ විශේෂිත භූ දර්ශනයක් මත පිහිටීම නිසා ඓතිහාසික, කලාත්මක හෝ විද්‍යාත්මකව සලකන විට සමස්ත ප්‍රජාවටම බලපාන කැපී පෙනෙන විශ්වීය අගයක් ඇති වෙන් වෙන්ව හෝ එකට සම්බන්ධව පවතින ගොඩනැගිලි ලෝක උරුමයක් ලෙස නම් කළ හැකිවේ. සංස්කෘතික උරුමයේ තෙවැනි අංගය වන භූමි/ස්ථානයන්ගෙන් අදහස් වන්නේ ඓතිහාසික, සෞන්දර්යාත්මක, මානව විද්‍යාත්මකව හෝ ජාතියක් පිළිබඳව සැලකීමේදී සමස්ත ප්‍රජාවටම බලපාන කැපී පෙනෙන අගයක් ඇති මිනිසා විසින් නිර්මිත හෝ ස්වභාව ධර්මයෙන් හා මිනිසාගේ ක්‍රියාවල එකතුවක් මගින් හෝ නිර්මිත සහ පුරාවිද්‍යා වටිනාකමක් ඇති ප්‍රදේශයක් වන ස්ථානයන් ද ලෝක උරුම ලෙස නම් කිරීමට හැකියාව පවතී.




මෙම හේතුව නිසාවෙන් උරුමය යන සංකල්පය වර්තමානය වන විට ගෝලීකරණය වූ සංකල්පයක් ලෙස වර්ධනය වී පවතී. ඒ අනුව මෙලෙස ලෝකය තුළ සංස්කෘතික උරුමයන්ගේ ආරක්ෂාව හා කළමනාකරණය සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදුකර ඇත. නඩත්තු කිරීම්, ප්‍රතිසංස්කරණය, සංස්කෘතික උරුම හානි කරන්නන් සඳහා දඬුවම් දීම, පවත්වා ගෙන ඒම සඳහා විවිධ දීමනාවන් හා වරප්‍රසාද පිරිනැමීම ඒ අතර විය. නමුත් වර්තමානය වනවිට සංස්කෘතික උරුමයේ ආරක්ෂණය සඳහා සුදුසුම ක්‍රමවේදය ලෙස ලෝකය තුළ පිළිගනු ලබන්නේ පාර්ශ්වකරුවන්ගේ දායකත්වය ලබා ගැනීමයි. මෑත කාලීනව ලෝකය තුළ විශාල සංවර්ධන ව්‍යාපෘති ඇතිවීමත්, එමගින් සංස්කෘතික උරුමයන්ට විශාල වශයෙන් හානිවීමත් දැකිය හැකිය. 1959 දී ඊජිප්තුවේ නයිල් නදිය හරස් කර ආස්වාන් වේල්ල ඉදිකිරීමත් සමඟ අබුසිම්බල් හා ෆයිලි යන පුරාණ දේවස්ථාන ජලයෙන් යටවීමත් සමඟ ඇතිවන තත්ත්වය පාලනය කිරීම සඳහා පැරණි ස්ථානයෙන් ගලවා ඉවත් කිරීම සිදුකිරීම මේ සඳහා හොඳම නිදර්ශකයක් වේ.

1977 වර්ෂයේ දී ලංකාවට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමඟ ඇති කරන ලද විශාල සංවර්ධන ව්‍යාපෘති මගින් පුරාවිද්‍යා උරුමයට හානිවූ අවස්ථා ද හඳුනාගත හැකි ය. මහවැලි සංවර්ධන ව්‍යාපෘති මගින් කොත්මලේ, රන්දෙණිගල ඇති බෞද්ධ ස්මාරක රාශියක් විනාශයට පත්වීම මීට නිදර්ශක සපයයි.

එබැවින් සංවර්ධන යෝජනා ක්‍රම හෝ ව්‍යාපෘති සැකසිය යුත්තේ සංස්කෘතික අනන්‍යතාවන් ආරක්ෂාකර ගනිමින් සංවර්ධන කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා ය. ඒ සඳහා 1998 සංශෝධිත පුරාවස්තු ආඥාපණත මගින් පුරාවිද්‍යා බලපෑම් තක්සේරු වර්තාවක් ලබා ගැනීම තුළින් සංවර්ධන යෝජනාවලින්ගේ සාර්ථකත්වය ලඟා කර ගත හැකිය. එසේම යම් සංස්කෘතික උරුමයක් ආරක්ෂාකර ගැනීමට නම් නෛතික රෙගුලාසි පමණක්ම ප්‍රමාණවත් නොවේ. උරුමය සමග සම්බන්ධතා පවත්වනු ලබන පාර්ශ්ව කරුවන් එනම්, උරුමයට අයිතියක් හා බැඳීමක් පවතින සියලු දෙනා උරුමය තම රටේ, ජාතියේ හෝ ලෝකයටම අයත් දෙයක් ලෙස සලකා ආරක්ෂා කර ගත යුතු වේ. මෙම සංකල්පය මානව කේන්ද්‍රීය සංකල්පයක් වන අතර විසිඑක්වන සියවසෙන් පසුව සංස්කෘතික උරුමයේ ආරක්ෂාව හා කළමනාකාරිත්වය පහසු කර ගැනීමට යෙදවිය හැකි හොඳම මෙවලම වන්නේ ද මෙම සංකල්පය බව හඳුනාගත හැකි වේ.

## ඓතිහාසික හිඳගල ලෙන් විහාරයට අදාළව ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කෙරේ.




පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මහනුවර ප්‍රදේශීය පුරාවිද්‍යා කාර්යාලයට අනුයුක්තව පුරාවිද්‍යා පර්යේෂණ සහකාර තනතුරෙහි රාජකාරි ඉටුකරනු ලබන පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර මහතා විසින් රචිත ''හිඳගල ලෙන් විහාර පුරාවෘත්තය'' ග්‍රන්ථය ප්‍රකාශයට පත් කර තිබේ.

මෙය කතුවරයාගේ සිව් වන ග්‍රන්ථයයි. මීට පෙර ඔහු අතින් ලියැවුණු ''ඓතිහාසික පිදුරංගල'', ''මහනුවර පැරණි විහාරය'', ''යාපනයේ ඓතිහාසික උරුමය'' යන ග්‍රන්ථ පුරාවිද්‍යාත්මක දෘෂ්ටියකින් රචිත අතර ''හිඳගල ග්‍රන්ථය'' ද එකී දෘෂ්ටියේම පිහිටා සිට රචිත අයුරු පෙනේ.

ඓතිහාසික හිඳගල ලෙන් විහාරය පිළිබඳ උනන්දුවක් දක්වන ශාස්ත්‍රකාමීන්ට විශේෂයෙන් පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ නියැලෙන්නට මෙම ග්‍රන්ථය අත් පොතක් වනු ඇත. පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳව මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් විජේබණ්ඩාරයන් දරණ මෙම ප්‍රයත්නය මහත් සේ අගය කළ යුතුය. ඔහුගේ ආඛ්‍යාන රීතිය නිරවුල්ය. සරලය.

**සංස්කාරක**

# සිංහල සේනාවන් හෙළූ කටුවන බළකොටුව




හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ කටුවන ග්‍රාමයෙහි ඓතිහාසික කටුවන බළකොටුව පිහිටා තිබේ. මාතර සිට හක්මණ හරහා මිද්දෙණිය මාර්ගයේ කි. මී. 52 ක් පමණ පැමිණ වම් අතට වැටුණු අතුරු මාර්ගයෙහි තවත් මී. 500 ක් පමණ ගිය පසු මෙම පුරා විද්‍යා ස්ථානය දැකිය හැකි ය.

ලන්දේසි ජාතිකයන් විසින් ක්‍රි.ව. 1645 දී කටුවන බළකොටුව නිර්මාණය කළ බව පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල හිමියෝ කියති. එහෙත් ශ්‍රී ලංකාවේ ලන්දේසි බළකොටු පිළිබඳ ව අධ්‍යයනයක යෙදෙන ඩබ්. ඒ. නෙල්සන් පවසන්නේ ක්‍රි. ව. 1697 දී මෙම බළකොටුව ඉදිකර වූ බව යි.

ලන්දේසින් විසින් රට අභ්‍යන්තරයේ ඉදිකරනු ලැබූ බළකොටු අතරින් කටුවන බළකොටුව වඩාත් ආරක්ෂිත එකක් විය. දකුණු මුහුදු දේශ සීමාව හා කන්ද උඩරට දේශ සීමාව අතර කලාපයේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහාත් වාණිජ අරමුණු ඉටු කරගැනීම සඳහාත් මෙම බළකොටුව ඉදිකෙරුණු බව එක් මතයකි. ඒ නෙල්සන් පවසන්නේ ලන්දේසීන්ගේ අනෙක් බළකොටුවලට සාපේක්ෂ ව කටුවන බළකොටුවේ ගබඩා පහසුකම් සීමිත හෙයින් වාණිජ අරමුණුවලට වඩා යුදමය අරමුණු පෙරදැරි කරගෙන මෙය ඉදිකර ඇති බව යි.

පැරණි බලකොටුව කපරාදු කළ බිත්ති සහිත සමචතුරස්‍රාකාර ප්‍රතිමුඛ දෙකොනක වූ මුර පොළවල් දෙකකින් සමන්විත ඉදිකිරීමකි. වත්මන් බළ කොටුව අඩි 150x150 ක ප්‍රමාණයකින් යුක්ත ය. ප්‍රාකාරයෙහි උස අඩි 16කි. පැරණි ලන්දේසි බලකොටුවෙහි ස්වරූපය හඳුනා ගැනීමට වොල්ප් ගන් හයිට්ගේ වාර්තාව අතිශයින්ම වැදගත් ය.

ලන්දේසීන් නිසා රට තුළ ඇති වූ අර්බුද සමනය කිරීම ලක්දිව රජුගේ ප්‍රධානතම වගකීම විය. මෙකල රාජ්‍ය විචාළේ කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි. ව. 1742 - 1782) රජතුමා ය. උද්ගත වී ඇති තත්ත්වය විසඳීම සඳහා කටුවන බළකොටුවට පහර දී විනාශ කිරීම අත්‍යවශ්‍ය විය.

මේ සටන පිළිබඳ ව රාජසිංහ රජතුමාගේ කාලයේ දී (ක්‍රි. ව. 1788) ලියැවුණ කැටකිරිළි සන්දේශයේ මෙසේ දැක්වේ.

**කටුවන දිගත ලක පසිඳු රිවි කු ල**
**දෙටුවන සෙවන මහසෙන් මැතිඳු යුද ක ල**
**කටුවන කොටු තුඹස සිටි දිටු නයින් බ ල**
**බොටු ගෙන කපා දැමූ බව තරඹ නොපැකි ල**

කටුවන බලකොටුව නමැති තුඹස තුළ වැදී සිටියා වූ මිථ්‍යා දෘෂ්ටික විදේශික නාගයන්ගේ බෙලි සිංහල යුද්ධ හමුදාව විසින් කපා දැමූ බව මේ කවියෙන් කියැ වේ.

පසු කාලයේ විවිධ විද්වත්හු මෙම බළකොටුව නිරීක්ෂණය කර සටහන් තැබූහ. ආර්. ඇල් බ්‍රෝහියර්, එස්. පී. ජෝසප්, ට්. රයිමර්ස්, ඩබ්. ඒ. නෙල්සන්, පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල හිමි, මහාචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි ආදීහු ඒ අතරින් ප්‍රමුඛයෝ වන්නාහ.


වර්ෂ 2007 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙහි කැණීම් කටයුතු ආරම්භ කරන ලදී. එහිදී විශේෂිත පුරාවස්තු රැසක් සොයා ගැනුණි. විවිධ ප්‍රමාණයේ යකඩ ඇණ, පිත්තල කොකු, පතරොම් කොපු කැබලි ඒ අතර ප්‍රමුඛ වෙයි. කොටුව වූ කලී ලන්දේසින් සතු ව පැවති වාස්තු විද්‍යා ඥානය පිළිබිඹු කරවන අනගි කැඩපතකි. කොටු බැම්ම, දොරටුව, කාණු පද්ධතිය, පිය ගැට පෙළ, සක්ක ගල් බැම්ම, ළිඳ, වේදිකාවක් බඳු ඉදිකිරීම් දෙක හා කුඩුම්බිගල ගල් ඇතුරුම එය සනාථ කරවයි.

2004-03-17 දිනැති අංක 1344 ගැසට් පත්‍රය මඟින් කටුවන බළකොටුව පුරා විද්‍යා ස්ථානයක් ලෙස නම් කර තිබේ.

**රජිත් නාමසිංහ,**
සංවර්ධන නිලධාරී,
ප්‍රදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
හම්බන්තොට







## මුල්කිරිගල රජමහා විහාරයේ බිතුසිතුවමකි

වෙස්සන්තර රජු විසින් මඟුල් ඇතු දන්දීම මෙහි නිරූපිතය. මුල්කිරිගල විහාර සිතුවම් මහනුවර සම්ප්‍රදායට අයත්ය. මෙහි විශේෂතාව වනුයේ, ඇතු ඉදිරියට හැරී ගමන් කරන ආකාරයට සිතුවමට නගා තිබීමයි. බොහෝ සිතුවම් වල දක්නට ලැබෙන්නේ ඇතා එක් පැත්තකට හැරී සිටින ඒවාය.

*සිතුවමට නගා අප වෙත සැපයුවේ,*
**තිත්තගල්ල දොඹගොඩ ම.වි. ශාස්ත්‍රාචාර්ය කේ.ඩී. කමල්ප්‍රිය මහතා විසිනි.**


**උපදේශකත්වය හා අධීක්ෂණය**
මහාචාර්ය පී.බී. මණ්ඩාවල - පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

**සංස්කාරක**
සුනිල් බණ්ඩාර කෝරළගේ

**විශේෂ සහාය**
දීපාල් විජේතිලක - වැඩ බලන අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)
රසික දිසානායක - වැඩ බලන සහකාර අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)

**කාටූන් නිර්මාණය**
සමන් කළුබෝවිල


**පාඨක ඔබේ අදහස් යෝජනා හා ලිපි ලේඛන**

සංස්කාරක,
"දායාද" පුවත් අටුවාව,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.
යන ලිපිනයට යොමු කරන්න.
දුරකථන අංකය: 0112-688326
0112-692840 දිගුව 301

### පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දුරකථන නාමාවලිය

| | |
|---|---|
| පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | - 011-2695255 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) | - 011-2683470 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශාස්ත්‍රීය) | - 011-2693216 |
| ගණකාධිකාරී | - 011-2667154 |
| සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | - 011-2676449 |
| පරිපාලන නිලධාරී | - 011-2691985 |
| අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | - 011-2693216 |
| අධ්‍යක්ෂ (පොදු සේවා අංශය) | - 011-2688326 |
| සහකාර අධ්‍යක්ෂ (රසායන අංශය) | - 011-2691960 |
| සහකාර අධ්‍යක්ෂ (කෞතුකාගාරය) | - 011-2696808 |

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ (අභිලේඛන) | - 011-2695609 |
| සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ) | - 011-2696514 |
| අධ්‍යක්ෂ (නඩත්තු) | - 011-2692844 |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | - 011-2692842 |
| පුරාවස්තු විනාශය වැළැක්වීමේ විශේෂ ඒකකය | - 011-7222333 |
| පොලිස් විශේෂ ඒකකය | - 011-2694727 |
| | - 011-2692840 |
| | - දිගුව : 509/510 |
| නීති අංශය | - 011-2692843 |
| පොදු දුරකථනය | - 011-2692840-41 |

වෙබ් අඩවිය: www.archaeology.gov.lk


පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2019 ජූලි මස පාදුක්ක, පානළුව, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ දී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ල